# පාසල් විශිෂ්ට ව්‍යවහාර සඳහා ප්‍රවේශයක් 2



කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව

## අධ්‍යාපන අමාත්‍යාංශය

# හැඳින්වීම

යම් ක්‍රියාවලියක හෝ සංවිධානයක පවත්නා තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රම ශිල්ප හෝ උපායමාර්ග භාවිත කරනු ලබයි. එම උපායමාර්ගවල සාර්ථකත්වය මත ක්‍රියාවලියේ හෝ සංවිධානයේ ධනාත්මක වෙනසක් සිදු වේ නම් එහි ප්‍රජාව එම උපායමාර්ගයට අනුගත ව කටයුතු කිරීමට පෙළඹේ. මෙසේ උපායමාර්ගික ලෙස එකම අරමුණක් වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සංවිධානයේ ප්‍රජාවගේ චර්යාත්මක සංවර්ධනයක් සිදුකිරීමට සමත් ව්‍යවහාර විශිෂ්ට ව්‍යවහාර ලෙස අර්ථ දැක්විය හැකිය.

ආයතනයක් සතුව ඇති සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායී ව උපයෝගී කර ගනිමින් එම ආයතනයට ගැලපෙන අයුරින් නිර්මාණශීලී ලෙස ක්‍රියාත්මක කෙරෙන ඉලක්කගත උපායමාර්ග හෝ ක්‍රියාකාරකම් සමූහයක් ද විශිෂ්ට ව්‍යවහාර ලෙස හැඳින්විය හැකිය.

විශිෂ්ට ව්‍යවහාර සෑම විට ම සංවිධානයක පවතින ගැටලු විසඳා ගැනීම හෝ එහි ක්‍රියාවලිය සංවර්ධනය කිරීම යන අවශ්‍යතා ඉටු කිරීමට එහි ප්‍රජාවට සහය වේ.

ආයතනයක් හෝ සංවිධානයක් ලෙස සැළකීමේ දී පාසලක අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශිෂ්ට ව්‍යවහාර රාශියක් ක්‍රියාත්මක කළ හැකිය.

පාසලක ක්‍රියාත්මක විශිෂ්ට ව්‍යවහාරයක තිබිය යුතු අනිවාර්ය ලක්ෂණ කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- විශ්වසනීයත්වය
- පිළිගැනීමට ලක්වීම
- නිර්මාණශීලී බව
- පිළිගත් අධ්‍යාපන ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූල වීම
- පවත්වා ගැනීමේ / ක්‍රියාත්මක කිරීමේ පහසු බව
- තිරසාර බව
- ආදර්ශවත් බව
- පාසල තුළ යහපත් සංස්කෘතියක් ගොඩනැගීමට දායක වීම
- මැනිය හැකි බව (ගුණාත්මක ලෙස)

විශිෂ්ට ව්‍යවහාරයක් ලෙස යම් ක්‍රියාකාරකමක් හඳුන්වා දීමට පෙර එය පාසලෙහි අවශ්‍යතාවයට කොතරම් දුරට ගැලපේද, එම ව්‍යවහාරය පිළිගත් අධ්‍යාපන ප්‍රතිපත්තින්ට හා දර්ශනයන්ට පටහැනි නොවේද, එය ප්‍රායෝගික ව පාසල තුළ ක්‍රියාවට නැංවිය හැකි ව්‍යවහාරයක්ද යන කරුණු පිළිබඳ ව සළකා බැලිය යුතු වේ. පාසලේ මානව හා භෞතික සම්පත්වලට, පරිසරයට, ප්‍රජාවගේ තත්ත්වයට එම ව්‍යවහාරය අනුකූල වේද යන්න පිළිබඳව ද සළකා බැලිය යුතු වේ.

හඳුනාගත් ව්‍යවහාරය ක්‍රියාවට නැංවීමට පෙර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ කණ්ඩායමට අවබෝධයක් ලැබී තිබීමත්, පාසල් ප්‍රජාව නව ව්‍යවහාරය පිළිබඳ දැනුවත් වීමත් අත්‍යාවශ්‍ය ය. එමෙන් ම පාසල් ප්‍රජාවගේ කැපවීම, වෙනසට ඇති කැමැත්ත, එකම අරමුණක පිහිටා කටයුතු කිරීමේ හැකියාව, කණ්ඩායම් හැඟීම, පුද්ගල චර්යාවන් ධනාත්මක ලෙස වෙනස් කර ගැනීම, මනා සන්නිවේදනය යන කරුණු පාසලක විශිෂ්ට ව්‍යවහාර පවත්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වේ.

විශිෂ්ට ව්‍යවහාරය පිළිබඳ අඩු අවබෝධය, ව්‍යවහාරයට අනුකූල ව වෙනස්වීම සඳහා අවශ්‍ය උපස්ථම්භන මද බව, ව්‍යවහාරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම්, කුසලතා අඩු වීම, යන කරුණු මත විශිෂ්ට ව්‍යවහාරය ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු මතු විය හැකිය. එබැවින් පාසල තුළ නිර්මාණශීලී උපායමාර්ග විශිෂ්ට ව්‍යවහාර ලෙස සංවර්ධනය කිරීමේ දී පාසල් නායකයින් එවැනි මතු විය හැකි තත්ත්වයන් පිළිබඳ දැඩි අවධානයෙන් හා උපක්‍රමශීලී ආකාරයෙන් කටයුතු කළ යුතු වේ.

2015 සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් අධ්‍යාපන ගුණාත්මක බව උදෙසා හඳුන්වා දෙන ලද නව ඇගයීම් ක්‍රියාවලිය තුළ අවධාරණය කෙරෙන්නේ පාසල පවත්වා ගැනීමේ දී ඇති වන ගැටලු පාසල් මට්ටමින් විසඳා ගැනීම සඳහා නිර්මාණශීලී උපාය මාර්ග විශිෂ්ට ව්‍යවහාර ලෙස සංවර්ධනය කර පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව යි. එමෙන් ම පාසල් භාවිත කරන එවැනි විශිෂ්ට ව්‍යවහාර ඇත්නම් ඒවා පාසල් බාහිර ඇගයීම්කරුවන් විසින් හඳුනා ගෙන කලාප, කොට්ඨාස වශයෙන් පාසල් අතර ප්‍රචලිත කිරීමටත් එමඟින් උපදෙස් ලබා දී ඇත.

පාසල්වල පවත්නා විශිෂ්ට ව්‍යවහාර හඳුනා ගෙන එම ව්‍යවහාර ඇගයීමට ලක් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී. ඒ අනුව 2014 හා 2015 වර්ෂයන්හි දී දිවයිනේ පාසල්වලින් ඉදිරිපත් කරන ලද ව්‍යවහාර අතුරින් තෝරාගත් විශිෂ්ට ව්‍යවහාර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සම්මාන පිරිනැමීමට කටයුතු කරන ලදී. එමෙන් ම එවැනි විශිෂ්ට ව්‍යවහාර පිළිබඳ ව දිවයිනේ සියලු පාසල් දැනුවත් කිරීම සඳහා ද කටයුතු කරමින් 2014 වසරේ දී පාසල්වල ක්‍රියාත්මක වූ යහපත් ව්‍යවහාර අලලා 'පාසල් විශිෂ්ට ව්‍යවහාර සඳහා ප්‍රවේශයක්' ප්‍රකාශනය 2015 වසරේ දී එළි දැක්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාවට හැකි විය. එම ප්‍රකාශනයට සමගාමී ව පාසල් කිහිපයක විශිෂ්ට ව්‍යවහාර ඇතුළත් කරමින් සකස් කරන ලද වීඩියෝ වැඩසටහනක් ද සංයුක්ත තැටියක් ලෙසින් සෑම පාසලක් වෙත ම ලබා දීමට කටයුතු කෙරිණි.

2015 හා 2016 වර්ෂයන්හි දී පාසල්වල ක්‍රියාත්මක වූ විශිෂ්ට ව්‍යවහාරයන් හඳුනා ගනිමින් එම ක්‍රියාකාරකම් ආදර්ශයන් ලෙස ඉදිරිපත් කිරීම සඳහා මෙම 'පාසල් විශිෂ්ට ව්‍යවහාර සඳහා ප්‍රවේශයක් 2' ප්‍රකාශනය පාසල් පද්ධතිය වෙත මෙසේ ඉදිරිපත් කෙරේ. මෙම පොත සෑම විදුහල්පතිවරයෙක් ම පරිශීලනය කිරීම හා මෙය පාසල්වල ගුරුවරුන්ට කියැවීමට සැලැස්වීම තුළින් පාසල්වල සංවර්ධන උපායමාර්ග සඳහා නිර්මාණශීලී ප්‍රවේශයක් හා පුළුල් වූ චින්තනයක් වෙත එළැඹීමට අවස්ථාව සැලසීම මෙහි ප්‍රධාන අපේක්ෂාව යි.

# පටුන

මාතෘකාව


1. කාසි සොයමු ඉතිරි කරමු
2. දිදුලන ගුරු තරු
3. දත් රැකගන්න පාසල් එන්න
4. නායකත්වයට පෙර මං
5. හැඩතල උයනෙන් හැඩ වූ පාසල
6. පෙත්තෙන් පොත්තට
7. පෝෂණීය පාඩම
8. කී දේ අමතකයි, දුටු දේ වඩා මතකයි
9. පංති වැඩ සැලැස්ම
10. පාසලට බලය දෙන බල ශක්ති සංගමය
11. ගමෙත් නගරයෙත් සරු එළ
12. විස්කම් දනවන පුස්තකාලය
13. අපේ පංතිය හොඳම පංතිය
14. මේ පාසල් ගුවන් විදුලි සේවය යි
15. රෝහලට උදව්වක්
16. හැකියාවට පැයක්
17. ඉපැයූ තිළිණ
18. සැඟවුණු දක්ෂයා තේරීම
19. විශ්ව දැනුම කරත්තය
20. පාසලේ උපන් වන සතුන්
21. යහ පුරුදු දින 365
22. විශ්වයට ගමනක්
23. නිකසල විදුබිම
24. පාසල හරහා මහ පාරක්

මාතෘකාව


25. විද්‍යාගාරයේ විප්ලවය

26. තේ වත්තක රැස්වීමක්

27. ජීව කොටුවයි - වගා බිමයි

28. සන්නිවේදනයේ පුනර්ජීවය පාසලට

29. ගණිත විනෝදය

30. මවුපියන්ට දානයක්

31. පාසල් දිනපොත

32. ගුරුවරයාගේ ප්‍රතිබිම්බය

32. අපේ පාසල් සිතියම

34. හෙළ බත

35. පරණ බඩු අලුත් වීම

36. වැඩියෙන් සිතන්න තැගි දිනන්න

37. මතින් සිසුන් ගලවා ගනිමු

38. සෑම සිසුවෙකුට ම ලිපි ගොනුවක්

39. CCTV

40. අලුත් පිබිදීමක්


(මෙහි එන නම්, ගම් සියල්ල මනඃකල්පිත ය.)

***අප්‍රමාණ කටුක අත්දැකීම් විඳ දේශයේ අධ්‍යාපන අරමුණු වෙනුවෙන් කැප වෙමින්, පාසල් දූ දරුවන්ගේ දෑස් පාදන්නට වෙර දරන, පාසල බලගැන්වීම සඳහා නිර්මාණාත්මක හා ඵලදායී උපායමාර්ග භාවිත කරන විදුහල්පතිවරුන්, පාසල් නායකයින් හා ගුරුභවතුන් හට මේ පොත ගෞරවයෙන් පිළිගන්වමු.***

# 1. කාසි සොයමු ඉතිරි කරමු

එදිනෙදා ජීවනෝපාය සරු කරගන්නා දෙමාපියන්ගේ දරුවන්ගෙන් සමන්විත අප පාසල නගරයට තරමක් සමීප එහෙත් ජනප්‍රිය නොවූ ප්‍රියමනාප නොවන පාසල් ගණයට අයත් වූවකි. සිසුන් ජීවත් වන පරිසරය ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට සහයක් නොවූ අතර බොහෝ දෙනෙක් පාසල් කාලයෙන් පසු දෙමවුපියන් කරන රැකියාවට සම්බන්ධ වූහ. අධ්‍යයන කටයුතුවල දී දක්ෂතා පෙන්වීමට අපොහොසත් වන, පාසල් අවධිය අවසන් කරන සිසුන්ට ස්වයං රැකියාවක් හෝ ආරම්භ කිරීමට සෑහෙන මුදලක් සොයා ගැනීමට නොහැකි වීම සාමාන්‍ය තත්ත්වයකි. ඒ නිසා ඔවුන් රැකියා විරහිතයින් බවට පත් වීම පාසලෙහි අනාගතයට මෙන් ම පාසල අවට ප්‍රජාවට ද අහිතකර අන්දමින් බලපාන ගැටලුවක් වී ඇත.

දරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීම හා අනාගතය සම්බන්ධ ඉහළ ජීවන අපේක්ෂා ඇති කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ඉතා අවශ්‍ය කාර්යයක් බව මට වැටහුනේ එම ජනතාව විඳින අපමණ දුක් ගැහැට මා හට නිරතුරු ව අසන්නට දකින්නට ලැබෙන බැවිනි. එමෙන් ම විදුහල්පතිවරයෙකු වශයෙන් මාගෙන් සමාජය අපේක්ෂා කරන වගකීම ද ඉටු විය යුතු බව මා දැඩි ව විශ්වාස කළ බැවිනි.

සෑම සිසුවෙකුට ම පාසල හැර යන විට යම් ස්වයං රැකියාවක් ඇරඹීමට හෝ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් බැංකු ගිණුමක ඉතිරි කිරීම සඳහා ඔවුන්ට අවස්ථා සලසා දීම මාගේ අරමුණ විය. ක්ෂුද්‍ර ආර්ථික න්‍යායට අනුව පාසල තුළ ම ධන උත්පාදන ක්‍රමයක් ස්ථාපනය කර එමඟින් අභ්‍යන්තර ප්‍රජාව හට බෙදී යන ලාභය නැවත ආයෝජනය කිරීමේ ක්‍රමවේදය වඩාත් සුදුසු වන බව මා වටහා ගතිමි.

ඒ අනුව ස්වයං නිෂ්පාදන අලෙවිය හා භාණ්ඩ වෙළඳ ගනුදෙනු ක්‍රමයක් වාරයකට වරක් පැවැත්වීම සඳහා මා විසින් සකස් කර ගත් ව්‍යාපෘති යෝජනාව පාසලේ කළමනාකරණ කණ්ඩායමේ හා ගුරු මණ්ඩලයේ විමසුමට ඉදිරිපත් කළෙමි. මාගේ යෝජනාවට කවුරුත් එකඟ වූ අතර ඊට දෙමවුපියන් ඇතුළු ප්‍රජාවේ සහාය ද ලබා ගැනීම පිළිබඳ වැදගත් අදහස් මතු විය. දෙමවුපියන් ද කැඳවා සිසුන්ගේ අනාගතය උදෙසා ඉතුරුම් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කොට ඒ පිළිබඳ කතිකාවක් ඇති කළෙමි. දෙමවුපියන් තුළින් මතු ව ආවේ මා විසින් සකස් කළ යෝජනාවට සමාන අදහසකි.

ඒ අනුව පාසලේ නව ව්‍යාපෘතිය පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරන්නට අපට හැකි විය.

- පාසල් භූමිය සතු අක්කර 3ක පමණ කොටසක් එළි-පෙහෙළි කොට බිම් සැකසීම
- ගෙවතු වගාව ආරම්භ කිරීම හා සිසුන් ඒ සඳහා යොමු කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා හා කාලය ලබා දීමට කටයුතු කිරීම
- ගෙවතු වගාවෙන් ලබන අස්වැන්න විකුණා පාසලට ආදායමක් ලබා ගැනීම සඳහා පාසල තුළ වෙළඳ පොළක් සකස් කිරීම
- මෙම වෙළඳ සල්පිල පැවැත්වීම පිළිබඳ සැලසුම් හා කාලසටහන් සකස් කිරීම
- සිසුන්ගේ නිවෙස්වලින් රැගෙන එන එළවළු, පලතුරු, විවිධ ආහාර පාන වර්ග, අත්කම් භාණ්ඩ ආදිය විකිණීම සඳහා එම වෙළඳ පොල තුළ අවස්ථාව සළසා දීම
- සෑම සිසුවෙකු වෙනුවෙන් ම බැංකු ගිණුමක් ආරම්භ කර පාසල් සල්පිලෙහි ලාභය එහි තැම්පත් කිරීමට කටයුතු කිරීම
- ගෙවත්තෙන් ලබා ගන්නා බෝග විකිණීමෙන් ලබන ආදායම හා මේ සඳහා ලැබෙන පරිත්‍යාග විනිවිද අයුරින් සිසු ගිණුම්වල තැම්පත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම

මේ හරහා වෙළඳපොළක ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සිසුන්ට අවබෝධ කරවීම, ගෙවතු වගාව සඳහා සිසුන් යොමු කරවීම වැනි කටයුතු සඳහා නිපුණතා සංවර්ධනය මෙන් ම මූලික ගණිත සංකල්ප, භාෂා හැකියා සංවර්ධනය දරුවන් තුළ ඇති කරලීම හා පාසල් භූමිය ඵලදායී ව භාවිතය මෙම ව්‍යාපෘතියෙන් සාක්ෂාත් කර ගත් අමතර වාසි ලෙස හැඳින්විය හැකි ය.

පාසලේ ගුණාත්මක අධ්‍යාපනය සඳහා අත්‍යාවශ්‍ය පහසුකම් හා උපකරණ සපයා ගැනීමට ද මෙමගින් ලැබෙන්නේ මහත් අත්වැලකි.

සිසුන්ගේ බැංකු ගිණුම් තුළ එකතු වන මුදල් සඳහා පොලී හිමි වීම පිළිබඳ දැනුවත් කිරීමෙන් ඉතුරුම් පිළිබඳ දෙමවුපිය ආකල්ප ඉහළ දැමීමට හැකි වුණි. එය පාසල් ප්‍රජාව සංවර්ධනය උදෙසා සිදු කළ විශාල මැදිහත් වීමක ප්‍රතිඵලයකි. මෙය බොහෝ දෙමවුපියන් මූල්‍ය ඉතුරුම් තරකර ගැනීමට පොලඹවන හේතු සාධකයක් වී හමාර ය.




***2*** වර්ගයේ පාසලක් වන අපගේ පාසලෙන් 11 ශ්‍රේණියෙන් පසු නික්ම යන දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා හෝ වෙනයම් වෘත්තීය පුහුණුවක් සඳහා වියදම් කිරීමට හෝ අඩුම තරමින් ස්වයං රැකියාවක් හෝ ව්‍යාපාරයක් වෙනුවෙන් ආයෝජනය සඳහා මෙම ඉතුරුම් මුදල බෙහෙවින් ඉවහල් කර ගත හැකිය. සෑම සිසුවෙකු ම 11 ශ්‍රේණියේ අධ්‍යාපනය අවසන් කරන විට අවම වශයෙන් රු.50,000ක මුදලක් සහිත ඉතුරුම් ගිණුමකට හිමිකම් කියන බව විදුහල්පති ලෙස මා හට විශ්වාසයෙන් කිව හැකි ය.

(අනුරාධපුර අධ්‍යාපන කලාපයේ මහමාන්කඩවල විද්‍යාලය, කැකිරාව කලාපයේ අලුත්ගන්තිරියාගම විද්‍යාලය සහ ගම්පහ කලාපයේ වැලිකඩමුල්ල විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාර ඇසුරෙනි)

# 2. දිදුලන ගුරු තරු

දවසක් උදේ 7.30 පහුවෙලා දුවගෙන දුවගෙන ඇවිත් කාර්යාලයට ඇතුළු වෙද්දී ඉනෝකා ගුරුතුමියගේ දෙසවන් යොමු වුණේ විදුහල්පතිතුමිය හා ගුරු නිවාඩු භාර සංවර්ධන සහකාර මංජුලා මෙනවිය අතර ඇති වූ කතා බහකට.

"අනේ මන්දා සර් ගුරු අත්සන් පොතේ වැඩියෙන් ම තියෙන්නේ රතු පාටින් ලියැවුණු නම්, හැමදා ම පැමිණීමට වඩා නොපැමිණි ගුරුවරු ගණන වැඩියි"

"මමත් මේ කල්පනා කරන්නෙ ඒක ම තමයි. ගුරුවරුන්ගේ නිවාඩු අඩු කර ගන්න හොඳ ක්‍රමයක් හදා ගන්න ඕනෑ ."

විදුහල්පතිතුමිය, මංජුලා මෙනවියට දෙන පිළිතුර ඉනෝකා ගුරුතුමියට ඇහුණා. පෙරවරු 7.30ට ගැහුව රතු ඉරට යටින් සිය අත්සන යෙදූ ඉනෝකා ගුරුතුමිය විවේකාගාරයට ගියේ තරමක සිත් වේදනාවකින්. 'මා අතිනුත් වුණේ වැරැද්දක්. මීට පස්සේ කවදාවත් මම ප්‍රමාද වෙලා එන්නෙ නෑ. නිවාඩු ගන්න එකත් අඩු කර ගන්න ඕනෙ. අපි ළඟට සිප් සතර හොයා එන පුංචි දරුවන්ගේ කාලය අපතේ යවන එක හොඳ දෙයක් නෙවෙයි'. ඉනෝකා ගුරුතුමිය මුලින් ම තමන්ගේ වැරැද්ද හදා ගන්න තරයේ ම හිතට ගත්තා. 'පාසලේ හැම ගුරුවරියක් ම දිනපතා පාසල් ගෙන්වා ගන්න ක්‍රමයක් හදන්න ඕනෑ' යනුවෙන් සිතා ඇය නව ව්‍යාපෘතියක් ගැන කල්පනා කළා.

හැමදාම හවසට හවසට ගුරු පැමිණීමේ ලේඛනය නිරීක්ෂණය කරමින් මොන මොනවදෝ පොතක සටහන් කර ගන්න හැටි දවස් ගාණක් තිස්සේ බලාගෙන හිටිය මංජුලා මෙනවිය ඉනෝකා ගුරුතුමියගෙන් ඒ ගැන ඇහුවා.

"තව ටික දවසකින් බලන්නකො මංජුලා ඔයාටත් පුදුම හිතෙයි" ඉනෝකා ගුරුතුමිය උත්තර දුන්නෙ එහෙමයි.

ඊළඟ මාසයේ මුල් ම සතියේ උදෑසන ප්‍රධාන රැස්වීම වෙනදාට වඩා මොකක්දෝ විශේෂත්වයක් තියෙනවා කියලා ගුරු සිසු හැමෝට ම දැනුණේ පදක්කම් වැනි යමක් මේසයක් උඩ තියලා තිබුණ නිසා යි. ආගමික වතාවත්වලින් පස්සේ වේදිකාවට ආවේ ඉනෝකා ගුරුතුමිය යි. ඇය විදුහල්පතිතුමියටත් වේදිකාවට ආරාධනා කළා. කාලයක් තිස්සේ පාසලේ තිබුණ ගැටලුවකට පිළිතුරක් විදියට ඇය ආරම්භ කළ ව්‍යාපෘතියේ ස්වභාවය පැහැදිලි කළ ඉනෝකා ගුරුවරිය පෙර මාසය තුළ පාසලට දිනපතා ම, උදයෙන් ම පැමිණි ගුරුභවතුන් පස් දෙනෙකුගේ නම් නිවේදනය කර ඔවුන්ට විදුහල්පතිතුමිය අතින් තරු පැළැන්දුවා රතු, කොළ, නිල්, කහ සහ දම් යන පාටවලින් යුතු ඒ තරු මැද පිළිවෙළින් 1, 2, 3, 4 සහ 5 සටහන් කර තිබුණා. රැස්වීමේ හිටිය ගුරුවරු හැමෝම පුදුමයෙන් හා සතුටින් ඒ දෙස බලා සිටියා. විදුහල්පතිනිය ඉනෝකා මිස්ගේ ව්‍යාපෘතිය අගය කළා. සෑම මාසයක ම මේ ඇගයීම ගුරුවරුන්ට දෙන්නට විදුහල්පතිනිය කැමති වුණා.

ව්‍යාපෘතියේ වටිනා ම අංගය හැමෝම දැක්කේ හවස පිටවීම අත්සන් කරන්න කාර්යාලයට ආ වෙලාවේ අත්සන් ලේඛනය තබන මේසයට ඉහළින් හොඳම පැමිණීමට ත්‍යාග ලැබූ ගුරුතුමිය ඡායාරූපයක හිනා වෙවී ඉන්නවා. ඊට යටින් **'මේ මාසයේ සුවිශේෂී ගුරුතරුව මමයි'** යනුවෙන් සටහන් වෙලා තිබුණා. ඒ දවස ඒ විදියට නිමා වුණත් එය පාසලේ හැරවුම් ලක්ෂ්‍යයක් වේවි කියලා කවුරුත් හිතුවේ නෑ. සියලු ගුරුභවතුන් උදේ 7.30ට කලින් පාසලට ආවා. අත්‍යවශ්‍ය ම දේකට හැර අමතර ව නිවාඩුවක් ගැනීම ගැන හැමෝම දෙතුන් පාරක් හිතුවා

(හෝමාගම කලාපයේ වැතර කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රියාත්මක විශිෂ්ට ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 3. දත් රැකගන්න පාසල් එන්න

"දරුවන්ගේ දන්ත සෞඛ්‍යය ගැන අපේ විශේෂ අවධානය යොමු විය යුතුයි. විශේෂයෙන් ම මේ වගේ ප්‍රදේශයක වෙසෙන ජනතාව දන්ත සෞඛ්‍ය සම්බන්ධ ගැටලු රාශියකින් පීඩා විඳිනවා. දරුවන්ට මේ සම්බන්ධ ව කියා දෙන්න දෙමාපියන්ට දැනුමක් නෑ. ඉතින්, සිසුන්ගේ දත් ටික ලස්සනට තියාගන්න ගුරුවරු විදියට අපිට ලොකු කාර්යයක් කරන්න තියෙනවා"

ප්‍රාථමික පාසලක ගුරු රැස්වීමේ දී සිසුන්ගේ සෞඛ්‍යය හා හොඳ පුරුදු පිළිබඳ ව පවතින ගැටලු අරබයා විදුහල්පතිවරයා අදහස් දැක්වීම කළේ එලෙස ය.

සිසුන් බොහෝ අවස්ථාවල දී දත් කැක්කුමෙන් පීඩා විඳින බව දන්නා ආචාර්ය මණ්ඩලය එම අදහස  අනුමත කළේ දත් රෝග දරුවන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ද බාධාවක් වී ඇති බැවිනි. එහෙයින් ආචාර්ය මණ්ඩලය සමඟ දරුවන්ගේ දන්ත සෞඛ්‍ය යහපත් තත්ත්වයට පත්කර ගැනීමට කතිකාවතක් ගොඩනැගීමට විදුහල්පතිතුමා කල්පනා කරන්නට විය.

මෙම සාකච්ඡාවේ දී එක් ගුරුවරියක පැවසුවේ දරුවන් ළඟට ගෙන, පොත් බැලීමේ දී බහුතර දරුවන්ගේ මුඛය දුර්ගන්ධයෙන් යුක්ත වීම තම අත්දැකීම බව යි. එමෙන් ම ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනාගේ ද අදහස් තුළින් විදුහල්පතිතුමා හට වැටහී ගියේ බහුතර දරුවන් පිරිසක් දත් නොමදින බව යි.

දුගී දුප්පත්කමින් පමණක් නොව නිසි අධ්‍යාපනයක් නොලද අසරණභාවයකින් ද යුතු ප්‍රදේශයේ දෙමවුපියන්ගේ දරුවන් මෙම ගැටලුවෙන් මුදවා ගන්නට ඉක්මනින් දන්ත සෞඛ්‍ය වැඩසටහනක් පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව විදුහල්පතිතුමා හට දැඩි ව දැනෙන්නට විය. පසු දින ම ප්‍රාදේශීය දන්ත චිකිත්සකවරිය හමු වූ විදුහල්පතිතුමා විසින් දන්ත සෞඛ්‍ය සම්බන්ධයෙන් පාසලේ සිසුන් පමණක් නොව දෙමාපියන් ද දැනුවත් කිරීමට වැඩසටහනක් සැලසුම් කරන ලදී. ඒ අනුව වෙන්කර ගත් දිනයක වැඩසටහන ක්‍රියාවට නැංවිණ.

දෙමාපියන්, දරුවන් මෙන් ම ආචාර්ය මණ්ඩලය ද සහභාගි වූ මෙම වැඩසටහන තුළ නිවැරදි ව දත් මැදිම කළ යුතු ආකාරයත්, දත් මැදීමේ දී සැලකිය යුතු කරුණු හා දත් මැදිම සිදු කළ යුතු අවස්ථා පිළිබඳවත් පැහැදිලි කර දීම සිදු විය. මීට අමතර ව දත්වල මැලියම් විශේෂ ලුණු වතුර මඟින් ඉවත් වන බව දන්ත චිකිත්සකවරිය පැහැදිලි කර දුන්නා ය.

දැනුවත් කිරීම අවසානයේ එකඟතාවකට පැමිණියේ පාසල තුළ දිනපතා ම සිසුන්ට දත් මැදීම සඳහා අවස්ථාව සලසා දීම සුදුසු බවට යි. ඒ අනුව සතියේ මුල් දින හතර තුළ උදෑසන ආහාරයෙන් පසුව දත් මැදීම සිදු කළ යුතු බවත් සිකුරාදා දිනයේ කොළ කැඳ පානයෙන් අනතුරුව ලුණු වතුරෙන් කට සේදීම කළ යුතු බවටත් තීරණය කෙරිණි.

එම තීරණය ක්‍රියාත්මක වීමත් සමඟ ම පන්ති කාමර තුළ ඉගෙනුම් උපකරණවලට අමතර ව අපූරු භාණ්ඩ කට්ටලයක් ද එකතු විය. එම භාණ්ඩ කට්ටලය දත්බුරුසු, දන්තාලේප, දත් කුඩු, කෝප්ප හා ලුණු කැට බෝතලයකින් සමන්විත විය.

දිනපතා මිනිත්තු 10ක කාලයක් දත් මැදීම සඳහා වෙන් කිරීමට පියවර ගැනුණි. දින, සති, මාස ගෙවී යද්දී දරුවන් තුළ දත් මැදීමට තිබූ අරුචිය නික්ම ගිය අතර මුඛ සෞඛ්‍ය හොඳ මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබුණි. එපමණක් නොව දත් මැදීමේ පුරුද්ද පාසලෙන් නිවසට ද පැමිණි අතර දෙමවුපියන් ද දිනකට දෙවරක් දත් මැදීමට හුරු කරවීමට දරුවෝ උනන්දු වූහ.

තම සංකල්පයක් මත ඇරඹි දත් මැදීම හා ලුණු වතුරෙන් කට සේදීමේ ව්‍යාපෘතිය පුරා වසර පහක් තිස්සේ ක්‍රියාත්මක වීම මඟින් ප්‍රදේශයේ ජනතාවගේ මුඛ සෞඛ්‍යය ද ආරක්ෂා වීම තම දිවියේ ලද සුවිශේෂී ජයග්‍රහණයක් බැව් පාසල පිළිබඳ අතීතාවර්ජනයක නිරත වෙමින් තම දිනපොත අතට ගත් විදුහල්පතිතුමාට හැඟී ගියේ ය. ඔහු එහි ලියන්නට ගත්තේ තමාගේ කැපවීම තමා විසින් ම ඇගයීමට ලක්කිරීමේ සටහනකි.

“මෙම සටහන තබන මොහොතේ මාගේ නෙතගින් කඳුළු බිඳු වැටෙන්නේ කුඩා කල සිට ම දත් මැදීමට මැළිකමක් දැක්වූ මාගේ දරුවා ද මීට වසර පහකට පෙර මේ දත් මැදීමේ ආදර්ශන ක්‍රියාවලිය දැකීම නිසා එය අනුකරණය කිරීමෙන් පසු ඉතා කැමැත්තෙන් දත් මැදීමට හුරු වීම නිසා යි. බුදුරජාණන් වහන්සේ වදාළ ‘පරත්ථං පටිපජ්ජථ’ එනම් ‘පරාර්ථය පිණිස හැසිරෙවු’ යන බුදු වදන සිහි වන විට මාහට දැනෙන්නේ මා ද ආචාර්ය මණ්ඩලය ද ඒ බුදු වදනට අවනත වූ බව යි. අප කරන යහපත් දෑ තුළින් යහපත් ප්‍රතිඵල ම ලැබෙන බව සත්‍ය ලෙස ම වැටහී ගියේ දැන් 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබන මාගේ දරුවා ද අනාගතයේ දන්ත වෛද්‍යවරයෙකු වන බවට ගුරුතුමිය හමුවෙහි කියූ හඬ පන්ති කාමරයෙන් ඇසුණු විට යි.”



(කැකිරාව කලාපයේ අලුත්ගන්තිරියාගම විද්‍යාලයේ ක්‍රියාත්මක විශිෂ්ට ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 4. නායකත්වයට පෙර මං

මාසයේ අවසන් සිකුරාදා දින සවස ගුරු මණ්ඩල රැස්වීමේ දී විදුහල්පති විසින් ඉදිරිපත් කළ නව යෝජනාවෙන් ගුරුවරු මවිතයට පත් වූහ.

"මම මේ පාසලේ විදුහල්පති වුනත් මේ තනතුරේ තියෙන බර, වගකීම් ගුරුවරුන්ටත් දැනෙන්න ඕනේ. මේ පාසලේ නායකයා මම විතරක් නෙමෙයි. ගුරුවරුත් නායකයො. ඉතින් මං ගුරුවරුන්ගේ නායකත්වයට අවස්ථාව සලසා දෙන්න තීරණය කළා. ලබන සතියේ ඉඳන් මම හැම ගුරුවරයෙක්ට ම වගකීම ලැබෙන විදියට පාසලේ පරිපාලනය සම්බන්ධ වගකීම් සතියකට පවරනවා ලොග් සටහනෙන්. මම මේ සම්බන්ධ ව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයත් දැනුවත් කළා. පාසලේ විදුහල්පති විදියට හිතල අවශ්‍ය අවස්ථාවල තීරණ ගැනීමත් එම ගුරුවරයාගෙ වගකීමක්. මා ඉල්ලා සිටින්නේ ගැටලු මතු වන අවස්ථාවන්හි දී හැකිතාක් තනිව ම කල්පනා කරලා නිවැරදි ම තීරණය අරගන්න කියල යි"

විදුහල්පති විසින් වගකීම් පවරන ගුරුවරුන් සම්බන්ධ ව ලේඛනයක් ප්‍රදර්ශනය කරන්නට ද කටයුතු කළ අතර ඊළඟ සතියේ සඳුදා දිනයේ දී විදුහල්පති විසින් නායකත්වයට අදාළ වගකීම් පැවරීම පිළිබඳ ව ලොග් සටහනේ සඳහන් වූයේ මෙසේ ය.

> ජනවාරි 13 සඳුදා:
> සැලසුම් කරගත් පරිදි අද දින සිට මෙම සතිය සඳහා නයනා තිලකරත්න ගුරු මහත්මියට මා විසින් ලබා දී ඇති ලැයිස්තුවේ අමතර රාජකාරී ඉටුකිරීමට පවරමි. මම රාජකාරී අධීක්ෂණය කරමි. සතිය අවසානයේ අදාළ ගුරුභවතා විසින් ඇය මෙම වගකීම් දැරීම නිසා ලබාගත් කළමනාකරණ හැකියා පිළිබඳ කෙටි වාර්තාවක් මා වෙත ලබා දිය යුතු වේ.

සතියේ අවසානයේ තම කාර්යය පිළිබඳව කෙටි වාර්තාවක් ගුරුවරිය විසින් විදුහල්පති වෙත ලබා දෙනු ලැබීය. එහි ඇය විසින් ලැබූ ප්‍රතිලාභ මෙලෙස සඳහන් කර තිබුණි.

- සාමාන්‍ය ගුරු සංවර්ධන වැඩසටහනකට වඩා ප්‍රායෝගික වශයෙන් පාසල් නායකත්වයේ දෛනික රාජකාරී ඉටුකිරීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම
- පාසල පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනිමට හැකි වීම
- ගුරුවරුන්ගේ සුභසාධනය වෙනුවෙන් කළ යුතු විශේෂිත කාර්යයන් පිළිබඳ අදහස් ඉස්මතු වීම
- අනෙකුත් ගුරුවරුන් සමඟ මනා සබඳතාවක් පවත්වා ගනිමින් ගුරුවරුන්ගේ සහාය තම කාර්යයට ලබා ගැනිමේ හැකියාව දියුණු වීම
- කාර්යාල කළමනාකරණ කටයුතු පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ඇති වීම
- පාසල් කළමනාකරණයට අදාළ චක්‍රලේඛ, උපදෙස් සංග්‍රහ සහ ලිපි ලේඛන පරිශීලනයට වැඩි අවස්ථා හිමි වීම මඟින් පරිපාලනයේ වගකීම් පිළිබඳ වටහා ගැනීම

බොහෝ ගුරුවරුන් පාසලේ නායකත්වය ගෙන කටයුතු කිරිමෙන් ලත් අත්දැකිම් තම ජීවිතයට ඉතා වැදගත් වන බව තම වාර්තාවෙන් දක්වා තිබුණි. මේ අයුරින් පාසලේ සියලු ගුරුවරුන්ට සතියකට පාසලේ නායකත්වය සම්බන්ධ වගකීම් දැරීමට අවකාශ සැලසුණු අතර එම අවස්ථාවේ දී සමහර ගුරුවරුන් පාසලේ මතු වන යම් යම් ගැටලුවලට වඩාත් නිර්මාණශීලී විසඳුම් යෝජනා කර තිබිණි.

(පින්නවල ජාතික පාසලේ, තඹුත්තේගම කලාපයේ තෙල්හිරියාව කනිෂ්ඨ විද්‍යාලයේ සහ නිවිතිගල කලාපයේ දෙල්වල මහා විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාර ඇසුරෙන් ය.)

# 5. හැඩතල උයනෙන් හැඩ වූ පාසල

පැති මුහුණත් ගෙඩක් තිබෙන
ශීර්ෂ ගණනකුත් තිබෙන
ඉහළ ඉඳන් බලන කලට
සැලැස්මකුත් මෙහි දිස්වන
ත්‍රිමාණ හඩතලය කියා ගුරුතුමී කිව්වා.

වෘත්තය නොයෙකුත් ත්‍රිකෝණ
හතරැස් විදිහට දිස්වන
පසෙකින් චතුරස්‍ර දෙකක්
ඇතුළත මල් පාත්තියක්
ද්විමාන හැඩතල ටික අපි හඳුනාගත්තා


නොමැකී යන කවදාවත්
ගණිත දැනුම වැඩි කරවන
අපි හැමෝම ආසකරන
උයනක් තැනුණා

තරහ ගියත් ගුරුතුමීට
කිසිවිට නෑ රිදුණේ සිත
පසු දින ඈ හිනාවෙලා
එන්න කිව්ව මවුපියන්ට

දෙමවුපියෝ එකතු වෙලා
එළිමහනේ කතා කළා
දවසින් දවස ම ටික ටික
ගණිත උයන පහළ වුණා

සිලින්ඩරේ පැති කීයද
ඝනකයකට මුළු කීයද
දාර දොළහ ඝනකයෙ හැටි
එක පාරට අපි කිව්වා

ද්විමාන හැඩතල ත්‍රිමාණ විදියට
කිව්වත් නෑනේ තේරුණෙ අප හට
දකිනා තුරු ඒ එක එක හැඩ ටික
ගණිත උයනෙ පිරියත සැදි වැඩ නෙක



(හොරණ කලාපයේ ගුරුගොඩ කනිෂ්ඨ විද්‍යාලයේ හා පොලොන්නරුව කලාපයේ පොකුණුගල ප්‍රාථමික විද්‍යාලයේ සකස් කර ඇති ගණිත උයන් ඇසුරෙනි)

# 6. පෙත්තෙන් - පොත්තට

රූපවාහිනි මැදිරියක පැවැත්වෙන සාකච්ඡා මණ්ඩලයකි. වැඩසටහන මෙහෙයවන්නේ ආයුර්වේද විශ්ව විද්‍යාලයක කථිකාචාර්යවරයෙකි. පාසලක විද්‍යා විෂය භාර ගුරුතුමිය සමඟ එම පාසලෙහි සිසුහු දෙදෙනෙක් සාකච්ඡා මණ්ඩපයේ අසුන් ගෙන සිටිති.

කථිකාචාර්ය :- අද අපි "පෙත්තෙන් - පොත්තට" දේශීය වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ වැඩසටහනෙන් මෙම ස්ථානයට කැඳවා තිබෙන්නේ අපට හමු වූ සුවිශේෂී පාසලක් නියෝජනය කරන පිරිසක්. එම පාසල සුවිශේෂී වන්නේ එහි ස්ථාපනය කොට පවත්වා ගෙන යන ආයුර්වේද ප්‍රතිකාර ඒකකය නිසා. මෙම සාකච්ඡාවට සහභාගි වෙනවා තඹුත්තේගම මහසෙන් විද්‍යාලයේ විද්‍යා විෂය භාර ආචාරිණිය සහ එම පාසලේ පවත්වාගෙන යන ආයුර්වේද ඒකකයේ සභාපති හා ලේකම් ධුර දරන ශිෂ්‍යයින්.

ඔබ සියලු දෙනා සාදරයෙන් පිළිගන්නවා, ආයුබෝවන් !

අප රටේ අපට ම ආවේණික වුණු ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියන වෛද්‍ය ක්‍රමයක් තියෙනවා. නමුත් අද වන විට අපි බටහිර වෛද්‍ය ක්‍රමයට හැඩ ගැහිලා අවසන්. එවැනි වකවානුවක නගරයෙන් දුරස් වූ දුෂ්කර ප්‍රදේශයක පාසලක ගුරුවරුන් හා දරුවන් එක් ව දේශීය වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර කිරීම සඳහා පවත්වාගෙන යන ආයුර්වේද ඒකකය අගය කිරීමක් ලෙසත් එය අනෙකුත් පාසල් හා ආයතනවලට ආදර්ශයක් ලෙස රටට ම පෙන්වීමටත් අපි මේ පිරිස කැඳෙව්වා. මුලින් ම අපි මේ කටයුතුවලට අතහිත දෙන මහ පෙන්වන ගුරුතුමියගෙන් අහමු මේ කටයුත්ත ආරම්භ වුණේ කොහොමද කියලා.

ගුරුතුමිය :- අපේ පාසල ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටලා තියෙන්නේ. දෙමවුපියන් බොහොමයක් ගොවිතැන් කටයුතු කරලයි ජීවත් වෙන්නේ. පෝෂණ ඌනතා රෑසකින් දරුවන් පිඩා විඳිනවා. නිතර පාසලේ දී අසනීප වන දරුවන්ට දෙන්නේ පැනඩෝල් පෙත්තක් විතරයි. නමුත් ආයුර්වේදයේ සඳහන් බොහෝ ඖෂධ වර්ග අපේ ප්‍රදේශවල සුලබ යි. ඒ වගේ ම දරුවන්ගෙ ගෙවල්වල වැඩිහිටියන්ට සිංහල බෙහෙත් ගැන හොඳ විශ්වාසයක් තියෙනවා. ඒ නිසා ම මෙවැනි ආයුර්වේද ඒකකයක් පාසලේ පිහිටුවන්න කටයුතු කළා.

කථිකාචාර්ය :- මෙම කාර්යය සාර්ථක ව සිදු කිරීම සඳහා කුමන ක්‍රියාකාරකම් ද පාසල් මට්ටමෙන් භාවිත කළේ?

ගුරුතුමිය :- අපට සුදුසු ස්ථානයක් සපයා ගැනීමේ දීත් අප භාවිත කළේ දේශීය සංකල්පයක්. කටු මැටි ගහලා හදපු පුංචි ගෙයක්. දේශීය අංග ලක්ෂණ සියල්ල ම ඒකෙ ඇතුළත් කරලා ගුරුවරුන් හා සිසුන් විසින් ම ගොඩනැගුවා. අපි ඔසු පැන් ව්‍යාපෘතියක් ආරම්භ කළා. එයින් පාසලේ ම සිසුන්ට දිනපතා ඔසු පැන් සපයා දුන්නා. මේ වැඩේට දෙමාපියන් සියලු දෙනා ම පාහේ සම්බන්ධ වුණා. ඔසු පැන් ව්‍යාපෘතිය ඉක්මනින් ජනප්‍රිය වුණා. පාසලේ සියලු උත්සවවල දීත් අපි දෙන්නේ ඔසු පැන්. අපි දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවටත් මේ වැඩපිළිවෙළ ගැන දැනුවත් කළා. ඔවුන් අපට ඖෂධ වර්ග වගේ ම කොළ කැඳ හදන උපකරණත් ලබා දුන්නා. මේ නිසා අපි ප්‍රජාවට පහසු මිලට අලෙවි කළ හැකි පරිදි කොළ කැඳ සකස් කිරීම ආරම්භ කළා. මේ සියලු දේ නිසා පාසල ප්‍රජාව අතරට ගියා.

කතිකාචාර්ය :- මා ඊළඟට හැරෙන්නේ ඔබ පාසලේ පිහිටුවා ගෙන තිබෙන ආයුර්වේද ඒකකයේ සභාපති වෙත. ඔහු නමින් රුවන්. රුවන් අපට කියන්න මේ ආයුර්වේද වැඩසටහනට සිසුන් සම්බන්ධ වුණේ කොහොමද කියල.

රුවන් :- මුලින් ම මේ ගැන සිසුන්ව හොඳින් දැනුවත් කළා. සිසුන්ට දින කිහිපයක පුහුණුවක් ලබා දුන්නා. එම පුහුණුව කළේ විද්‍යා ගුරුතුමියගේ ආරාධනයෙන් පැමිණි දේශීය වෛද්‍යවරුන් පිරිසක්. බෙහෙත් පැළෑටි, ඖෂධ ගස්වල පොතු, මල්, මුල්, පත්‍ර ආදිය හඳුනාගන්න හැටි, සිංහල ප්‍රතිකාර කරන ආකාරය, සරල බෙහෙත් වර්ග සකස් කර ගන්නා ආකාරය එම පුහුණුවේ දී කියල දුන්නා. සිසුන් ඉතා කැමැත්තෙන් මෙම පුහුණුවට සම්බන්ධ වුණා. බෙහෙත් වර්ග සොයන්න යන්න, බෙහෙත් සකස් කරන්න සිසුන් උනන්දු වුණා.

කථිකාචාර්ය :- මා මීළඟ අවස්ථාව ලබා දෙන්නෙ පාසල් ආයුර්වේද ඒකකයේ ලේකම් ශෂිකලා දුවට. මෙම කාර්යය ක්‍රියාත්මක වෙන්නෙ කොහොමද? කවුද මේකට උදවු කරන්නෙ?

ශෂිකලා :- අපි දැන් පාසල් භූමියේ විශාල පෙදෙසක ආදර්ශ ඔසු වගාවක් ආරම්භ කරල තියනවා. ඒකෙ තියෙන ශාක වර්ගවලින් අපි දැනට ඖෂධ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගන්නවා. මෙම ඖෂධ සිසුන් විසින් ම සකසන නිසා තෙල්, පත්තු, ගුළිවලට හුරු වුණා. අපි අපේ ඉගෙනුමට බාධා නොවන විදියට මෙම ආයුර්වේද ඒකකයේ ඉන්නවා. සමහර වෙලාවට පාසලට සම්බන්ධ නැති ගමේ අයත් බෙහෙත් ගන්න එනවා. අපිට හොයා ගන්න අපහසු බෙහෙත් අමුද්‍රව්‍ය වර්ග දෙමවුපියො හෝ පාසල අවට අය සොයා දෙනවා.

කථිකාචාර්ය :-

ඉතා හොඳයි. මේ වැඩසටහනට අපි සුබ පතනවා මේ කර්තව්‍යය ඉදිරියටත් සාර්ථක ව කරගෙන යෑමට ලැබේවා කියලා. බොහෝ ම ස්තූතියි. ආයුබෝවන්.




(තඹුත්තේගම කලාපයේ රාජාංගන යාය13/14 මහසෙන් විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 7. පෝෂණීය පාඩම

පාසලේ උදෑසන රැස්වීම ආරම්භ වී මිනිත්තු 5ක ගත වූයේ නැත. ක්‍රීඩා පිටියේ උදා හිරු කිරණට නිරාවරණය වෙමින් සිට දරුවෝ කිහිපදෙනෙක් ක්ලාන්ත ව වැටුණහ. අනෙකුත් සිසුන්ගේ හා ශිෂ්‍ය නායකයන්ගේ උදව්වෙන් ඔවුහු පන්ති කරා යොමු කරන ලදහ.

සිසුන් කිහිපදෙනෙකු මෙසේ දිනපතා උදෑසන රැස්වීමේ දී ක්ලාන්ත ව ඇද වැටීම පාසලේ ගුරුවරුන්ට හා සිසුන්ට විශේෂත්වයක් නොවී ය. නමුත් මේ ගැන සිතින් විඳවන ගුරුභවතුන් දෙපළක් ඒ අතර වූහ. අපි ඔවුන් මනුප්‍රිය හා දෙව්සරණ ලෙස හඳුන්වමු. මේ ඔවුන් දෙදෙනා අතර ඇතිවූ සංවාදය යි.

"ළමයි ඔහොම හැමදා ම කලන්තෙ දාන්නේ ඒ ළමයි උදේට නොකා නොබී එන හින්දයි."

"ළමයින්ට හරියට කෑමක් බීමක් දෙන්න දෙමවුපියන්ට වෙලාවක්වත් හරියට ආදායමක්වත් නැනෙ. ළමයි පව්"

දහවල් පාසල ඇරුණු පසු ගස්වල ගෙඩි කඩාගෙන කන සිසුන් දෙස අනෙකුත් ගුරුවරුන් ඔරවීම් ගෙරවීම් කළ ද මනුප්‍රිය හා දෙව්සරණට එම ක්‍රියාව පෙනුණේ වෙනත් දෘෂ්ටි කෝණයකිනි.

"අදත් මේ ළමයි ගස්වලට ගල් ගහනවා. අනේ මන්දා මේගොල්ලා ඉස්කෝලෙ ඇවිත් මොනවද ඉගෙන ගත්තෙ කියලා. ඉදිල නැති අඹ ගැටත් කඩනවා"

"ඒක ළමයින්ගේ වැරැද්දක් නෙමෙයි. ඒ ළමයි බඩගින්න නිවා ගන්න අඹ ගැට හරි කනවා"

පාසලේ ශිෂ්‍ය සුභසාධනය ඇගයීම් සඳහා විදුහල්පතිවරයා විසින් පත්කරන ලද ගුරු කමිටුවේ සාමාජිකයන් වූ මනුප්‍රිය හා දෙව්සරණ දෙදෙනා එක්ව මේ ගැටලුවට විසඳුමක් සෙව්වේ එය පාසලේ ශිෂ්‍ය සුභසාධන ක්ෂේත්‍රය සංවර්ධනයට ඉතා වැදගත් බැවිනි. විශේෂයෙන් ම ප්‍රාථමික ශ්‍රේණි සඳහා රජයේ පෝෂණ වැඩසටහන මඟින් සහාය ලබා දුන්න ද සිසුන් 200කට වැඩි 6-11 ශ්‍රේණිවල සිසුන්ට නිසි ආහාරයක් ලැබෙන්නේ නැත.

මනුප්‍රිය විසින් ව්‍යාපෘති යෝජනාවක් සකස් කළේ සතියේ දින පහ තුළ ම විවිධ පෝෂණීය පානයන් සිසුන්ට ලබාදීම සඳහා යි. ඒ අනුව සතියේ දිනවල කොළ කැඳ, කුරක්කන් කැඳ, බෙලි මල්, රණවරා, හාල් කැඳ, එළවළු සුප්, පලතුරු බීම යන පානයන් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නට විය. ග්‍රාමීය පරිසරයක පිහිටි පාසලක් බැවින් අවට ප්‍රදේශවලින් මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම ඉතා පහසු කාර්යයක් විය. එබැවින් මනුප්‍රිය මෙම ව්‍යාපෘති යෝජනාව විදුහල්පති වෙත ඉදිරිපත් කළේ මහත් බලාපොරොත්තු ඇතිව යි. සිසුන්ගේ දෙමවුපියන් හා අවට ප්‍රජාවගේ සහාය මේ සඳහා ලබා ගැනීම පිළිබඳ ව උත්සාහය ද යෝජනාව තුළ අන්තර්ගත වී තිබිණි.

මේ අතර දෙව්සරණ විසින්ද පෝෂණ ව්‍යාපෘතියක් යෝජනා කරමින් සතියේ දින පහ සඳහා පෝෂණීය ආහාර වර්ග 5ක් නොමිලයේ සිසුන්ට ලබා දීමට සැලසුම් කරමින් විදුහල්පති වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

"දෙන්නගේ ම යෝජනා දෙක නම් හොඳයි. මං ගොඩක් අගය කරනවා. අපිට පුළුවන් යාළුවෝ දෙන්නට මේ වැඩේ සාමූහික ව කරන්න බාර දෙන්න, තනි ව්‍යාපෘතියක් විදියට එතකොට වැඩේ ගොඩක් ශක්තිමත් ව කරගෙන යන්න පුළුවන්" ඒ විදුහල්පතිතුමාගේ ප්‍රතිචාරය යි.

ඒ අනුව සතියේ දින පහ සඳහා ම 6-11 ශ්‍රේණිවල සිසුන්ට යම් පෝෂණීය පානයක් හෝ පෝෂණීය ආහාරයක් දෙමවුපියන්ගේ හා ප්‍රජාවගේ උදවුවෙන් ලබා දීමට අවශ්‍ය කටයුතු සංවිධානය විය. වසරේ පාසල පවත්වන දින ගණන අනුව සෑම දිනක ම සිසුන් කිහිපදෙනෙකුගේ දෙමාපියන්ට හා භාරකරුවන්ට 6-11 ශ්‍රේණි සඳහා පෝෂණීය ආහාරයක් හෝ පානයක් ලබා දීමට අදාළ කාලසටහන් සකස් කෙරිණි. සිදු කිරීමට බලාපොරොත්තු වන පෝෂණ වැඩසටහන හා කාලසටහන දෙමාපිය රැස්වීමේ දී ඉදිරිපත් කළ අතර ඊට කැමැති බොහොමයක් එම යෝජනාවට පක්ෂ ව අදහස් ඉදිරිපත් කළහ.

පෝෂණ වැඩසටහන සඳහා පළමු සතියේ දී ආහාර පාන වට්ටෝරු සටහන සකස් කෙරුණේ එක් එක් ශ්‍රේණිවල සිසුන්ගේ දෙමවුපියන් තිදෙනා බැගින් සම්බන්ධ කර ගනිමිනි. ආහාර හා පාන වර්ග සකස් කිරීමේ දී ඒවා වඩාත් රසවත් ව සකස් විය යුතු බවට එකඟ විය.

| | | |
|---|---|---|
| **සඳුදා** | **- කඩල** | **(6 ශ්‍රේණිය)** |
| **අඟහරුවාදා** | **- පලතුරු යුෂ** | **(7 ශ්‍රේණිය)** |
| **බදාදා** | **- බත්** | **(8 ශ්‍රේණිය)** |
| **බ්‍රහස්පතින්දා** | **- කැඳ වර්ගයක්** | **(9 ශ්‍රේණිය)** |
| **සිකුරාදා** | **- බතල** | **(10 ශ්‍රේණිය)** |

මෙම ව්‍යාපාතිය සාර්ථක ව කර ගැනිම සඳහා නිරතුරු ව එය අගය කරමින් ඊට සම්බන්ධ සියලු ගුරුවරුන්ට දිනපතා රැස්වීමේ දී ප්‍රශංසා කිරීමට විදුහල්පතිතුමා අමතක කළේ නැත.

ව්‍යාපාතිය ආරම්භ කොට මාසයක් ගත වන විට මේ පිළිබඳ ව පාසල අවට ප්‍රජාව කැමැත්තෙන් ම ඊට සහාය දැක්වීමට පැමිණීම වැඩසටහන ලැබූ ජයග්‍රහණයක් බව විදුහල්පතිට වැටහුණි.

වාර අවසානයේ ව්‍යෘපෘතිය පවත්වාගෙන යාම පිළිබඳ ව කෙටි ප්‍රගති වාර්තාවක් මනුප්‍රිය හා දෙව්සරණ ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව අතට ගත් විදුහල්පතිතුමා ඔවුන් දෙපලට ප්‍රශංසා කළේ ය.

"ඔය දෙන්නගෙ ව්‍යාපෘතිය අනිවාර්යයෙන් ම ඔයගොල්ලන්ගෙ කාර්ය සාධනයට ගොඩක් වැදගත්, හැම ගුරුවරයෙක්ම තමන්ට පැවරිලා තියෙන ඇගයීම් ක්ෂේත්‍රයේ සංවර්ධනයට මේ වගේ අලුත් ව්‍යාපෘතියක් කරනවා නම් හැම ක්ෂේත්‍රයක් ම දියුණු වෙනවා. පාසල ප්‍රමිතියකට ගෙන යන එක අමාරු නෑ".

ව්‍යාපෘතිය සාර්ථක අයුරින් ක්‍රියාත්මක වීමත් සමඟ ම නව අදහස් ද මෙම කාර්යයේ ධනාත්මක වෙනස් කිරීම් සඳහා මතු විය. ඒ අනුව හැඳි, ගෑරුප්පු භාවිත කරමින් ආහාර ගැනීමට සිසුන් හුරු කිරීමත් මෙම වැඩසටහනට ඇදා ගැනීම වඩාත් සුදුසු බවට යෝජනා කළේ පාසලේ ඉංග්‍රීසි විෂය භාර ගුරුවරියක වූ සකුන්තලා ය. එම අදහස ද ගෞරවාන්විත ව පිළිගත් විදුහල්පතිතුමා එම යෝජනාව සම්බන්ධයෙන් ගුරු මණ්ඩලය සමඟ සාකච්ඡා කොට තීරණයකට පැමිණියේ සතියේ එක් දිනක දී සිසුන්ට හැඳි, ගෑරුප්පු භාවිතයෙන් ආහාර අනුභවයට අවස්ථාව ලබා දිය යුතු බව යි.

විදුහල්පතිතුමාගේ මනා කළමනාකාරීත්වය මෙමෙ පෝෂණ වැඩසටහන සාර්ථක කර ගැනීමට කොතරම් පිටිවහලක් වූයේද යන්න පිළිබඳ ව පාසලේ සියලු දෙනා තුළ ම පැවතියේ සුබදායී ආකල්පයකි. මනුප්‍රිය හා දෙව්සරණ ගුරුවරුන් දෙදෙනා ම ඔවුන්ගේ සංකල්පයක් මත පාසලේ ඇරඹුණු මෙම සද්කාර්ය නිසා සිසු පෝෂණීය මට්ටම නැංවීමට දායක වීම පිළිබඳ ව සෑමදා ම සතුටු වනු නොඅනුමාන ය.

(සංකල්පය - ඉබ්බාගමුව කලාපයේ විලියම් ගොපල්ලව මධ්‍ය මහා විද්‍යාලය සහ හොරණ කලාපයේ වැලිකල තක්ෂිලා ප්‍රාථමික විද්‍යාලය )

# 8. කී දේ අමතකයි, දුටු දේ වඩා මතකයි

5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ගුරුවරුන් සමූහයක් සඳහා කරන ලද සාකච්ඡාවේ දී බොහෝ දෙනෙකුගේ ඇස ගැටුණේ ප්‍රශ්න පත්‍රයේ ඇති කර්මාන්ත ආශ්‍රිත ප්‍රශ්න අනවබෝධය නිසා දරුවන් අතින් වැරදී හෝ මගහැරී ඇති බව කෙරෙහි ය.

වත්මන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පාසල දරුවන්ට යමක් දැක බලා අත්විඳින්නට පහසුකම් සැලසීම සිසු ඉගෙනුමට මනා අත්වැලක් සපයයි. විශේෂයෙන් ප්‍රාථමික පන්ති කාමරය තුළ මෙවැනි දෘෂ්‍යාධාරවල අවශ්‍යතාව පැන නැගෙන්නේ ඔවුන්ට දේශන විලාසයෙන් බොහෝ කරුණු අවබෝධ කර ගැනීමේ අපහසුව නිසාවෙනි.

5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කර්මාන්ත ආශ්‍රිත පාඩමට අදාළ තාක්ෂණික/සාම්ප්‍රදායික වදන්, උපකරණ හා ක්‍රියාකාරකම් පිළිබඳ ව පන්ති කාමරයේ ඇති වන ඉගෙනුම් අපහසුතා අවම කර ගැනීමට අවධානය යොමු විය. දරුවන්ට අධ්‍යයනයට වැදගත් කර්මාන්ත 10ක් හඳුනා ගෙන, ඒ පිළිබඳ ව සිසුන්ට පහසුවෙන් මතක තබා ගත හැකි වන උපාය මාර්ගයක් හඳුනා ගැනීමට පාසලට හැකි විය. මෙහි දී එම කර්මාන්ත සම්බන්ධ සියලු ද්‍රව්‍ය හා ආදර්ශන ඒකරාශී කර ප්‍රදර්ශනයට හා භාවිතයට තැබීම පිළිබඳ ව මතු වූ නිර්මාණශීලී අදහසක් ඔස්සේ කර්මාන්ත කෞතුකාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන ලදී.

ඒ තුළ දරුවන්ට නිතර දක්නට නොලැබෙන විරල ගණයේ කර්මාන්තවලට අදාළ උපකරණ මෙන් ම එම කර්මාන්තයේ නියැළෙන මිනිසුන්ගේ මූර්ති වෙන් වෙන් ව සකස් කර ප්‍රදර්ශනයට තබන ලදී. ධීවර කර්මාන්තය, පතල් කර්මාන්තය, බෝග වගාව, සත්ව පාලනය, පේෂ කර්මාන්තය, මැටි කර්මාන්තය වැනි දේශීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත දෘශ්‍යාධාරක ඒ අතර විය. එම දෘශ්‍යාධාරක නම් කර ඊට අදාළ තොරතුරු රාශියක් ද සඳහන් කෙරිණි.

මෙය දරුවන්ට එම පාඩම්වලට අවශ්‍ය කරුණු ප්‍රායෝගික මඟපෙන්වීමක් ඔස්සේ අත්විඳීමට අවස්ථාව සලස්වා දීමකි. සියැසින් යමක් දැකීම වචන වාක්‍ය ප්‍රකෝටියකට වඩා සිසු මනසේ තැන්පත් වන බව මනෝ විද්‍යාත්මක මතය යි. ගුරුභවතුන් සඳහන් කරන්නේ දරුවන්ගේ කර්මාන්ත ආශ්‍රිත ගැටලුවලට නිසි විසඳුම් මෙම කෞතුකාගාරය ඇසුරින් ලැබී ඇති බවයි. කර්මාන්ත ආශ්‍රිත ප්‍රශ්න ලබා දෙමින් සිදුකරනු ලැබූ අනාවරණ පරීක්ෂණවල දී සියලු ම සිසුන් හොඳින් පිළිතුරු දී තිබේ.

තවත් අතකින් කර්මාන්ත කෞතුකාගාරය බහුතර දරුවන්ගේ බුද්ධි ප්‍රබෝධය පුළුල් කිරීමට සමත් වී ඇති බව පෙනී යන්නේ ඔවුන් එම ද්‍රව්‍ය වෙනස් ආකාරයෙන් නිර්මාණය කිරීමට පෙලඹීමක් ඇති අයුරු දක්නට ලැබුණු නිසා යි. මෙම කෞතුකාගාරයේ ඇති ද්‍රව්‍ය ආදර්ශයට ගෙන වෙනත් ද්‍රව්‍ය තැනීමට ද සිසුන්ට අවස්ථා ලබා දී තිබෙන්නේ එබැවිනි. අද වන විට මෙම කර්මාන්ත කෞතුකාගාරය බස්නාහිර පළාතේ ආදර්ශවත් දෘශ්‍යාධාරක පවත්වා ගන්නා ස්ථානයක් වී හමාර ය.

මෙම ස්ථානය තවත් සංවර්ධනය කරමින් සිසුන්ට විවිධ ආදර්ශන සෑදිය හැකි අමු ද්‍රව්‍ය සහ මෙවලම් ඇතුළත් ස්ථානයක් වීම වඩාත් යෝග්‍ය වේ. පන්ති කාමරය තුළ ඉගැන්වෙන කරුණු ප්‍රායෝගික ව සිසුන් විසින් ම අත්දැකිය හැකි භාණ්ඩ හෝ ආදර්ශන බවට පත් කිරීමට අවස්ථාව ලැබීමෙන් දුටු දේ තුළින් ලැබූ අවබෝධය තවදුරටත් පුළුල් කර ගන්නට හා ඉගෙන ගත් දේ සදා මතකයේ රඳවා ගැනීමට වඩාත් පහසු වනු නොඅනුමාන ය.

(සංකල්පය - බප/ජය ඉහළ බෝමිරිය කනිෂ්ඨ විද්‍යාලය)

# 9. පන්ති වැඩ සැලැස්ම

පන්ති භාර ගුරුවරුන් විසින් සිසුන්ගේ දෙමවුපියන්ට යවන ලද පත්‍රිකාවක ආකෘතියක් පහත දැක්වේ.

හිතවත් දෙමාපියනි,

පන්ති කාමරය තුළ ඔබේ දරුවාගේ පාඩමට අදාළ ඉගෙනුම් උපකරණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන නොඑන බැවින් මා ඉතා අපහසුතාවට පත් වේ. එම නිසා ඔබේ දරුවා පෙබරවාරි මාසය සඳහා රැගෙන ආ යුතු ඉගෙනුම් උපකරණ ද්‍රව්‍ය ලයිස්තුවක් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

| ක්‍රියාකාරකම් දිනය | අවශ්‍ය ද්‍රව්‍ය |
|---|---|
| 2016.02.08 | ඔරලෝසු මුහුණතක් (1 සිට 12 දක්වා අංක යොදන ලද ) |
| 2016.02.15 | සාදා ගත් මීටර් කෝදුවක්, මීටර් 2ක් දිග ලණු කැබැල්ලක් |
| 2016.02.18 | කඩදාසියෙන් කපාගත් අහස් යානයක් |
| 2016.02.19 | පනින ලණුව (ස්කිපිං රෝප්) |
| 2016.02.23 | 1 සිට 20 තෙක් සංඛ්‍යා තීරුවක් |
| 2016.02.25 | කැලයේ සිටින සතුන්ගේ පින්තූර |
| 2016.02.28 | නෙට් වලල්ලක් |

සෑම මසක ම ආරම්භයේ දී මෙවැනි පත්‍රිකාවක් ඔබට ලැබෙන අතර ඒ පිළිබඳ අවධානය යොමු කර අවශ්‍ය ද්‍රව්‍ය නියමිත දිනයේ දී පාසලට එවීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් දන්වමි.
ස්තූතියි.

පන්තිභාර ගුරුතුමිය (3 ශ්‍රේණිය B)

නිතර නිතර ඉගෙනුම් ද්‍රව්‍ය ගෙන එන්නට සිසුන්ගේ දෙමවුපියන්ට පණිවිඩ යවනු වෙනුවට මාසය ආරම්භයේ දී ම මෙවැනි ලයිස්තුවක් මඟින් එම කාර්යය ඉටු කර ගැනීම වඩාත් ඵලදායී නොවන්නේ දැයි සිතා බලනු මැනවි.

# 10. පාසලට බලය දෙන බලශක්ති සංගමය

***ඔබේ විදුලි බිල අඩු කර ගන්න......!***

***බලශක්ති සංරක්ෂණය සඳහා ප්‍රජාව හුරු කිරීමේ වැඩසටහන***
***2016***

***ගම්පොල වික්‍රමබාහු ජාතික පාසලේ බලශක්ති සංගමය දස වැනි වරටත් සංවිධානය කරන වාර්ෂික වැඩසටහන් මාලාවේ ප්‍රජාව දැනුවත් කිරීම් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් වැඩමුළුව 2016.02.11 සහ 12 දෙදින දවස පුරා විද්‍යාලයීය පරිශ්‍රයේ දී.***

*මෙම වැඩසටහන තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් මඟින් ප්‍රජාව දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ.*

- ***LED** පහන් එකලස් කිරීම*
- *විකල්ප බලශක්ති නිවසේ දී යොදා ගැනීම*
- *බහුකාර්ය ළිප, බහුකාර්ය මුට්ටිය සකස් කර ගැනීම*
- *සූර්ය කෝෂ පහසු මිලට ලබා ගැනිමට අවස්ථාව සැලසීම*

වැඩසටහන සඳහා දිස්ත්‍රික්කය තුළ පාසල් ගණනාවක ගුරුවරුන් හා සිසුන් සහභාගි වන අතර බලශක්ති සංරක්ෂණය හා නිවසේ විදුලි බිල අවම කර ගැනීමේ දී ඔවුන් සමඟ අත්දැකීම් බෙදා ගැනීමේ අවස්ථාව ද හිමි වනු ඇත.

*පාසල් බලශක්ති සමාජය මඟින් නිරතුරුව කෙරෙන ප්‍රජා දැනුවත් කිරීම් තවදුරටත් ශක්තිමත් ව ඉදිරියට පවත්වා ගෙන යාම මෙම වැඩමුළුවේ අරමුණ යි.*

**පාසල් බලශක්ති සංගමය**

## 11. ගමෙත්, නගරයෙත් සරු එල

ගම්මානය සුන්දර
මැද පාසල වැජඹෙන

නගරය සන්සුන් නැති
පාසල ඒ මැද ඇති

දරුවන් සිත පුබුදන
ගත දහදිය වගුරන
දුටු දුටු නෙත් සනහන
ගොවි බිමක් ය පාසල

සියොතුන් ගී නද පැතිරෙන
තුරු වදුලෙන් දසත දිලෙන
සුන්දර ගම්මානයක් ය
බව බෝගෙන් සපිරුණ

සුන්දර කඳු මුදුනක
දිය එන උල්පත් රැස
රටට ම සිසිලස බෙදමින්
ගලා හැලෙයි දස අත

කඳු මුදුනේ වැජඹෙන
පාසල ඇත දින දින
කිතු ගොස නංවමින් දසත
දරුවන් රජ කරවන

ගසේ වැලේ රුව දුටුවා
පලේ රසය ගුණ වැනුවා
පාසල් වත්තේ පුරාම
නෙක පල වැල හිනැහුණා

සිසිල් පවන නැත ගලා
ගිනියම් වේ ගත දවා
සියලු සතන් ලෙඩ කරමින්
නගරය ජීවත් වුණා

සිප්හල වෙත නගරයේ
ඇදුණා දරු කැල දැයේ
සතුටින් වට පිට බැලුවා
නෑ සිසිලක් දැවටුණේ

හූ හඬ ජරමර හඬ
ගොස ගොස හඬ පැතිරෙන
දූවිලි ගෝසා මැද්දේ
පාසල කල් හරිමින

ගසේ වැලේ රුව දුටුවා
පලේ රසය ගුණ වැයුවා
බෝතල්, බට, කොටු අස්සෙන්
නෙක නෙක පල හිනැහුණා

පරිසරය ම සුවඳවත් ය
නීරෝගී දරු පරපුරක් ය
දෑ හිතකාමී පරිසරයක් ය
පාසලක් ය, පරපුරක් ය

# 12. විස්කම් දනවන පුස්තකාලය

´කියවීම මිනිසා සම්පූර්ණ කරයි´ හැම පුස්තකාලයක ම මේ ආදර්ශ පාඨය දකින්නට ලැබෙනවා.

නමුත් මේ කියමන යථාර්ථයක් වීමට නම් වත්මන් පුස්තකාලය තවදුරටත් තවත් එක් කියැවීමේ ශාලාවක් හෝ පොත් පත් පරිශීලනය කෙරෙන ස්ථානයක් පමණක් නොවිය යුතුය. පාසලක පුස්තකාලයෙන් සිසුන්ට ඉගෙනුම් නිපුණතා රාශියක් සාක්ෂාත් කර ගැනීමට හැකි බව බොහෝ පර්යේෂණයන්ගෙන් අනාවරණය වී තිබේ. එසේ වුව ද ඒ සඳහා උචිත වැඩසටහන් පුස්තකාලය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක වන්නේ පාසල් අතලොස්සක පමණි.

එවැනි එක්තරා පාසල් පුස්තකාලයක ක්‍රියාත්මක කෙරෙන විවිධ වූ වැඩසටහන් රාශියක් පාසල් විශිෂ්ට ව්‍යවහාර සොයා යාමේ දී අපි හඳුනා ගත්තෙමු. එම ක්‍රියාකාරකම් හා සබැඳි සංකල්ප දිවයිනේ සියලු පාසල් සමඟ බෙදා ගැනීම උදෙසා පහත සඳහන් කර තිබේ.

- පුස්තකාල පරිපාලන පුහුණුව සිසුන්ට ලබා දීම හා ශිෂ්‍යයින් පුස්තකාලාධිපතිවරුන් ලෙස පුහුණු කිරීම
- පාසල් දැනුම මිනුම තරග සංවිධානය හා ක්‍රියාත්මක කිරීම
- නිර්මාණශීලී ලේඛන කුසලතා වර්ධන වැඩමුළු පැවැත්වීම
- ප්‍රාථමික සිසුන් ලියූ කතන්දර, පොත් ලෙස සකසා ප්‍රකාශනයට පහසුකම් සැපයීම
- පුවත්පත් කාටූන් එකතුව,කතන්දර චිත්‍රයට නැඟීම හා ප්‍රදර්ශනය
- කාලීන පුවත් හා තොරතුරු නිවේදන හැකියා වර්ධනය
- විවිධ ශ්‍රේණිවලට අදාළ පැවරුම් ගොනු හා පැවරුම් බැංකු පවත්වා ගෙන යාම
- රූප හා ද්‍රව්‍ය ඇසුරින් කතා සහ අදහස් නිර්මාණය
- කතා ඇසුරින් කාව්‍ය නිර්මාණකරණය
- පුවත් පත් කැපුම් ඒකකය මඟින් පුවත් ලිපි කපා පොත් සකස් කිරීම
- අධ්‍යාපනික පොත්වල කරුණු පරිගණක වැඩසටහන් (presentations) සකස් කිරීම
- සිංහල / ඉංග්‍රීසි සාහිත්‍යය හා භාෂා තරග පැවත්වීම
- කථික හා විවාද තරග කණ්ඩායම් සංවර්ධනය
- ප්‍රහේලිකා, අභියෝගාත්‍මක ගැටලු නිර්මාණය, විසඳීම ඇතුළු ක්‍රීඩා හඳුන්වා දීම
- රුවන් වැකි හා විද්වත් ප්‍රකාශ ප්‍රදර්ශන
- අත්කම් නිර්මාණකරණය සඳහා මඟ පෙන්වීම

මෙවැනි වැඩසටහන් රාශියක් සිදුකිරීම සඳහා පුස්තකාල පරිසරය සකස් කිරීමේ හා පවත්වා ගෙන යාම ද අභියෝගයකි. එය ජය ගැනීම සඳහා පුස්තකාල ආචාර ධර්ම ආරක්ෂා කිරීමත්, ඊට අවැසි සිසු චර්යාව අගය කිරීමත් කෙරෙහි පාසලේ අවධානය දැඩි ලෙස යොමු වී තිබේ.

මේ වන විට මෙම පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය භාවිතයට අවශ්‍ය පහසුකම් සපයා ගෙන තිබේ. පුස්තකාලයේ පොත් සියල්ල පිළිබඳ විස්තර පරිගණක දත්ත පාදක ගත කරමින් පවතී. අන්තර්ජාල පහසුකම් නිසා සිසුන්ට හා ගුරුවරුන්ට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකි පරිසරය නිර්මාණය කර දී තිබේ. එමෙන් ම විද්‍යුත් පොත පත (e–books) පරිශීලනයට අවශ්‍ය මෘදුකාංග ස්ථාපනය කර තිබේ.

මේ සියල්ල එක් තැන් වූ තැන විස්කම් දනවන පුස්තකාලයක් නිර්මාණය නොවේ ද?




(කළුතර මිරිස්වත්ත ජාතික පාසල, දෙනුවර කලාපයේ පිළිමතලාව කනිෂ්ඨ විද්‍යාලය, දෙහිඅත්තකණ්ඩිය මැදගම ද්විතීයික පාසල හා පොලොන්නරුව නැගෙනහිර පලුගස්වැව විද්‍යාලය යන පාසල්වල ව්‍යවහාර ඇසුරෙන් සකස් කරන ලදී)

# 13. අපේ පන්තිය හොඳ ම පන්තිය

කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් පවත්වන ලද වැඩමුළුවෙහි න්‍යායාත්මක දේශනවලින් අනතුරු ව ආදර්ශවත් අයුරින් පවත්වාගෙන යන පාසලකට ගොස් අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාවක් නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට සැලසිණි. එය කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පවත්වන පුහුණු වැඩමුළුවක අවසාන කොටස විය.

පාසල් භූමිය පුරා ඇවිද යන ඔවුන්ට පාසල් පිරියත මෙන් ම පන්ති කාමර ද ඉතා අලංකාර ව හා ආකර්ෂණීය ලෙස සකස් කර ඇති ආකාරය දක්නට ලැබුණි. පවිත්‍රතාව මෙන් ම මනා ඉගෙනුම් පරිසරයක් සකස් කිරීම අතින් ද සෑම පන්තියක් ම ඉහළ මට්ටමක පැවතිණි. සිසුන් සියලු දෙනා ඉතා සංවර ව, ඕනෑකමින් ඉගෙනීමෙහි නිරත ව සිටිනු පෙනිණි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මේ අයුරින් හැඩගස්වා තිබීම පිළිබඳ ආගන්තුක නිලධාරීහු මහත් සතුටට පත් වූහ.

පාසලේ විදුහල්පති හමුවී කළ කතාබහේ දී විශේෂයෙන් ම ගුණාත්මක පංති කාමර පරිසරය හා ඊට උචිත සිසු චර්යාව හැඩ ගැසීම පිළිබඳ ව බොහෝ අදහස් පළ විය. එම පාසල් සංස්කෘතිය අගයමින් නියෝජ්‍ය විදුහල්පතිවරුන් දැක් වූ ප්‍රතිචාරවලට විදුහල්පතිතුමා මෙසේ පිළිතුරු දුන්නේ ය.

“මීට පෙර අපේ පාසලේ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය යහපත් මට්ටමක තිබුණේ නෑ. සිසුන් පංති කාමරවල කලහකාරී විදිහට හැසිරුණා. නමුත් ආදර්ශ පන්ති කාමරය තේරීමේ විශේෂ වැඩසටහනක් හරහා අපට එම ගැටලුවලට ඉක්මන් විසඳුම් ලබා ගැනීමට හැකි වුණා. මේක තරඟයක් ඒකේදි අපි සකස් කළ නිර්ණායකවලට අනුව ලකුණු පැවරීමක් කරනවා. මේ පත්‍රිකාවෙ තියෙන්නෙ ඒ නිර්ණායක ටිකයි.”

- පන්ති කාමරය හා අවට පිරිසිදු කිරීම
- ආගමික වතාවත් හා උදෑසන රැස්වීමට දෛනික ව සහභාගි වීම
- පන්ති කාලසටහන්, පිරිසිදු කිරීමේ නම් ඇතුළු තොරතුරු/ලේඛන ප්‍රදර්ශනය කිරීම
- පන්ති වාර්තා පොත්, නාමලේඛන සම්පූර්ණ කර විධිමත් ව නඩත්තු කිරීම
- පන්ති කාමර ඉගෙනුම් පරිසරය හා දෘශ්‍යාධාර සකස් වී තිබීම
- ඩෙස්ක්, පුටු ඇතුළු ලී භාණ්ඩ පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීම
- ශිෂ්‍ය නිල ඇඳුම, නිය, කෙස් පිළිවෙළට හා පිරිසිදු ව පවත්වා ගැනීම
- සිසුන්ගේ දිනපතා පැමිණීම, ගුරුවරුන්ට අවනත වීම හා ඉගැන්වීමට සහාය දීම
- එක් එක් විෂයයන් සඳහා ලකුණු 40ට වඩා ලබා ගැනීම
- සිසු විනය ගැටලු අවම වන සේ කටයුතු කිරීම හා ආදර්ශවත් හැසිරීම් රටාව

“මේ නිර්ණායකවලට අනුව පාසල් අධීක්ෂණ කණ්ඩායම් විසින් අවස්ථා කිහිපයක දී ඇගයීමට ලක් කරලා දෙන ලකුණු සාමාන්‍යය අනුව සමාන්තර පන්තිවලින් එක පන්තියකට මාසය අවසානයේ සහතික පත්‍රයක් සමඟ කුසලානයක් පිරිනමනවා. මේ ක්‍රමවේදය මාස කිහිපයක් තිස්සේ අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීමෙන් පාසලේ හැම පන්ති කාමරයක් ම ඉතාමත් හොඳ ඉගෙනුම් පරිසරයක් සහිත ව ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කරගැනීමට හැකියාව ලැබී තිබෙනවා. ”

ඇගයීම් පත්‍රිකාව නිරීක්ෂණය කළ නියෝජ්‍ය විදුහල්පතිවරු ඒ පිළිබඳ ව තවදුරටත් විස්තර විමසුහ. "පන්ති භාර ගුරුවරුන්ට වගකීමක් තියෙනවා තමන්ගෙ පන්තිය නියම ආකාරයට පවත්වා ගන්න. ශ්‍රේණියේ හොඳ ම පන්තිය පවත්වා ගන්නා ගුරුභවතාටත් අපි අවුරුද්ද අවසානයේ ඇගයීමක් කරනවා".

"ළමයි මේ වැඩේට කැමතිද?" එක් අයෙක් නැඟූ පැනයට නැවත විදුහල්පතිතුමා පිළිතුරු දුන්නේය. "දැන් පන්තියේ සිසු දරුවෝ පන්තිය පිළිවෙළට වගේ ම ලස්සනට පවත්වා ගන්න එකතු වෙලා වැඩ කරනවා. පංතියේ ඉගෙනුම් ක්‍රියාකාරකම්, දෘශ්‍යාධාරක පවා ගුරුවරුන්ගේ උපදෙස් අනුව සකස් වෙන්නෙ දරුවන්ගෙ අතින්. දැන් මේකට තියෙන්නෙ තරගයක්"



"ඇත්තට ම

ඔබතුමාගේ පාසලේ ක්‍රියාත්මක වැඩසටහන අපේ සියලු පාසල්වලට හොඳ ආදර්ශයක්. මේ පන්ති ඇගයීම් නිර්ණායක ටික තවත් සංවර්ධනය කරලා කලාපයේ සෑම පාසලක ම ක්‍රියාවට නංවන්න වටිනවා" යැයි කථාවට නිහඬ ව සවන් දී සිටි කලාප අධ්‍යක්ෂතුමා පැවසීය.

(බණ්ඩාරවෙල විශාකා බාලිකා මහා විද්‍යාලයේ හා මොනරාගල කලාපයේ හිදිකිවුල කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාර ඇසුරෙනි)

# 14. මේ පාසල් ගුවන් විදුලි සේවය යි

පාසලක ගුවන් විදුලි සන්නිවේදන සේවයක් ආරම්භ කර දස වසරක් ගත වූ තැන එම කාර්ය අගය කිරීම් වස් සාංවත්සරික උලෙළක් පැවැත්විණි. එම උත්සවයේ ප්‍රධාන ආරාධිතය වූයේ එම ගුවන් විදුලි සේවයේ ශිෂ්‍ය නිවේදකයෙකු ලෙස කටයුතු කළ, මේ වන විට එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි තරුණ සමාජයේ මාධ්‍ය සාමාජිකත්වය දරන පාසලේ ආදි සිසුවෙකි.

පහත දක්වා ඇත්තේ එම ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාවෙන් උපුටා ගත් කොටසකි.

උපන් බිමෙන් සැතපුම් දහස් ගණනක් දුරු රටක ජීවත් වුවත් මා හැම විටම සිහිපත් කරන්නේ අද මා මේ තත්ත්වයට පැමිණීමට මෙම පාසලේ ප්‍රජා ගුවන් විදුලි සේවයෙන් ලබා ගත් පරිචය පිළිබඳව යි. ඒ වගේ ම එම ගුවන් විදුලි සේවයට උචිත නිවේදකයෙකු ලෙස මා පුහුණු කළ මාගේ ආදරණීය ගුරුතුමා ජිනසේන වනිගරත්න මහත්මා යි. අද මා මගේ හඬ ලෝකයට අවදි කරන්නේ ඒ දිරිගැන්වීමට පින්සිදු වන්නට යි.

මා කුඩා සිසුවෙකුව සිටියදී පුංචි කතාවකින් සාහිත්‍ය සමිතිය ආමන්ත්‍රණය කළ හැටි තවමත් මතකයි. මගේ මුහුණ රතු වී, දැඟිලි, දෙපා ගැහි ගැහී යනු බලා සිටි මාගේ ආදරණීය ගුරුතුමා නැගී සිටිමින් මාව අගය කර මා දිරිමත් කළ අයුරු අද ද සිහිපත් කරන්නේ අප්‍රමාණ භක්තියෙන්. "පුතා ඔයා කියූ ටික අදට හොඳට ම ඇති. අපි හෙට තව හොඳ කතාවක් කරමු" කියමින් මුළු සභාවට ම අත්පොඩි ගසන්නට ආරාධනා කළ හැටි තවමත් මතකයි.

පාසලේ මාධ්‍ය ඒකකයක් පිහිටුවා ගෙන නිවේදකයින් පුහුණු කිරීම සඳහා මාගේ ගුරුතුමා දැරූ කැපවීම පුදුම සහගත යි. නිවේදන කටයුතු සඳහා සිසුන් තෝරා ගැනීමත් සිදු කරනු ලැබුවෙ ඉතා ම පරිස්සමෙන්. පාසල් මාධ්‍ය ඒකකය තවත් සංවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසයි පාසල් ගුවන් විදුලි සේවය බිහි වුණේ.

මෙතරම් තාක්ෂණය දියුණු නැති එම වකවානුවේ කුඩා කැසට් රෙකෝඩරයක් භාවිත කරමින් අපි කරන කතා, නිවේදන හඬ අපට ම නැවත අසන්නට සැලැස්සුවා. අපේ කථන හැකියාව පමණක් නොව ශ්‍රවණ හැකියාවත් දියුණු කරන්න උදව් වුණේ එම හැකියාවන් දෙකම නිවේදන කාර්යයේ දී අවශ්‍ය වන නිසා යි.

අපේ පාසලේ සිසුන්ට පොදු ගැටලු කිහිපයක් තිබුණා. සිසුන්ට ඉදිරිපත් වීමේ බියක් වගේම සබගෝලයක් තිබුණා. ඒක මේ ප්‍රදේශයේ දරුවන්ට ලැබෙන අඩු අවස්ථා නිසා ඇති වුණු තත්ත්වයක්. ඒ වගේ ම සිසුන් සන්නිවේදන උපකරණ භාවිතයට අනිසි බියක් දැක්වූවා. බොහෝ සිසුන්ට නිවේදන කාර්යයට උචිත හඬක් තිබුණෙ නෑ. විශේෂයෙන් ම සඳහන් කළ යුතුයි නිවේදකයෙක්ට අවශ්‍ය ම සාමාන්‍ය දැනීම පිළිබඳ ව සිසුන්ට තිබුණෙ අඩු අවබෝධයක්.

නමුත් මෙම ගුවන් විදුලි සේවය සෑම සිසුවෙක් හට ම අවස්ථාව ලබා දීමට කටයුතු කළා. මම පාසලේ එතරම් කැපී පෙනුණු සිසුවෙක් නොවුණත් වනිගරත්න ගුරු මහත්මා තමයි මාව මෙම සන්නිවේදන ඒකකයට සම්බන්ධ කර ගත්තෙ. අනෙක් සිසුන් වගේ ම මාවත් ඉතා ඕනෑ කමින් පුහුණු කළා.

මා මුලින් ම පාසලේ ගුවන් විදුලි සේවාවෙන් ප්‍රජාව ඇමතුව දවස මට තාමත් මතකයි. නිවේදන කටයුතු අවසන් වෙලා මම පන්තියට යන්න ලැහැස්ති වෙද්දි මගේ ගුරුතුමා මා ළඟට ඇවිත් මගේ උරහිස තදින් අල්ලගෙන "පුතේ උඹට විශ්වයට කථා කරන්න කට හඬක් තියනවා, මට ආඩම්බරයි" කියා මාව දිරි ගැන්වූවා. මට ඒ වචන ටික තවමත් ඇහෙනවා. මම ජීවිතේට ම අහපු හොඳ ම වචන ටික .

එදා ඉඳල මට ලොකු ආත්ම විශ්වාසයක් ඇති වුණා. සාහිත්‍ය සමිතියේ මට කතාවක් හැමදාමත් ලැබුණා. ඒ විතරක් නොවෙයි. සෑම සතියේ ම සිකුරාදා දවසේ ගුවන් විදුලි වැඩසටහන පැවැත්වුණේ ඉංග්‍රීසියෙන්. ඒ වැඩසටහන මෙහෙයවූවේ පාසලේ ඉංග්‍රීසි භාෂාවට දක්ෂ සිසුවියන් හතර දෙනෙක්. මා එවකට ඉංග්‍රීසි කථනයට දක්ෂයෙක් නොවුණත් මා හට ඒ සඳහා ද කෙරුණු ආරාධනය නිසා ම මම නිවේදනය ඉංග්‍රීසි ගුරුවරියට කියල ලියාගෙන ඒක කට පාඩම් කරල තමයි ගුවන් විදුලි නිවේදනය කළේ. මට ඒක මහත් අපහසුවක් වුණත්, පාසලේ විදුහල්පතිතුමාත්, අනෙකුත් ගුරුවරුත් මාව දිරි ගැන්වුවා.



අපේ සන්නිවේදන ඒකකය අපට කියවන්නත්, තොරතුරු සම්පිණ්ඩනය කරල නිවේදන ලියා ගැනීමටත් පුරුදු කළා. රටේ ලෝකෙ එදිනෙදා තොරතුරු දැනගැනීම අනිවාර්ය වී තිබුණා. නිවේදන සකසා ගන්න අවශ්‍ය තොරතුරු සපයා ගන්න සිසුන් පුස්තකාලය වැඩි වශයෙන් භාවිතයට ගත්තා.

සොයාගත් කරුණු හා එදිනෙදා තොරතුරු අපේ හඬින් ශබ්ද විකාශන යන්ත්‍රය ප්‍රචාරය කරන කොට අපට ඇති වුණු හැඟීම විස්තර කරන්න බැහැ. ඒවා අහගෙන ඉන්නවද බලන්න වනිගරත්න ගුරු මහත්මා අහඹු ලෙස අපෙන් ප්‍රශ්න ඇහුව මට මතකයි. අපේ මුළු පාසල ම සවන් දෙන්න පුරුදු වුණේ ඒ නිසා තමයි.

අපේ පාසල් ගුවන් විදුලිය ප්‍රජාවට ම විවෘත වුණා. පාරේ යන එන අය බයිසිකල් නවත්තලා ඒවා අහගෙන ඉන්න තරම් අපේ වට පිටාව වෙනස් වුණා. මේ සියල්ල ම පාසල් ගුවන් විදුලි සේවය හා සන්නිවේදන ඒකකය නිසා ලැබුණ ප්‍රතිලාභ.

මේ වැඩසටහන මඟින් ඉදිරිපත් කරපු විශේෂාංග රාශියන් තිබුණා. ´ඔබේ දැනුම් පොතට', 'ඔබේ ජීවිතයේ දියුණුව දකින්න', 'ජීවිතයට ඔවදනක්', 'වාර්ෂික පැන විසඳුම් තරගය', 'කැලේ පිපුණු මල්', 'එක් වියතෙක් ඔබ හමුවට' ඒ වැඩසටහන් අතරෙ මගේ මතකයේ රැඳුණු ඒවා. ඒ නිසා ම යි සඟරා කියවීම පාසලේ වඩාත් ප්‍රචලිත වූයේ. අපි වාර්ෂික ව පොත් ගෙන්වන කොට වඩාත් නැඹුරු වූයේ සඟරා ගෙන්වීමට. හේතුව තමයි, ප්‍රවෘත්තිවලට තොරතුරු ගැනීම. ඒක තරගයක් වගේ වුණේ අපට නොදැනීම යි. අපට පෞද්ගලික ගුවන් විදුලියකින් ලැබුණු පුහුණුවත් අතිශය වාසිදායක වුණා.

අපේ පාසලට මෙහි ප්‍රතිඵලය ගලා ආවේ ගඟක් ගලන්නා වගේ යි. කොට්ඨාස, කලාප, පළාත්, සමස්ත ලංකා, ජාතික මට්ටමේ කථික, විවාද ආදි ජයග්‍රහණ රාශියක් ලැබුණා. ශබ්ද විකාශනයෙන් නම කියලා සහතික, පදක්කම් දැතට ලැබෙද්දී අත්පොඩි හඬ පළාත පුරා සිසාරා යද්දි අපට ඇති වුණු සතුට ඇඟ මස් ලේ නහර පුරා දිව ගියේ අහස උසට ජීවන බලාපොරොත්තු දල්වමින්. එහි අවසාන හා හොඳ ම ඵලය අත් විඳින්නේ මම කියලයි මට හිතෙන්නෙ. එහි ගෞරවාන්විත දැවැන්ත සෙවණැල්ල මගේ ගුරුතුමා සහ මේ සන්නිවේදන ඒකකය යි.

ඉතින් අවසාන වශයෙන් මා බොහෝ සතුටු වෙනවා වසර දහයක් පුරා මෙම කටයුත්ත ක්‍රියාත්මක වීම ගැන. මට දැනගන්නට ලැබුණු විදියට පාසල හැර යන සිසුන් බොහොමයක් පෞද්ගලික රූපවාහිනී හා ගුවන් විදුලි ආයතනවල පහසුවෙන් ම රැකියා සොයා ගෙන තිබෙනව. වැඩසටහන් සැලසුම්කරණයේ දීත් ඒ අය දක්ෂ වෙලා තිබෙනවා. මේ සියල්ලට ම මඟ පෙන්වූ පාසල් ගුවන් විදුලි සන්නිවේදන සේවය දිනෙන් දින දියුණු වී පාසලේ සිසුන්ට හොඳ අනාගතයකට අවශ්‍ය කුසලතා සංවර්ධනයේ තෝතැන්නක් බවට පත්වන්නට අවශ්‍ය ශක්තිය ලැබේවා කියා මා ඉත සිතින් ප්‍රාර්ථනා කරනවා.

(අම්පාර කලාපයේ රජගලතැන්න මහා විද්‍යාලය හා කීනවත්ත විද්‍යාලය, තඹුත්තේගම කලාපයේ රාජාංගන යාය13/14 මහසෙන් විද්‍යාලය, දෙහිඅත්තකණ්ඩිය කලාපයේ උත්තලපුර ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල ක්‍රියාත්මක ව්‍යවහාර ඇසුරෙනි)

# 15. රෝහලට උදව්වක්

දිනයේ දී සැලසුම් කළ රාජකාරි සියල්ල පාසල් කාර්යාලය තුළ ලහි ලහියේ සිදුවෙමින් පවතින අතර කාර්යාලයට පැමිණියේ උපදේශනය භාර ගුරුවරිය යි.

"මැඩම්........ අදත් ලෙඩ්ඩු දෙන්නෙක්...........
ත්‍රීවිලර් එකක Hospital ගිහින් බෙහෙත් අරන් එන්නද?" ඇය විමසා සිටියාය.

"යමු...... මමත් එන්නම් ඔයා තනියමනේ....... දෙන්නෙක් එක්ක අමාරුයි නේද?"

වැත්තෑවේ රජයේ රෝහල ලෙඩට දුකට පිහිටට ඉන්න, දුප්පත් මිනිසුන්ගේ දේවතාවෙකු මෙනි. පාසලේ දරුවන් කුමන හෝ අසනීපයකට ලක් වුව ද වහා රැගෙන එන්නේ මෙතැනට ය. අද විදුහල්පති ලෙස මා දරුවන් රැගෙන එහි යන්නේ කාරණා දෙකක් සපථ කර ගැනීමට ය. පළමු කරුණ පුරුදු පරිදි දරුවන්ට ප්‍රතිකාර කිරීම යි. දෙවැන්න 'අදත් බෙහෙත් ඔතලා දෙන්නේ කොල කැබැල්ලක ද?' යන පැනයට පිළිතුර ලබා ගැනීමට යි. පාසලේ විශිෂ්ට ව්‍යවහාරය එළි දක්වන්නේ මින් ලද පිළිතුර මත වීම ඊට හේතුව යි.

වැත්තෑවේ රෝහලට දිනපතා රෝගීහු විශාල ප්‍රමාණයක් පැමිණෙති. බෙහෙත් පෙති වශයෙන් රෝගීන්ට ලබා දීමේ දී විධිමත් ව කවරවල බහා ලබා දීමට හැකියාවක් රෝහල සතු නොවී ය. එසේ නම් ප්‍රජා සත්කාරයක් ලෙස පාසල මෙම ක්‍රියාවලිය භාරගත යුතු නොවේද?. විදුහලේ සිසු දරුවන් ගුරුවරුන් විවේකී ව ගත කිරීමට ලැබෙන වේලාව ඵලදායී දෙයකට යොමු කළ යුතුය. විදුහල්පතිනිය කල්පනා කළා ය. ඒ සංකල්පය ඵල දරන්නට එතරම් වෙහෙසක් දරන්නට සිදු වුයේ නැත. පාසල් ප්‍රජාව ඉතා කැමැත්තෙන් එම කාර්යය භාර ගත් අතර සෑම මසකට වරක් ම බෙහෙත් කවර 3000ක් පමණ රෝහලට ප්‍රදානය කිරීමට හැකියාව ලැබිණි. ඒ සමඟ ම පාසලේ සිසුන් හා ගුරුවරුන් අතරත් රෝහල් කාර්ය මණ්ඩලය අතරත් පෙර නොවූ සබඳතාවක් ගොඩනැඟිණි.



වසර තුනක් තිස්සේ සිදු කෙරෙන වැත්තෑවේ රජයේ රෝහල සඳහා බෙහෙත් කවර සෑදීමේ කටයුත්ත අද ද විශිෂ්ට ව්‍යවහාරයක් ලෙස කරගෙන යනු ලබයි. සිසුන් තම නිවෙස්වල ද බෙහෙත් කවර සකස් කර පාසලට ගෙනෙවිත් දෙන්නේ රෝහලට යැවීම සඳහා යි. තෙවසරකට පෙර ඇරඹි මෙම කාර්යය හා බැඳි සංස්කෘතියක් පාසල හා රෝහල අතර දැන් ගොඩනැගී තිබේ.

රෝහල සමඟ ගොඩනැඟුනු සබඳතාව නිසා ම ශිෂ්‍ය සුබ සාධනයට අදාළ විශේෂ වෛද්‍ය සායන පැවැත්වීම සහ සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම රෝහල් කාර්ය මණ්ඩලය කැමැත්තෙන් සිදු කිරීම පාසල ප්‍රජාව අතර ගෞරවයට ලක් ව ඇති බවට නිදසුනක් නොවේද?

(මතුගම කලාපයේ ඉද්දගොඩ කනිෂ්ඨ විද්‍යාලය සහ තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලයේ මෙවැනි ව්‍යවහාර ක්‍රියාත්මක වේ.)

# 16. හැකියාවට පැයක්

විද්‍යාලීය ප්‍රධාන ශාලාවක පැවැත්වෙන ගුරු සාකච්ඡාවකි. මෙම අවස්ථාව මෙහෙයවනු ලබන්නේ විදුහල්පතිතුමා විසිනි. විදුහල්පතිතුමා බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය ආධාරයෙන් බිත්ති තිරය මත පරිගණක ඉදිරිපත් කිරීමක සකස් කළ එක් පුවරුවක් ප්‍රදර්ශනය කළේ ය.

*ආයුබෝවන් ! අද මෙම ගුරු සාකච්ඡාවට සහභාගී වන ඔබ සැම දෙනා සාදරයෙන් පිළිගන්නවා. මේ ගුරු සාකච්ඡාව කැඳවූයේ විශේෂ වැඩපිළිවෙළක් ගැන ඔබව දැනුවත් කරන්නටයි. බලන්න මේ තිරය දිහා.*

සඳුදා
***සිතුවම්කරණය***

අරමුණු
1. පාසල අලංකාර කිරීම සඳහා බිතු සිතුවම් නිර්මාණය
2. ජාතික හා ජාත්‍යන්තර චිත්‍ර තරග සඳහා සිසුන් යොමු කිරීම.

අඟහරුවාදා
***රංගනය***

අරමුණු
1. රංගන හැකියාව ඔපමට්ටම් කිරීම
2. කෙටි නාට්‍ය නිෂ්පාදනයට යොමු කිරීම
3. විදි නාට්‍ය මගින් කාලෝචිත ගැටලු පිළිබඳ ව සමාජය දැනුවත් කිරීම.

බදාදා
***කාව්‍යකරණය***

අරමුණු
1. ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතත අභ්‍යාසය යන ගුණාංග පෝෂණය කිරීම
2. කාව්‍යෝක්ති පිළිබඳව දැනුවත් කිරීම
3. සිසු හැකියා එළි දැක්වන නිර්මාණ සංග්‍රහයක් මුද්‍රණය කිරීම

බ්‍රහස්පතින්දා
***සන්නිවේදනය***

අරමුණු
1. සන්නිවේදනයේ සංකල්ප හඳුනා ගැනීම
2. සන්නිවේදන නිපුණතා ළඟා කර ගැනීමට සිසුන්ට උදවු වීම
3. පාසල් මාධ්‍ය ඒකකයක් පිහිටුවීම

සිකුරාදා
***සාහිත්‍යකරණය***

අරමුණු
1. කෙටි කතා හා කතන්දරය නිර්මාණයට මඟ පෙන්වීම
2. ලේඛන හැකියාවන් සංවර්ධනය කිරීම
3. කෙටිකතා සංග්‍රහයක් හා ළමා කතන්දර පොත් එළි දැක්වීම.

විදුහල්පතිතුමා බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය ආධාරයෙන් තිරය මත පරිගණක ඉදිරිපත් කිරීමක සකස් කළ පුවරුවක් ප්‍රදර්ශනය කළේ ය.

පාසලේ ඇරඹීමට බලාපොරොත්තු වන නව වැඩසටහනක් පිළිබඳ ව විදුහල්පතිතුමා පැහැදිලි කළේ මේ ආකාරයට යි.

*සතියේ දින පහේ ම ක්‍රියාත්මක වන මෙම වැඩපිළිවෙළ ගැන සිසුන් ව හොඳින් දැනුවත් කරන්න. දැන්වීම් පුවරුවට මේ දැන්වීම දාන්න. දැනුවත් කිරීමේ වගකීම පන්තිභාර ගුරුභවතා සතුයි. දිනපතා ප.ව 2.00 සිට ප.ව. 3.00 දක්වා කාලය මේ සඳහා යොදා ගන්න. එක් එක් විෂයයන් සඳහා දක්ෂ ගුරු භවතුන් අදාළ දිනයේ දී හවස නවතින්න වෙනවා. අවශ්‍ය නම් සම්පත් දායකත්වය ලබා ගන්න. මේ වැඩසටහනේ අරමුණු හා ඉලක්ක පිළිබඳ ව දැනුවත් කිරීමට ගුරු මණ්ඩලයේ සියලු දෙනාගේ ම සහයෝගය අත්‍යාවශ්‍යයි. අවශ්‍ය ලිපි ද්‍රව්‍ය පාසලට සුභ පතන්නන්ගෙන් හා පාසලේ සංවර්ධන සමිතියෙන් ලබා ගනිමු. ඒ ඒ දිනයේ දී සිදු කෙරෙන වැඩසටහන විෂයභාර ගුරු භවතුන් විසින් ම සැලසුම් කර ගනු ලබනවා නම් වඩාත් ගුණාත්මක වනු ඇති. මුලින් ම ව්‍යාපෘතිය ගැන දැනුවත් කර පුහුණුවීම් කරවන්න. අභ්‍යාස කරවන්න. පාසලේ දරුවන් ගැන හිතලා හැම දෙනා ම සතියට පැයක කාලයක් කැප කළොත් අපට සාර්ථක වෙන්න පුළුවන්. සිසුන්ට තමන් කැමති දවසක සවස මෙම වැඩසටහනට සම්බන්ධ වෙන්න පුළුවන්. ක්‍රියාකාරකම් කිහිපයකට කැමති සිසුන්ට දින කිහිපය ම උනත් සවසට පාසලේ රැඳෙන්න පුළුවන්. මම ඔබෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ ඒ සඳහා සහයෝගය දෙන ලෙසයි.*

විදුහල්පතිතුමා මෙම උපදෙස් ලබා දෙන ලද්දේ උක්ත ක්‍රියාකාරකම් අනිවාර්යයෙන් ම ගුරු මණ්ඩලය විසින් සිදු කළ යුතු බව හඟවමිනි. තරමක් නිලබලවාදී ලෙස කටයුතු කළ ද කිසිම විටක විදුහල්පතිතුමා වැරදි තීරණයක් නොගන්නා බවත්, තමන් ගන්නා තීරණය නිසා මතු විය හැකි ගැටලුවලට විසඳුම් ද කල්පනා කර ඇති බව ගුරු මණ්ඩලය තුළ විශ්වාසයක් තිබිණි.

සිසුන්ගේ විභව්‍යතා ඉස්මතු කර ගැනීම සඳහා ක්‍රියාවට නැංවූ මෙම වැඩසටහන සඳහා සිසුන්ගේ උද්යෝගය හා ප්‍රතිචාරය ඉහළ මට්ටමක පැවති නිසා දෙමවුපියන්ගේ ද සහය ඊට ලබා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා පංති මටටමින් එම දැනුවත් කිරීම් සිදු කෙරුණි.

නමුත් සවස උපකාරක පංති යන සිසුන් මෙම වැඩසටහනට සහභාගි කරවා ගැනීම අසීරු විය. එමෙන් ම බස් රථයේ ගමන් කරන සිසුන්ට සවස පාසලේ ගත කිරීම කළ නොහැක්කක් වූයේ පස්වරු 2.00ට යන බසයේ ගමන් නොකළ හොත් නැවත පස්වරු 4.30 වන තෙක් ඔවුන්ට යාමට බස් රථයක් නොමැති වීම නිසා යි.

යහපත් ව්‍යවහාරයක් ක්‍රියාත්මක කිරීමේ දී මතු වී ඇති මෙවැනි ගැටලුවක් සඳහා ඔබ නිර්දේශ කරන විසඳුම කුමක්ද?



# 17. ඉපැයූ තිළිණ

පිටිසර බද ඇති පාසල
දුප්පත් මේ සිසු දරු කැල
ඒ නිසා ම හැම විටක ම
එල්ල වුණේ නොසැලකිල්ල

දරුවන් හරි අපිරිසිදු ය
පාසල් බිම අපිරිසිදු ය
අපිළිවෙළට තිබුණු නිසා
හෙළුවේ හැම පහත් ඇස ය

පිළිවෙළකට ගොඩ නගන්න
ඕනෑ වුණා හැමට ඔන්න
විදුහල්පතිතුමා ඇවිත්
හිතුවා හැම කැඳව ගන්න

දුප්පත් පාසලට ඔන්න
හොඳ ම නමක් දිනා ගන්න
ඕනෑ නම් ඔබ සැම හට
සියලු දෙනා එකතු වෙන්න

විදුහල්පතිගේ ඇරයුම
පිළි අරගෙන හැම දෙනා ම
හැදුවා සැලසුම් ගොන්නක්
හැමෝ ම එක හිත ඇතිව ම

නීති රීති පැනවුවා
සිසු චර්යා ගැන හිතුවා
ගුරුවරුන්ගේ කාරිය හැම
නොපිරි හෙළා ඉටු කෙරුවා

පාසලෙ හැම පන්තියට ම
සම ලකුණක් දෙයි මුලින් ම
දහසක් වූ මුළු ලකුණින්
ඔබේ ලකුණු බේර ගන්න

හොඳ වැඩකට ලකුණු පහක්
එකතු කළා සිසුට උසස්
කරන කරන පහත් වැඩට
අඩු කෙරුවා ලකුණු පහක්

වැඩි ලකුණින් පිදුම් ලබන
ඔවුනට බුහුමන් කරමින
තිළිණ දෙන්න පිළිවෙළකුත්
සකස් වුණා හනික ඔන්න

ගම්මානෙන් සොයා ගන්න
බවබෝගත් ගෙන්න ගත්ත
මහ ලොකුවට සති පොළකුත්
පැවැත්වූවා සතියෙ අන්ත

හැම පොළෙන් ම කැට පිරුණා
හැම හිතක ම තුටු පිරුණා
පුංචි දෑස්වල දිදුලන
සතුටු කඳුළු කැට හැළුණා.

උපයා ගත් හැම සතය ම
දරුවන්ගේ යහපතට ම
විය යුතු බව සිතුව නිසා
යෙදුව ඔන්න තෑගිවලට

ඉහළ ලකුණු සරි කර ගත්
සියලු දෙනා පෙරටුව ගත්
තෑගි උළෙල ජය සරුවට
පැවැත්වුණා සැම සිත්ගත්

පාට පාට මල් පිපිච්චි
නිලට නිලේ වැට පිරිච්චි
පුංචි පුංචි සිසු දෑතින්
පාසල් බිම සොඳුරු වෙච්චි

දරුවන්ගේ සිරිත් විරිත්
දිනෙන් දින ම පෙරට ඇවිත්
දිදුලන පාසල් නාමෙට
සියලුම ගරු නම්බු ඇවිත්

දරුවන්ගේ දිරි වැඩුමට
කළ හැකි දේ ඇත එමට ම
කල් නොදමා කළහොත් හෙම
දිනනව සත්තයි අප හැම

(කෑගල්ල කලාපයේ කලුගල කනිෂ්ඨ විද්‍යාලය, මොනරාගල කලාපයේ හිදිකිවුල කනිෂ්ඨ විද්‍යාලය යන පාසල් විසින් ක්‍රියාත්මක කරන ලද ළමුන්ගේ චර්යා හැඩ ගැස්වීම හා සාරධර්ම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යවහාර ඇසුරිනි)

# 18. සැඟවුණු දක්ෂයා තේරීම

10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ලතිකා අධ්‍යාපන කටයුතුවල දී තරමක් පසුගාමී ශිෂ්‍යාවක බව අංශයේ ගුරුවරුන් බොහෝ දෙනෙකුගේ අදහස යි. ප්‍රධාන විෂයයන්ගෙන් ඇය බොහෝ විට ලැබුවේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් බැවින් ඇය වසර ගණනාවක පටන් සැලකුණේ ´වැඩ බැරි´ සිසුවියක ලෙසිනි. කුඩා කල සිට ම තරමක් තරබාරු සිරුරකින් හෙබි ඇය සෞන්දර්ය විෂයයක් ලෙස නර්තනය හැදැරුව ද එයින් තම හැකියා ඉස්මතු කරන්නට අවකාශ නොලැබුණි.

එහෙත් ඇ පාසලේ අනෙකුත් කටයුතුවල දී බොහෝ සහයෝගී ශිෂ්‍යාවක ලෙස සිසුවියන් හා ගුරුවරුන් විසින් හඳුනාගනු ලැබුවා ය. සම වයසේ සිසුවියන් සමඟ මෙන් ම තමාට වඩා වැඩිමහල් හා බාල සිසුවියන් සමඟ ද ඉතා හොඳ මිතුරු සබඳතා පවත්වා ගැනීමට ඇ දක්ෂ වූවා ය.

...............〰...............

නන්දා ජයසේන මහත්මිය සිසුවියන් 1800ක් පමණ අධ්‍යාපනය ලබන 6-13 ශ්‍රේණි පැවැත්වෙන බාලිකා පාසලක නියෝජ්‍ය විදුහල්පතිනිය යි. පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් භාර ව කටයුතු කළේ ජයසේන මහත්මිය යි. පාසලක විධිමත් විෂයමාලාව තුළ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයට නොදෙවැනි වටිනාකමක් විෂය සමගාමී වැඩසටහන් කෙරෙහි ද පවතින බව ඇ තදින් විශ්වාස කළා ය. සිසුවියන් සියලු දෙනා විභාග ලකුණු ඉලක්ක කරගනිමින් සැහැල්ලු නොවන ගමනක යෙදෙමින් සිටින බැවින් ඔවුන්ගේ විවිධ හැකියා සහ ශක්‍යතා මොට වී යෑම රටේ අභාග්‍යයක් ලෙස සැලකූ නියෝජ්‍ය විදුහල්පතිනිය ශිෂ්‍ය හැකියා උරගා බැලෙන අපූරු වැඩසටහනක් සැලසුම් කළා ය. සිසුවියන්ගේ සැඟවී ඇති සුවිශේෂී දක්ෂතා හඳුනාගෙන එමගින් ඔවුන්ට ගැළපෙන රැකියා ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම මෙම කාර්යයේ තවත් අරමුණක් විය.

ඒ අනුව හඳුනාගත් විෂය සමගාමී ක්ෂේත්‍ර 20ක් ආවරණය වන පරිදි එම ක්‍රියාකාරකම් හා සබැඳි තරගාවලියක් පාසල තුළ සංවිධානය කිරීමට විදුහල්පතිනිය ප්‍රමුඛ පාසල් සංවර්ධන සමිතිය තම සහාය ලබා දුන්නේ ය.

තරග ඉසව්

| | |
|---|---|
| 1. චිත්‍ර ඇඳීම | 11. රූපලාවන්‍ය |
| 2. නර්තනය | 12. සූප ශාස්ත්‍ර |
| 3. වාදනය | 13. මැහුම් / ගෙතුම් |
| 4. ගායනය | 14. පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණය |
| 5. අත්කම් නිර්මාණ හා මූර්ති | 15. විද්‍යාත්මක නිර්මාණ |
| 6. නිවේදන - සිංහල | 16. බුද්ධි පරීක්ෂණ හා අභියෝගාත්මක ක්‍රීඩා |
| 7. නිවේදන - ඉංග්‍රීසි | 17. දැනුම මිනුම |
| 8. නිර්මාණාත්මක ලිවීම | 18. රංගනය |
| 9. පද්‍ය රචනා (සඳැස් / නිසඳැස්) | 19. ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම |
| 10. කථික | 20. Multimedia Presentations |

පාසලේ සියලු ම සිසුවියන් කුමන හෝ තරගයකට සහභාගී වීම අනිවාර්ය කර තිබුණු අතර එක් සිසුවියකට උපරිම වශයෙන් තරග ඉසව් දෙකකට සහභාගි විය හැකි ලෙස කොන්දේසි සකසා තිබිණ.

දින තුනක් පුරා පැවති මෙම වැඩසටහන සඳහා පාසලේ ගුරුවරුන්ට අමතර ව යාබද පාසල්වල ගුරුවරුන් ද සහභාගි කර ගනු ලැබිණි. ගුරු මණ්ඩලයේ, සිසුන්ගේ හා දෙමවුපියන් ඇතුළු පාසල් ප්‍රජාවගේ විශාල කැපවීමක ප්‍රතිඵලයක් ලෙස මෙම වැඩසටහන පාසල් පරිශ්‍රය තුළ ස්ථාන කිහිපයක දිග හැරුණි.



මෙම පාසලේ ම ශිෂ්‍යාවක් වූ ලතිකා හට ද තරග කිරීම සඳහා යම් ඉසව්වක් තෝරා ගැනීමට සිදු විය. ඇය විසින් තෝරා ගනු ලැබුවේ රංගනය යි. තරගය සඳහා ඇය ඉදිරිපත් කළේ අභිරූපන රංගනයකි. බොහෝ තරඟකාරියන් ඊට ඉදිරිපත් වී සිටිය ද ඇයගේ රංගන ප්‍රතිභාව එම ඉසව්වේ ප්‍රථම ස්ථානයට ඇය ඔසවා තැබී ය. එවැනි දක්ෂ රංගනයක් පාසලේ සිසුවියන් හෝ ගුරුවරුන් කිසිසේත් ලතිකාගෙන් අපේක්ෂා කළේ නැත.

මෙම සටහන තැබුණේ ලතිකා ගැන පමණක් වුව ද, මෙම වැඩසටහන නිසා සැඟවුණු දක්ෂතා ඇති ලතිකා වැනි සිසුවියන් කිහිප දෙනෙක් ඉස්මතු වීම ගැන විදුහල්පතිතුමිය බොහෝ සතුටට පත් වූවා ය. වැඩසටහන අවසානයේ පසු විපරමක යෙදුණු පාසල් කළමනාකරණ මණ්ඩලය වැදගත් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළේ ය. එම නිර්දේශ අතර පාසලේ මෙතෙක් ආරම්භ නොවුණු සෞන්දර්ය විෂයයක් වූ ´නාට්‍ය හා රංගකලාව´ හැකි ඉක්මනින් පාසල තුළ ආරම්භ කිරීම හා සිසුන් අඩු ප්‍රමාණයක් අධ්‍යයනය කරන ගෘහ ආර්ථික විද්‍යා විෂය පාසල තුළ ජනප්‍රිය කිරීම ප්‍රධාන විය.

(හලාවත අධ්‍යාපන කලාපයේ කිරිමැටියාන බෞද්ධ බාලිකා මහා විද්‍යාලයේ යහපත් ව්‍යවහාරයක් ඇසුරිනි.)

# 19. විශ්ව දැනුම් කරත්තය

නූතන තාක්ෂණයේ දියුණුවත් සමඟ ඊට සමගාමී ව සිදු වන දැනුම ප්‍රසාරණය වීම පාසල් අධ්‍යාපන පද්ධතිය තුළට අවශෝෂණය කර ගැනීමේ දී තාක්ෂණ මෙවලම් ප්‍රබල දායකත්වයක් ලබා දේ. එහෙත් පාසල් පද්ධතිය තුළ නවීන තාක්ෂණය මුසුකරගත් දැනුම ශිෂ්‍ය ප්‍රජාවට ලබා දීමේ දී පාසල්වල පවතින සම්පත් හිඟය ප්‍රධාන බාධාවක් වී ඇත. මෙම බාධකය මඟහරවා ගනිමින් නූතන සන්නිවේදන තාක්ෂණය භාවිතයේ නව දැනුම පන්ති කාමර වෙත රැගෙන යාමට ගත් අපූරු ප්‍රයත්නයක් ලෙස මෙම විශ්ව දැනුම් කරත්තය (Global Knowledge Cart) ව්‍යාපෘතිය පාසලක් විසින් හඳුන්වා දී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික වූ හේතු සාධක කිහිපයකි.

- පාසල තුළ ඇති සීමිත වූ පරිගණක පහසුකම්වලින් සමන්විත කුඩා කාමරය සිසුන්ගේ සියලු තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නොවීම.
- පාසල සතු රූපවාහිනී යන්ත්‍ර ස්ථාපනය කර ඇත්තේ පුස්තකාලය තුළ වීම. එම ස්ථානයේ ඉඩ පහසුකම් සීමාසහිත වීම.
- ගුරුවරුන් නොපැමිණි අවස්ථාවලදී පන්ති මට්ටමින් විෂය කටයුතු ආවරණය සඳහා විධිමත් හා සංවිධානාත්මක වැඩපිළිවෙළක අවශ්‍යතාව මතුව තිබීම.
- පාසල තුළ ඇති අධ්‍යාපනික මෘදුකාංග, CD තැටි හා වෙනත් අධ්‍යාපනික මෙවලම් නිසි පරිදි භාවිතයට අවශ්‍ය අවස්ථා අඩු වීම

“ විශ්ව දැනුම් කරත්තය’’ ඉහත අවශ්‍යතා සඳහා පාසල් මට්ටමෙන් ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයන් ලෙස ආරම්භ කරන ලදී. පාසලේ ඇති ඉවත් කරන ලද වානේ කැබිනෙට්ටුවක් ගෙන එය ඉහළ කොටසේ පරිගණකයක් ස්ථාපනය කරන ලදී. මෙම පරිගණකය ද විද්‍යාලයේ පරිගණක ඒකකයේ භාවිතයට නොගෙන ඉවත් කර තිබූ පරිගණකයකි. එය ප්‍රතිසංස්කරණය කර අදාළ කාර්යය සඳහා යොදා ගන්නා ලදී. වානේ කැබිනෙට්ටුවේ පහළ කොටස අධ්‍යාපනික මෘදුකාංග තැබීම සඳහා වෙන් කරන ලද අතර එම කැබිනෙට්ටුවට රෝද සවිකර පන්ති කාමර කරා තල්ලු කරගෙන යාමට හැකි වන සේ සකස් කරන ලදී. පාසලේ පිහිටීම හා ගොඩනැගිලි අතර කොරිඩෝව උපයෝගී කර ගනිමින් මෙම කරත්තය පන්ති කාමර වෙත රැගෙන යාමට හැකි වේ. එහි දී අදාළ සංයුක්ත තැටි පරිගණකය හරහා ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කර ඇත. ඊට අමතර ව මෙම ඒකකය හරහා අන්තර්ජාලයට ප්‍රවේශ වීමේ පහසුකම් සලසා ඇති අතර එමඟින් තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාව සිසුන්ට ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය පන්ති කාමරය තුළට පහසුවෙන් රැගෙන යාමට අවශ්‍ය ප්‍රායෝගික හා සරල ව්‍යවහාරයන් නිර්මාණය කර ගැනීමට මෙම බාලිකා විද්‍යාලය සමත් වී ඇත. මෙම උපකරණය සහන කාලච්ඡේදවලට පන්තිවලට රැගෙන යනු ලබන අතර ගුරුවරුන් නොමැති අවස්ථාවල දී සාර්ථක ව භාවිත කළ හැකි මෙවලමක් බවට පත්ව ඇත.

**මෙම ව්‍යවහාරය ක්‍රියාත්මක කිරීම මගින් පාසල අත්පත් කරගත් ප්‍රතිලාභ රැසකි.**

- සහන කාලච්ඡේද මනා ලෙස කළමනාකරණය කළ හැකි වීම
- තොරතුරු තාක්ෂණයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව සිසුන් තුළ අවබෝධය පුළුල් වීම
- අධ්‍යාපනික මෘදුකාංග හා සංයුක්ත තැටි පන්ති කාමර තුළ ප්‍රායෝගික භාවිතය
- අන්තර්ජාල පහසුකම් සෘජුව ම පන්ති කාමර වෙත යොමු කළ හැකි වීම
- පරිගණක ඒකකය, පුස්තකාලය වැනි ස්ථානවල පවතින අධික තදබදය අවම කළ හැකි වීම
- පාසලේ දෛනික කළමනාකරණ කටයුතු සඳහා මහඟු පිටුවහලක් ලැබීම

(සංකල්පය - ගාල්ල කලාපයේ ජනාධිපති බාලිකා විද්‍යාලය, වලහන්දූව)

# 20. පාසලේ උපන් වන සතුන්

පාසලේ උදෑසන රැස්වීම ආරම්භ විය. විදුහල්පතිතුමාගේ කතාව අවධාරණය කළේ මහත් ගැටලුවක් වී ඇති පොලිතීන් භාවිතය පාසල් පරිශ්‍රය තුළින් සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව යි. මීට පෙර අවස්ථා ගණනාවක දී ම පාසල් පරිශ්‍රයේ පොලිතීන්, ප්ලාස්ටික් වර්ග ආදී නොදිරන ද්‍රව්‍ය අවම කිරීම සඳහා විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති හඳුන්වා දුන්න ද ඒවා පැවතියේ ටික කලකි. මේ බව ද විදුහල්පතිතුමා මතක් කරමින් ගුරු මණ්ඩලයෙන් හා සිසුන්ගෙන් ඉල්ලා සිටියේ හැකි ඉක්මනින් පාසල් බිමෙන් පොලිතීන් ඉවත් කිරීමේ හා පොලිතීන් භාවිතය වැළැක්වීමේ නිර්මාණශීලී විසඳුමක් සොයා ගන්නා ලෙස යි.

දින කිහිපයකින් විදුහල්පති හමුවට පැමිණි චිත්‍ර ගුරුවරයා තමාගේ යෝජනාව ඉදිරිපත් කළේ ය.

**"සර්, අපි පොලිතීන් අවම කිරීම වෙනුවට පොලිතීන්, ප්ලාස්ටික් වැඩදායි විදියට පාවිච්චි කරල අලුත් දෙයක් කරමු"**

"බොහොම හොඳයි. මොකක්ද ඒ අලුත් දේ ? "

"අපි චිත්‍ර කලාවේ දී, ඉවත් කරන දේ පාවිච්චි කරල අලුත් දෙයක් නිර්මාණය කරන්නත් දරුවන්ට උගන්වනවා. මේ ක්‍රමයට කියන්නෙ 'ඔරිගමි' කියලා. අපි ඒ විකල්පය පාවිච්චි කරමු. අපි පොලිතීන්, ප්ලාස්ටික් වගේ දිරන්නෙ නැති දේවල් එකතු කරලා ත්‍රිමාණ රූප හදමු."

"ෂා.... ඒක නම් හොඳ අදහස. එහෙනම් අපි සතුන්ගෙ රූප හදමු. ඒක ළමයින්ටත් අලුත් අත්දැකීමක් වෙයි."

සාකච්ඡාව තුළ ගත් තීරණය ඉතා ඉක්මනින් ක්‍රියාවට නැංවුණි. සිසුන් යොදවා පාසල් භූමිය ඇතුලු ස්ථානවල ඇති පොලිතීන් වර්ග එක් ස්ථානයකට එකතු කරන්නට විය. පාසල් බිම පිරිසිදු විය. එකතුවන පොලිතීන් වැනි නොදිරණ අපද්‍රව්‍ය භාවිතයෙන් සිංහයා, වලහා, ඉබ්බා වැනි සතුන් මුලින් ම නිර්මාණය වූයේ චිත්‍ර ගුරුවරයා අතිනි. කම්බි භාවිතයෙන් නිර්මාණය කරගත් සත්ව ආකෘති තුළ රැස්කර ගත් නොදිරණ අපද්‍රව්‍ය තැම්පත් කිරීම, කඩදාසි හා පාප්ප යොදාගනිමින් ආකෘතිය වැසී යන පරිදි පිටතින් ආවරණ පල්පය තැවරීම, වේලුණු ආකෘතිය අවශ්‍ය පරිදි හැඩතළ හා වර්ණ ගැන්වීම යන පියවර සිසුන්ට පැහැදිලි කරමින් එම ආකෘති සකස් කෙරිණ.

චිත්‍ර ගුරුවරයාගේ මඟ පෙන්වීම යටතේ සිසුන් අතින් ආකෘති නිමැවුණි. මේ සඳහා බොහෝ විට යොදා ගැනුනේ පාසල් කාලයෙන් පසු වේලාව යි. මෙම කටයුත්තෙහි නියැලීම සිසුන්ට මහත් විනෝදයක් වූ බැවින් පාසල අවට දරුවෝ තම විවේක කාලය තුළ ද පාසලට පැමිණ නිර්මාණ සැකසීමෙහි නිරත වූහ. අලුතෙන් සකස් කළ යුතු ආකෘති ගැන ඔවුනට නව අදහස් පහළ වූයේ නිරායාසයෙනි.

වැඩිකල් නොගොස් ම ප්‍රදර්ශනාත්මක සතුන් වත්තකට අවැසි සත්ව රූප රාශියක් නිර්මාණය විය. කොළඹින් කිලෝ මීටර් 300කට වැඩි දුරක පිහිටි පාසලක සිසුන්ට දෙහිවල සත්වෝද්‍යානයට නැවිත් සතුන් වත්තක් නැරඹීමේ අත්දැකීම ලබා කරවන්නට පාසලට හැකි වූයේ එලෙසිනි.

වැඩි වැඩියෙන් ආකෘති නිර්මාණය කිරීමට පෙළඹීමත් සමඟ ම ඔවුන්ට අවශ්‍ය පොලිතීන් පාසල් භූමිය තුළ හිඟ විය. මේ නිසා ම සිසුහු තම නිවෙස්වලින් බැහැර කෙරෙන නොදිරණ අපද්‍රව්‍ය පාසලේ නිර්මාණ සඳහා යොදා ගත්හ. එබැවින් නිවෙස්වල නොදිරණ ද්‍රව්‍ය වෙන්කර ගෙන ඒවා පරිසරයට හානි නොවන පරිදි භාවිතයට ගැනීමට හුරු වූ සංස්කෘතියක් ගොඩනැගුනි.

එවැනි ප්‍රතිලාභ රාශියක් මෙම ව්‍යාපෘතිය ඔස්සේ පාසලට හා එහි ප්‍රජාවට සැලසුණි.

- ගුරු, සිසු, දෙමාපිය හා ප්‍රදේශවාසීන් තුළ පාසල පිළිබඳ අභිමානයක්, ආදරයක් ඇතිවීම
- ගුරු, සිසු නිර්මාණාත්මක චින්තනය වර්ධනය වීම
- පාසල නොදිරණ කැළි කසළවලින් තොරවීම
- අපතේ යන ද්‍රව්‍ය භාවිතයට ගත හැකි බව අවබෝධ වීම
- විවේකය ඵලදායී ලෙස ගත කිරීම
- ප්‍රිය මනාප පාසල් පරිසරයෙන් සියලු දෙනාට ම මානසික තෘප්තියක් ලැබීම
- පරිසර හිතකාමී දරුවන් සමාජයට දායාද කිරීම

යන ප්‍රතිලාභ පාසලට අත් විය.

මේ වන විට මෙම පාසලේ පොලිතීන් අපද්‍රව්‍ය යොදා කෘත්‍රිම ලෙස සිටුවා ඇති සත්ව රූප අමුත්තෙකුට වන සතුන් ගැවසෙන කැලයක ගමන් කරන සෙයක් දැනෙන්නේ නිරායාසයෙනි. මෙම විශේෂ කාරණය නිසා ම පාසල දිවයිනේ ප්‍රචලිත පාසලක් වී ඇති අතර පාසල නැරඹීම සඳහා විවිධ පාසල්වල ගුරු, සිසු පිරිස් පැමිණෙමින් සිටිති.

ගැටලුවකට විසඳුමක් සෙවීමේ දී අප සාම්ප්‍රදායික ව සිතන චපසරියෙන් එහා චින්තනය මෙහෙයවීම තුළින් වඩාත් ගුණාත්මක විසඳුමක් මෙන් ම වැඩි පිරිසකට සෑහීමට පත් විය හැකි ප්‍රතිඵල රාශියක් ලැබිය හැකි බව මේ විශිෂ්ට ව්‍යවහාරයෙන් පැහැදිලි වේ.

(මොනරාගල කලාපයට අයත් සරසවතී දෙමළ කනිෂ්ඨ විද්‍යාලය තුළ ක්‍රියාත්මක ව්‍යවහාරයකි.)

# 21. යහ පුරුදු දින 365

පාසල ආරම්භ වීමෙන් පසු පන්ති භාර ගුරුතුමිය පන්තියට පැමිණෙයි. ඈ පන්තියේ දරුවන්ට ගණනක් හදන්නට නියම කරයි. සෑම දරුවෙක් ම පොතෙහි ගණන ලියා ගනී.

ගුරුතුමිය -

- හැමදෙනා ම 6 ඉලක්කම ලියන්න.
- 6 ඉලක්කම 200න් වැඩි කරන්න.
- දැන් කීයද?
- හරි, 1200 යි.
- දැන් 1200 ඉලක්කම 11න් වැඩි කරන්න.
- හරි, 13200 යි.
- දැන් 13200 ඉලක්කම 24 න් බෙදන්න.
- හරි, 550 යි.
- දැන් 550 ඉලක්කම 365 න් බෙදන්න.
- හරි, ආසන්න සංඛ්‍යාව 1.5 යි. නැත්නම් 1 ½යි.

මොකක්ද මේ ගණන?

ගුරුතුමිය විස්තර කරයි. මුළු පන්තියේ ම දරුවෝ කුතුහලයෙන් බලා සිටිති.

ගුරුතුමිය -

- මේ 6 ඉලක්කමෙන් කියැවෙන්නේ අපි දවසකට පාසලේ සිටින පැය ගණන යි.
- 200න් කියැවෙන්නේ වසරකට පාසල පවත්වන දින ගණන යි.
- 1200 න් කියැවෙන්නේ වසරකට අප පාසලේ සිටින පැය ගණන යි.
- 13200 න් කියැවෙන්නේ අපි 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසලේ සිටින පැය ගණන යි.
- 550 න් කියැවෙන්නේ වසර 11 ක් පුරා අපි පාසලේ සිටින දින ගණන යි.
- ඒ කියන්නේ වසර 11 ක දී අප පාසලේ ගත කරන්නේ වසර 1 ½ යි.
- 11 ශ්‍රේණිය අවසන් වන විට ඔබ වසර දහසයක දරුවෙක්.
- ඒ වසර 16 න් ඔබ අප ළඟ රැඳෙන්නේ වසර 1 ½ යි.
- ඉතිරි වසර 14 ½ ම ඔබ රැඳෙන්නේ නිවස හා සාමාජයේ යි.

"අප වසර හැත්තෑවක් ජීවත් වෙනවා නම් ඒ අවුරුදු හැත්තෑව ම යහපත් මිනිසකු ලෙස සමාජයට මෙහෙවරක් කරන්නට නම් හොඳ පුරුදු ඇති කර ගන්නට අපට ඇති පාසල් කාලය අවුරුදු එකහමාරක කාලයක්. අප පාසල් කාලය තුළ දී යහපත් ගුණධර්ම පුරුදු පුහුණු වුවහොත් යහපත් දරුවකු ලෙස සමාජයට පිවිසෙන්න පුළුවන්" මේ ගුරුතුමියගේ පැහැදිලි කිරීම යි.

ග්‍රාමීය පාසලක් වන කළුගල විද්‍යාලයේ දරුවන්ගේ පවුල් පරිසරය පහළ මට්ටමක පවතී. දෙමාපියෝ ද එතරම් ඉහළ අධ්‍යාපනයක් ලැබූ අය නොවෙති. වැඩි ප්‍රමාණයක් ඇත්තේ ගැටලු සහිත පවුල් ය. බිඳුණු පවුල් ය. ඇතැම් පවුල් මත්පැන් පානය හේතු කොට ගෙන සමාජ ප්‍රශ්නවලට මුහුණ දී සිටිති. රූපවාහිනියට ඇබ්බැහි වූ පවුල් ද ඇත. දරුවන් වැඩිපුර කාලයක් ගත කරන්නේ නිවෙස්වල ය. දරුවන්ට හොඳ පුරුදු කියා දීමට නිවෙස්වලින් අවධානයක් නොමැත. මේ ගැටලුවලට විසඳුමක් සෙවීම හා අහිතකර වටපිටාවක කල් ගෙවන දරුවන් තුළ යහ පුරුදු හා ආකල්ප ගොඩනැංවීම අරමුණු කර ගනිමින් පාසල විසින් 'යහ පුරුදු දින 365' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙහි මුල් ම පියවර ලෙස සෑම සිසුවෙකුගේ නිවසකට ම පිළිවෙත් 15ක් හඳුන්වා දී, එම පිළිවෙත් දින 365 එනම් වසර තුළ ක්‍රියාවට නැංවීමට පුරුදු කිරීමට පියවර ගන්නා ලදී.

<u>මාසික ඇගයීම් පත්‍රිකාව</u>

| | **හොඳ පුරුදු (දර්ශක)** | දිනය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | | | | |
| **1** | අවදි වී ඇඳ සකස් කිරීම | | | | | | | | | | | | | |
| **2** | උදේ හා රාත්‍රි දෙමාපියන්ට වැඳීම | | | | | | | | | | | | | |
| **3** | දෙමාපියන්ට හා වැඩිහිටියන්ට උදවු වීම | | | | | | | | | | | | | |
| **4** | පරිහරණය කරන දේවල් පිරිසුදුව හා පිළිවෙළට තබාගැනීම | | | | | | | | | | | | | |
| **5** | රාත්‍රියට දත් මැදීම | | | | | | | | | | | | | |
| **6** | දිනපතා බුදුන් වැඳීම | | | | | | | | | | | | | |
| **7** | දිනපතා පොතට පතට වැඳ පාඩම් කිරීම | | | | | | | | | | | | | |
| **8** | නිවසේ හා පිටත භූමිය පිරිසිදුව තබා ගැනීම | | | | | | | | | | | | | |
| **9** | යහළුවන් හා සමගියෙන් සෙල්ලම් කිරීම | | | | | | | | | | | | | |
| **10** | සතියකට වරක් පොතක් කියවීම | | | | | | | | | | | | | |
| **11** | සතියකට වරක් පන්සල් යාම | | | | | | | | | | | | | |
| **12** | ඉවත ලන ද්‍රව්‍ය ඒ සඳහා සුදුසු ස්ථානවල දැමීම | | | | | | | | | | | | | |
| **13** | තමන්ගේ රෙදි සෝදා ගැනීම | | | | | | | | | | | | | |
| **14** | ආහාර ගැනීමේ දී සංවරබව | | | | | | | | | | | | | |
| **15** | පවුලේ සැවොම එක්ව නිවසේ සමගියෙන් ගත කිරීම | | | | | | | | | | | | | |

මෙම පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට දෙමවුපියන්ට උපදෙස් දුන් අතර ඒ අනුව ක්‍රියාකරන්නේ ද යන්න සොයා බැලීමක් ද පාසල විසින් ම සිදු කරන ලදී. උක්ත පුරුදු 15 ඇතුළත් තොරතුරු ඇගයීමේ පත්‍රිකාවක් ද නිවෙස්වලට ලබා දී එම පත්‍රිකාවේ දර්ශක සඳහා 0, 1, 2 යන ලකුණු පරිමාණය පදනම් ව ඇගයීම සඳහා දෙමවුපියන්ට භාර කරන ලදී. අහඹු ලෙස නිවෙස්වලට දුරකථන ඇමතුම් ලබා දෙමින් මෙම කාර්ය පිළිබඳව සිසුන්ගෙන් විමසා සිටීමට ද පියවර ගැනුණි.

ඇගයීමේ දී සෑම දර්ශකයක් ම දිනපතා ඇගයීමට ලක් විය යුතු අතර ලබා දෙන ලකුණ අදාළ දිනයේ තීරුවේ දර්ශකය ඉදිරියෙන් සටහන් කළ යුතු වේ.

මෙම ඇගයීම සිසුන්ට පමණක් සිදු කරන්නක් වුවත් මෙම පුරුදු 15 අනුගමනය කරන්නට දෙමවුපියන්ට ද සිදු වූයේ තම දරුවන් ඉදිරියේ ආදර්ශවත් ලෙස හැසිරිය යුතු වූ බැවිනි. මෙහි ප්‍රතිලාභ පාසලට හිමි විය. හවසට කිසිම දිනෙක මල් පූජා නොකළ පවුල් පවා මල් පූජා කළහ. බීමත් ව නිවසට එන පියවරුන් එයින් මුදවා ගන්නට හැකි විය. එකට හිඳ කිසිදිනක ආහාර නොගත් පවුල් එක්ව ආහාර ගන්නා ලදී. ගුරු මණ්ඩලයේ සියලු දෙනා ද උද්යෝගයෙන් මෙයට සහභාගි වූහ. මෙය පාසල හා දෙමාපියන් අතර පමණක් නොව ගමේ කඩපිලේ පවා කතාබහට ලක් වූ වැඩසටහනක් විය.



(කෑගල්ල අධ්‍යාපන කලාපයේ කළුගල කනිෂ්ඨ විද්‍යාලය ක්‍රියාවට නංවා ඇති යහපත් ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 22. විශ්වයට ගමනක්

***පළමු වරට පාසලක ග්‍රහලෝකාගාරයක්***

**පාසලක ඇති එක ම අභ්‍යාවකාශ නිරීක්ෂණ මධ්‍යස්ථානය**

**තාරකා විද්‍යා ගවේෂණ උනන්දු කරවන පාසල් පුහුණු මධ්‍යස්ථානය**

ඉහතින් දැක්වෙන්නේ 2014 හා 2015 වර්ෂයන්හි සිට කෑගල්ල ශාන්ත මරියා ජාතික පාසලෙහි පවත්වාගෙන යන සුවිශේෂී කර්තව්‍යන් පුවත්පත් හා සඟරාවල පළවුණු ආකාරය දැක්වෙන පුවත් වැකි කිහිපයකි.

දැනට ලංකාවේ පවතින පැරණිතම දුරදක්නයක් ලෙස සැලකෙන “Broadherst Cearkson” වර්ගයේ දුරදක්නයක් මෙම පාසලේ ආරක්ෂිත ලෙස තබා ගනිමින් ඉන් විපුල පල නෙළා ගන්නට පාසලේ ගුරුවරුන් හා සිසුන් ගන්නා උත්සාහය ප්‍රශංසනීය වේ.

පාසලට සම්පතක් වූ මෙම දූරේක්ෂය අලුත්වැඩියා කර භාවිතයට ගනිමින් එමඟින් ලැබෙන රූප පරිගණක තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කොට එක වර සිසුන් විශාල සංඛ්‍යාවකට උපයෝගී කරගත හැකි වන පරිදි මේ වන විට පහසුකම් සකසා ගෙන තිබේ.


බොහෝ පාසල්වල තාරකා විද්‍යා සංගම් පිහිටුවාගෙන තිබුණ ද ගුරුවරුන් හා පාසල් සිසුන් පුහුණු කිරීමට හැකියාව ඇති ශ්‍රී ලංකාවේ එක ම පාසල් තාරකා විද්‍යා පුහුණු මධ්‍යස්ථානයට ද උරුමකම් කියන්නේ කෑගල්ල ශාන්ත මේරි ජාතික පාසලයි.

මෙම තාරකා විද්‍යා පුහුණු මධ්‍යස්ථානය අහස නිරීක්ෂණාගාරයකින් සමන්විත වන අතර එය උපයෝගි කොට ගනිමින් මූලික තාරකා විද්‍යා පුහුණු පාඨමාලාවක් සකස් කර තිබේ. තාරකා විද්‍යාවේ මූලික සංකල්ප පැහැදිලි කිරීම මෙම වැඩසටහනට අයත් වේ.

මේ වනවිට පාසල මඟින් කෑගල්ල අධ්‍යාපන කලාපයේ 6 - 11 ශ්‍රේණිවල පාසල් සිසුන් 1500ක් පමණ පුහුණු කර ඇති අතර කෑගල්ල කලාපයේ පාසල්වල 9 ශ්‍රේණියේ සිසුන් සඳහා විෂය නිර්දේශයට අනුකූල ව සකස් කරන ලද පුහුණු පාඨමාලාව, ගුරු පුහුණු පාඨමාලාව, උසස් පෙළ සිසුන් සඳහා රාත්‍රී අහස නිරීක්ෂණය ඇතුළු තාරකා විද්‍යා වැඩමුළු සිදු වෙමින් පවතී.

මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යනාංශය, ජාතික විද්‍යා පදනම, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමට ඉදිරිපත් ව සිටී.

පාසල් කාලපරිච්ඡේදවලින් නිදහස් වේලාවන්හි දී විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස තාරකා විද්‍යාව පිළිබඳ දේශන හා ක්‍රියාකාරකම් කිරීම සඳහා 2014 දී ආරම්භ කළ මෙම පුහුණු ඒකකය මේ වන විට කෑගල්ල අධ්‍යාපන කලාපයේ පමණක් නොව සබරගමුව පළාත තුළත් අවට පළාත්වලත් පාසල් සිසුන් හට අභ්‍යාවකාශය, තාරකා විද්‍යාව පිළිබඳ දැනුම සපයන මහා පුස්තකයක් බවට පත්ව ඇත. 2014 දී ඇරඹි මෙම පුහුණු වැඩසටහන 2015 වසරේ දී පමණක් පාසල් 90ක සිසුන් පුහුණු කිරීමට සමත් වී තිබීම විශ්මිත ය.



මෙම පුහුණු කිරීම් සඳහා පාසල් විද්‍යා ගුරුභවතුන් සමඟ ම සිසුන්ගෙන් සමන්විත පුහුණු සංචිතයක් සකස් වී තිබේ. පුහුණු සංචිතයට අයත් සිසුන්ට මාර්ග කිහිපයකින් තම දැනුම හා හැකියා ඉදිරිපත් කිරීමටත් ඔවුන්ගේ කුසලතා මුවහත් කර ගැනීමටත් අවස්ථාව ලැබී තිබේ.

කෑගල්ල ශාන්ත මරියා ජාතික පාසලේ මෙම වැඩසටහන රටට ම ආදර්ශයක් නොවේ ද?

# 23. නිකසල විදුබිම

උදෑසන පාසලට එන පුංචි දැරියකගේ ඇඟට ඉඳුල් පිඬක් වැටුණේ පාසල අසල ම තිබූ කොට්ටම්බා ගසින්. කොට්ටම්බා ගසේ ඉඳුල් කොයින් ද? කපුටෙක් පාසල් වත්තේ කුණු වළක තිබූ කෑම කොළයක් ඇදගෙන ගහේ ඉඳගෙන එය දිග හරිනවා.

මෙම අප්‍රසන්න අත්දැකීමෙන් අපහසුතාවයට පත් ඇය හඬාගෙන ම පාසලට දුවගොස් පන්තිභාර ගුරුතුමියට කාරණය කිව්වා.

පරිසරය රැකීම තුළින් මිනිසා ද රැකෙන බවත්, යහපත් සමාජයක් බිහි කිරීමට දරුවන් තුළ යහපුරුදු ඇති කළ යුතු බවත් සිතමින් ගුරුතුමිය විදුහල්පතිතුමිය හමුවීමට කාර්යාලය වෙත ගමන් කළේ පාසල් බිම පවිත්‍රව තබා ගැනීමට ගත හැකි දිගුකාලීන හා වඩාත් ඵලදායී විසඳුම කුමක් ද යන්න කතා කිරීමට යි.

විදුහල්පතිතුමිය සියලු කරුණු අසා අපූරු යෝජනාවක් ඉදිරිපත් කළා. කුඩා මල්ලක් සෑම දරුවෙක් ම භාවිත කරමින් තම තමන්ගේ එදිනෙදා ඉවතලන අනවශ්‍ය කඩදාසි ඉටිකොළ ආදී දේ එම මල්ලට දමා තම නිවසට රැගෙන ගොස් බැහැර කිරීමට සිසුන්ව පුරුදු කිරීම එම අදහසයි. පසුව එම යෝජනාව ගුරු මණ්ඩලය සමග සාකච්ඡා කරනු ලැබුවා. කමිටුවක් පත් කර එය ක්‍රියාත්මක කිරීමට පැවරුවා.

යෝජනාව සැලසුම් කර සිසුන් එක්දහස් තුන්සියයක් පමණ සිටින පාසල තුළ එය නිර්මාණශීලී අයුරින් ක්‍රියාත්මක කිරීමට ශ්‍රේණි සඳහා විවිධ වර්ණ යොදා ගනිමින් අඟල් $12 \times 8$ක බෑගයක් සකස් කළා. එම බෑගය ඇතුල් බිත්තිය මත ඉටි කවරයක් අලවා ඇති නිසා ඉතිරි කෑම, ඉඳුල් වැනි ද්‍රව්‍ය පවා පහසුවෙන් බැහැර කිරීම සඳහා රැගෙන යා හැකියි. පාසලේ දරුවන්ට පමණක් නොව සියලු ම අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් එය හඳුන්වා දෙමින් මුළු පාසල තුළ ම එය ක්‍රියාත්මක කළා. මෙම බෑගය නිසි පරිදි භාවිතය සඳහා සිසුන් හුරු කිරීමට දෙමසක පමණ කාලයක් සමස්ත ගුරු මණ්ඩලයට මහන්සි වී වැඩ කරන්නට සිදු වුණා.

දැන් විවිධ වර්ණයන්ගෙන් යුත් කුඩා බෑගය රැගෙන එන දූවා දරුවෝ ඒ තුළ කුඩා රෙදි කෑල්ලක් ද ගෙන එති. ඉන් ඩෙස් පුටුවල දූවිලි ඉවත් කරමින් පිරිසිදු කිරීමේ කටයුතු දෛනික ව සිදු කරන අයුරු බලා සිටීමත් ප්‍රියජනකයි. වෙනදා පාසල් පරිසරයේ, පන්ති කාමරවල විසිරී පවතින කුණු රොඩු දැන් හුඟක් අඩු යි. තම තමන්ගේ එදිනෙදා ක්‍රියාකාරකම්වල දී එක්රැස් වන කසළ සියල්ල ම බෑගයට දමා රැගෙන යාමේ පුරුද්ද සිසු දරුවන් චරිතාරෝපණය කරගෙන ඇති ආකාරය විස්මය උපදවනවා.

සතියේ සෑම බදාදා දිනක ම පවත්නා උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමිය එම ව්‍යාපෘතිය පිළිබඳ කතා කරමින් එය යාවත්කාලීන කිරීමට කටයුතු කරනවා. තව ද පන්තිභාර ගුරුභවතුන් ඒ පිළිබඳ ව දක්වන්නේ දැඩි පරීක්ෂාකාරී බවක්.

සොබා දහමට ආදරය කරන දරුවා සොබා දහමින් රැකෙන බව අප කවුරුත් දන්නා සත්‍යයකි. නොවැරදී ම හෙට හිරු පායනු ඇත. එසේ ම අප පාසලින් බිහි වන දරුවා සමාජයේ යහපතට කටයුතු කරන ගුණ නැණ බෙලෙන් යුතු දූ පුතුන් වන බව විදුහල්පතිතුමිය පවසන්නේ මෙය සමාජ ආදර්ශයක් ම වන විශිෂ්ට ව්‍යවහාර ප්‍රවේශයක් නිසා ම ය.

(මිනුවන්ගොඩ කලාපයේ බප/මිනු/ පල්ලේවෙල මහා විද්‍යාලයේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනක් ඇසුරිනි.)

# 24. පාසල හරහා මහ පාරක්

විෂය සමගාමී තත්ත්ව කවයේ දී පාසල තුළ මාර්ග සංඥා පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට 5 ශ්‍රේණිය භාර ගුරු මහත්මිය කළ යෝජනාව සියලු දෙනා තුළ කිසියම් නොසන්සුන්තාවක් ඇති කළ බව දක්නට ලැබුණි.

"ඒක කරන්න පුළුවන් දෙයක් ද?"

"මොකක් ද ඒකෙ ප්‍රයෝජනය ?" ප්‍රශ්න පිට ප්‍රශ්න ඉදිරිපත් විය.

එවිට 5 ශ්‍රේණිය භාර ගුරුතුමිය කරුණු කිහිපයක් පැහැදිලි කළා ය.

- අනාවරණ පරීක්ෂණයේ දී ළමයි අඩුවෙන් ම ලකුණු ලබාගෙන ඇත්තේ මාර්ග සංඥා ආශ්‍රිත ප්‍රශ්නවලට වීම
- පාසලේ ළමයින්ට නිතර ප්‍රධාන පාරට යෑමට අවස්ථාව නොලැබීම
- සිසුන්ට මහා මාර්ගය භාවිත කිරීම පිළිබඳ ව පුරුද්දක් නොමැති වීම
- සිසුන්ට මහපාර භාවිත කරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් අවශ්‍ය වීම
- පාසලේ දී එම අත්දැකීම ලබා දීම අවශ්‍ය බව

සියල්ලන්ගේ ම ප්‍රශ්නවලට පිළිතුරු ලැබුණු අතර එම අදහස ක්‍රියාත්මක කිරීමට සියල්ලෝ එකඟ වූහ. ඒ අනුව පාසල් භූමියේ කෘත්‍රිම ලෙස මහා මාර්ගයක ආකෘතියක් නිර්මාණය කරන්නට විය. එම මාර්ගය මත හා අවට මාර්ග සංඥා ද ස්ථාපනය කෙරිණි. සම්පූර්ණ වූ මාර්ගයට අවශ්‍ය වාහන, පොලිස් නිලධාරීන්, පදිකයන් ආදී පාර්ශව ලෙස සිසුන් සැරසී ආදර්ශ මහා මාර්ගයක පවතින ක්‍රියාවලිය ක්‍රියාකාරකමක් වශයෙන් සිදු කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා පහසුකම් සපයා දෙන ලදී. ඒ අනුව දෙසතියකට වරක් මහා මාර්ග ක්‍රියාකාරකම සඳහා 5 ශ්‍රේණියේ සිසුන්ට කාලච්ඡේද දෙකක් වෙන් කෙරුණි.



මෙය සිසුන්ට නවමු අත්දැකීමක් වූ අතර මේ සඳහා ඔවුහු දැඩි උනන්දුවකින් සූදානම් වූහ. ඔවුන් වාහන ලෙස ආකෘති සකස් කර ගත් අතර ගුරුවරුන්ගේ මඟපෙන්වීම යටතේ ආදර්ශ මහා මාර්ගයේ පදිකයන්, පොලිස් නිලධාරීන් ආදී පිරිස් ලෙස ක්‍රියාකාරකමට එක් විය. සිසුහු මෙම සෙල්ලම් මහා මාර්ගයෙන් බොහෝ කරුණු අවබෝධ කර ගත්හ. මාර්ග සංඥා හා මාර්ග නීති මෙන් ම මාර්ගයේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම පවා නිරායාසයෙන් ම ඉගෙන ගැනීමට අවස්ථාව ලැබුණි.

තවදුරටත් මෙම කාර්යය සංවර්ධනය කරමින් ආදර්ශ මාර්ගය වටා ස්ථාපනය කරන ලද සංඥා, උපදෙස් සියල්ල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම සඳහන් කරන්නටත් කටයුතු කිරීම නිසා ක්‍රියාකාරකම් තුළ දී ම ත්‍රිභාෂා දැනුම ද දියුණු කර ගැනීමට සිසුන්ට අවස්ථා සපයා දුනි. දැන් සිසුන් තම විවේක කාලයන්හි දී ද ආදර්ශ මහා මාර්ගයේ ගැවසෙමින් ක්‍රියාකාරකම ක්‍රීඩාවක් ලෙසින් සිදු කිරීම දැකිය හැකි ය.

(නිකවැරටිය අධ්‍යාපන කලාපයට අයත් කුමර විද්‍යාලය හා ඉතැව ප්‍රාථමික විද්‍යාලවල ක්‍රියාත්මක විශිෂ්ට ව්‍යවහාර ඇසුරින් සකස් කර ඇත)

# 25. විද්‍යාගාරයේ විප්ලවය

නිවේදක - දැන් අපි මේ උත්සවයේ සුවිශේෂී අවස්ථාවට පැමිණ සිටිනවා. ඔබ දන්නවා පසුගිය උසස් පෙළ විභාගයේ විද්‍යා විෂය ධාරාවේ සිසුන් රාශියක් ඉහළ සාමර්ථ ලබා සමත් වී සිටිනවා. ඒ අතරින් විද්‍යා අංශයෙන් දිස්ත්‍රික්කයේ ඉහළ ම ප්‍රතිඵලය ලබාගත් චතුර ප්‍රභාෂ්වර ශිෂ්‍යයාට වසරේ විශිෂ්ටතම ශිෂ්‍යයාට හිමි සම්මානය පිළිගැනීමට අපි වේදිකාවට ආරාධනා කරනවා.

(අත්පොළසන් හඬ මධ්‍යයේ චතුර වේදිකාවට පැමිණෙයි)

අපි ඔබව ආදරයෙන් පිළිගන්නවා. පාසලේ වැඩ රාශියකට සම්බන්ධ වෙලා සිටියත් ඔබ උසස් පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත් වෙලා තියෙනවා. ඔබේ මේ ජයග්‍රහණයට ප්‍රධානම වූ හේතුවක් ඇතැයි මා හිතනවා. ඒ පිළිබඳ ව ඔබේ මතකය අවදි කරන්නට අවස්ථාවක් ලබා දෙනවා.

චතුර ප්‍රභාෂ්වර - බොහොම ස්තුතියි. ඔබ සියලු දෙනාගෙන් ම අවසරයි. මේ අවස්ථාව මගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවක්. වසර දහ තුනක් සිප් කිරි පෙවූ විදු මාතාවට මගේ ගෞරවනීය ප්‍රණාමය පුදන්නටත් මගේ ජයග්‍රහණයට හේතු වූ සුවිශේෂී කාරණය මතක් කරන්නටත් මම මේ අරාධනය ඉතා සතුටින් පිළිගන්නවා. පසුගිය වසරේ පාසලේ ක්‍රීඩා නායකයා වෙලා මම සමස්ත ලංකා මලල ක්‍රීඩා තරගයෙන් රන් පදක්කම් දිනාගත් බව ඔබ සියලු දෙනා දන්නවා. ඒ වගේ ම ගිය වසරේ දී පරිසර සංගමයේ අපට එතෙක් පාසල පැවැත්වූ සාර්ථක ම සහ දැවැන්ත ම පරිසර කඳවුර පවත්වන්නටත් හැකි වුණා. ඊට පෙර අවුරුද්දේ නව නිපයුම් සංගමය පැවැත්වූ ප්‍රදර්ශනයේ ජයග්‍රාහී නිර්මාණ අන්තර් ජාතික මට්ටමින් පවා සම්මානයට ලක් වුණා. ඒ පිළිබඳව මම මහත් ආඩම්බරයෙන් කථා කරන්නේ ඒ සම්මානයේ කොටස්කරුවෙකු ලෙස මමත් කටයුතු කළ කෙනෙක් නිසයි.

මේ සියලු විෂය සමගාමී හා විෂය බාහිර කටයුතුවල යෙදෙමින් උසස් පෙළ විද්‍යා අංශයේ ඉහළ ම, විශිෂ්ට ම දක්ෂතා දක්වන්නට මා ඇතුළු අපගේ වසරේ උසස් පෙළ විද්‍යා, ගණිත විෂය ධාරා හැදෑරූ සහෝදර සිසුන්ට හැකි වුණේ කුමක් නිසාද යන්න මම ඔබට පවසන්නම්.....

ජීව විද්‍යාව හැදෑරූ අපට භෞතික විද්‍යාව විෂය තමයි අපහසු ම විෂයය වුණේ ඒ වගේ ම උසස් පෙළට මෙහි ප්‍රායෝගික පරීක්ෂණවලින් ප්‍රශ්න රාශියක ඇතුළත් කරනවා. බහුවරණ ප්‍රශ්න වගේ ම රචනා ප්‍රශ්නත්, ඒ වගේ ම එදිනෙදා ජීවිතයේ සරල විද්‍යාත්මක සංකල්ප හඳුනා ගැනීමටත් මේ ප්‍රායෝගික පරීක්ෂණවල නියැලීම අපට ඉතා වැදගත් දෙයක්. නමුත් උසස් පෙළ ගණිත හා විද්‍යා අංශවල බොහෝ ශිෂ්‍යයන්ට මෙම කාලච්ඡේද මග ඇරෙනවා. ඒකට හේතුව තමයි මේ පාසලේ උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරා හදාරණ සිසුන් බොහෝමයක් විෂය සමගාමී වැඩවලට සම්බන්ධ වෙලා වැඩ කිරීම. අපේ පාසලේ ඒ සඳහා අපිට බොහෝ අවස්ථා හා පහසුකම් සපයලා තියෙනවා.

අපිට භෞතික විද්‍යාව ඉගැන්වූ සුධාරි ගුරුතුමිය තමයි ලොකු සර් එක්ක කථා කරලා විද්‍යා හා ගණිත අංශවල අයට මඟ හැරෙන භෞතික විද්‍යා ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීමට වෙලාව සොයා ගන්න විකල්ප මාර්ගයක් සාකච්ඡා කළේ. මේ අභියෝගය ජයගන්න ක්‍රම ගැන අපෙනුත් ඇහුවා. ඒ අනුව තමයි විද්‍යාගාරය තුළ ස්වයං අධ්‍යයනයට ඉඩ හසර ලැබෙන ක්‍රියාකාරී වැඩ පිළිවෙළක් පිළිබඳ අදහස මතු වුණේ. එම අදහස භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සඳහා ක්‍රියාවට නැංවීමට කටයුතු කළා.

මුලින් ම ගණිත හා විද්‍යා පන්ති කණ්ඩායම්වලට බෙදිලා භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සඳහා විද්‍යාගාරය ක්‍රමවත් කළා. එස් 5 සංකල්පය අපි ඒකට යොදා ගත්තා. ප්‍රායෝගික පරීක්ෂණ සඳහා උදෑසන 6.00 සිට සවස 3.00 දක්වා සහභාගී විය හැකි විධිමත් කාල සටහනක් හැදුවා. සුධීරා ගුරුතුමිය ඒ වගකීම් සියල්ල භාර ගත්තා.

ඊළඟට භෞතික හා රසායන විද්‍යා ප්‍රායෝගික පරීක්ෂණ / ක්‍රියාකාරකම් විද්‍යාගාරය තුළ ආදර්ශ ලෙස ක්‍රියාවට නංවමින් ඒවා රූ ගත කළා. මෙම රූගත කිරීම් හා පසුතල හඬ කැවීම් අපි ම සිදු කළා. සුධීරා ගුරුතුමිය අවශ්‍ය විෂය කරුණු අවධාරණය කරමින් ඒවා අපූරුවට පෙළ ගැස්සුවා. සෑම ප්‍රායෝගික පරීක්ෂණයක් ම සංයුක්ත තැටිගත කරලා විද්‍යාගාරයේ වෙනම රාක්කයක නම් කර තැබුවා. දැන් විෂය නිර්දේශයේ ඕනෑම පරීක්ෂණයක දර්ශන විද්‍යාගාරය සතුව තියෙනවා. පාසල් සංවර්ධන සමිතියේ අනුග්‍රහයෙන් විද්‍යාගාරවල විශාල ප්‍රමාණයේ LCD තිර සකස් කළා. එම තිරවල එම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පාඩම් ඒකක දර්ශනය කළා. අපට වෙන් වූ කාලයේ දී අපි නොවරදවා ම ඒවා අධ්‍යයනය කළා. බොහෝ විට මා ඒ සඳහා යොමු වුණේ උදෑසන 6.00 ට සුධීරා ගුරුතුමිය අපටත් කලින් ලැබ් එකට ඇවිත් හිටියා.

උසස් පෙළ විභාගයේ භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව විෂය කරුණු අවබෝධ කරගන්නට අපිට මේ වැඩපිළිවෙළ ගොඩක් ප්‍රයෝජනවත් වුණා. ඇත්තටම මේක 'විද්‍යාගාරයේ විප්ලවයක්' ලෙස හැඳින්වූවාට වරදක් නෑ. බොහෝ සිසුන් ඉහළ ප්‍රතිඵල පෙන්වීමට විද්‍යාගාරයෙන් සපයා තිබූ මෙම පහසුකම විශාල රුකුලක් වුණා.

ඔබට දැන් පැහැදිලි ඇති මෙතරම් අපහසු විෂය ධාරාවක් ජය ගන්නට හේතු වූ සාධකය ගැන. ඒ සඳහා පාසලින් ලැබුණු මග පෙන්වීම, විශේෂයෙන් සුධීරා ගුරුතුමියගේ මඟ පෙන්වීම අපි ඉතා අගය කරනවා. ඒ නිසා මේ අවස්ථාවේ දී මම සියලු දෙනාට ම ස්තුතිවන්ත වෙනවා අපගේ මේ ජයග්‍රහණය හුදෙක් ම පාසලේ ජයක්. ඊට අපටත් දායක වෙන්න හැකි වීම ගැන සතුටු වෙනවා. හැම දෙනාට ම ස්තුතියි.

*වේගවත් අත්පොළසන් නාදයක් නැගේ.*

*සුධීරා ගුරුතුමිය දෑස් කෙවිනි තුළ මතු වූ කඳුළු බිඳුවක් පිස දමනු පෙනේ.*

(මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයේ විශිෂ්ට ව්‍යවහාරයක් ඇසුරෙනි.)



# 26. තේ වත්තක රැස්වීමක්

වේලාව පස්වරු 4.00 පසුවෙමින් තිබිණි. දැඩි වංගු සහිත පාරේ තේ වතු පසු කරමින් අපගේ වාහනය ඉදිරියට ඇදුණි. පාර දිගේ තේ දළු නෙලන්නියෝ දළුවලින් පිරි මලු උරයෙහි එල්ලාගෙන ඉක්මන් ගමනින් අප වාහනය යන දිශාවට ගන් කරමින් සිටියෝය. තවත් කිලෝමීටර් භාගයක් පමණ ඇදී ගිය වාහනය නතර කරනු ලැබුවේ පාර කොනක පිහිටි තේ දළු කිරන ස්ථානයක ය. ඒ වන විටත් තේ දළු නෙලන්නෝ එම ස්ථානයට රැස් වී තම කූඩවල ඇති දළු, දුනු තරාදියේ ආධාරයෙන් කිරමින් සිටියහ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් වන අප සමඟ ඕස්ට්‍රේලියානු ජාතික අධ්‍යාපන උපදේශකවරියක් ද වූවා ය. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයට අයත් ප්‍රදේශවල ජන ජීවිතය, සංස්කෘතිය, ආර්ථික හා සමාජ තත්ත්වය පිළිබඳ ව ඇයට පැහැදිලි කරමින් අප නැවතුනේ පස්සර ප්‍රදේශයේ පාසල් නිරීක්ෂණයට ගොස් ආපසු පැමිණෙන අතරතුර දී ය. යම් විශේෂිත අයෙක් යැයි සිතිය හැකි පුද්ගලයෙක් ද තේ කිරන ස්ථානයට පැමිණ සිටියේය. ඔහු එම ප්‍රදේශයේ වඩාත් ජනප්‍රිය හා ගෞරවනීය පුද්ගලයෙක් බව එතැන සිටින්නන්ගේ මුවින් හා මුහුණින් එල වූ ප්‍රකාශනයන් කියා පාන්නට විය. තවත් සුළු මොහොතකින් ඔහු එහි රැස්ව සිටි පිරිස අමතමින් යම් පණිවුඩයක් ලබා දුන් අතර යම් යම් කරුණු සම්බන්ධ ව කෙටියෙන් එම රැස්ව සිටි අයගෙන් විමසා සිටියේ ය. සාකච්ඡාවට වැඩි වේලාවක් ගත නොවුණි. ඉතා කෙටියෙන් අවශ්‍ය කාරණය පමණක් ඔවුන්ට දැනුම් දුන් බවක් පැහැදිලි විය. දෙමළ බසින් සාකච්ඡාව ගලා ගිය ද ලැබුණු පණිවුඩය පාසල හා සිසුන්ගේ සුරක්ෂිත බව සඳහා වූ වැඩසටහනක් පිළිබඳ ව බව පැහැදිලි විය. ඔහු අධ්‍යාපනයට සම්බන්ධ අයෙකු බව අවබෝධ වූයෙන් ඔහුගේ දැනුවත් කිරීම අවසානයේ අපි ඔහුට කතා කළෙමු. ප්‍රාථමික පාසලක විදුහල්පතිවරයෙකු වූ ඔහු චතුර ලෙස සිංහල හා ඉංග්‍රීසි බසින් අපත් සමඟ තොරතුරු බෙදා ගන්නට වූයේය.

එම විදුහල්පති, ප්‍රාථමික වතු පාසලකට නායකත්වය දෙන අතර එම පාසලේ දරුවන්ගේ දෙමව්පියන් තේ දළු නෙලන හා ඒ ආශ්‍රිත රැකියාවල නිරත වී සිටින පිරිසක් වන බව අපි ඔහුගෙන් දැන ගත්තෙමු. පාසලේ විවිධ කටයුතු හා සිසුන් සම්බන්ධ ව සාකච්ඡා කිරීම සඳහා දෙමවුපිය රැස්වීම් පාසල් කාලය තුළ පැවැත්වීම ඉතා අසීරු කාරණයක් බවත් ඒ සඳහා දෙමාපියන් සහභාගී වේ නම් ඔවුන්ගේ දෛනික වැටුප අහිමි වන බවත් විදුහල්පති විසින් අපට පැහැදිලි කරදෙන ලදී. අධික දරිද්‍රතාවයෙන් හා නූගත්කමින් ද පෙළෙන මෙම ජනතාවට සිහින නොතිබුණි. නමුත් තම එකම සම්පත වූ දරුවන්ගේ අනාගතය පැහැබර කිරීම ඔවුන්ගේ මුඛ්‍ය අරමුණයි. ඒ වෙනුවෙන් පාසලකට කළ හැකි කාර්යය හා අමිල සේවය පිළිබඳ මනා ලෙස වටහාගත් විදුහල්පතිවරයෙක් අපට හමු වී ඇති බැව් ඔහුගේ කතාව හා ඇවතුම් පැවතුම් මඟින් පසක් විය.

රැස්වීම් සඳහා ඔහු දෙමාපියන් පාසලට ගෙන්වා ගැනීම වෙනුවට දෙමාපියන් වෙත ගොස් අවශ්‍ය පණිවිඩ හා තොරතුරු සන්නිවේදනය කරන්නට පසුබට වී නැත. කොට්ඨාස හා කලාප අධ්‍යාපන කාර්යාලවලින් ලැබෙන උපදෙස් මත ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් හා පාසල් මට්ටමේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා සැලසුම් කරන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දෙමාපියන් දැනුවත් කරන ස්ථානය වශයෙන් එම විදුහල්පතිතුමා තෝරා ගෙන තිබෙන්නේ තේ දළු කිරන ස්ථානය යි. විදුහල්පතිවරයෙකුට ඇති සමාජ පිළිගැනීම හා ගෞරවයත්, විදුහල්පති හා ප්‍රජාව අතර පවත්නා බැලදීමත් නිසා වතු අධිකාරිත්වයේ විශේෂ අවසරයක් මේ සඳහා විදුහල්පතිට ලැබී තිබේ. දිනපතා පෙරවරු 9.00ට, දහවල් 12.00ට හා සවස 4.00ට තේ දළු කිරා භාර දීමට එම ස්ථානයට පැමිණෙන පිරිස පහසුවෙන් හමු විය හැකි ය. එම ස්ථානයට පාසලේ දෙමාපියන් බොහෝ දෙනෙක් එකතු වන බැවින් විදුහල්පති අවශ්‍ය අවස්ථාවල දී තොරතුරු හා උපදෙස් ලබා දීමට පෙරවරුවේ හෝ පස්වරුවේ හෝ තේ ලබා දෙන වේලාවට පැමිණේ. මේ නිසා සිසුන්ගේ අධ්‍යාපන හා විෂය සමගාමී කටයුතු සංවර්ධනය සඳහා දෙමව්පියන්ගේ අවධානය නොබිඳී පවත්වා ගන්නට හැකියාව ලැබී තිබේ. පාසල පිළිබඳ ව ඉතා වටිනා ආකල්පයක් ප්‍රජාව තුළ පැවතෙන්නේ ද මේ කාර්යය නිසා යි.

(පස්සර එල්ටැබ් අංක 1 දෙමළ විද්‍යාලයේ විශිෂ්ට ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 27. ජීව කොටුවයි - වගා බිමයි

**සංකල්පය**
දිරණ කුණු සම්පතක් ලෙස භාවිතයට ගැනීම

↓

සැලසුම හා ක්‍රමවේදය

↓

පාසලේ ශ්‍රේණි සඳහා නියමිත මිදුල අසල ජීව කොටුවක් සකස් කිරීම

↓

දිනපතා විවේක කාලයෙන් පසු විනාඩි 05 ක් ගුරු සිසු සියලු දෙනා එක්ව පරිසරය පිරිසිදු කිරීම
දිරණ කැළි කසළ ජීව කොටුවට යැවීම

↓

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම. පාසල් ගෙවත්තට යෙදීම හා ඒවා පිටස්තර පුද්ගලයන්ට විකුණා මුදල් රැස් කිරීම.

↓

ජීව කොටු සංකල්පය ගමට ගෙන යැම හා ගමෙහි ජීව කොටු 200 ක් සකස් කිරීම.

↓

ප්‍රතිලාභ

අපද්‍රව්‍ය වෙන්කර ගැනීමේ චර්යාව ප්‍රජාව තුළ ඇති වීම

කාබනික පොහොර සකස් කිරීම කෙරෙහි යොමු වීම

පාසලට හා ප්‍රජාවට ආදායමක් ලැබීම

රසායනික ද්‍රව්‍ය භාවිත නොකොට වගා කිරීම

පරිසරය අලංකාර වීම

විවේකය ඵලදායී ලෙස ගත කිරීම



(අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිරලෝගම සුබෝධි මහා විදුහලේ යහපත් ව්‍යවහාරයක් ඇසුරිනි.)

# 28. සන්නිවේදනයේ පුනර්ජීවය පාසලට

ගා/නලාගස්දෙණිය ජයන්ති විද්‍යාලයට ආඩම්බර වීමට හේතු රාශියක් ඇත. ජනප්‍රිය පාසලක ප්‍රජාවට පණිවුඩ හා උපදෙස් සන්නිවේදනය කිරීමේ දී මෙම විද්‍යාලය ලබා ඇති ප්‍රගතිය අගය කළ යුතුය. අද පාසලේ සියලු සන්නිවේදන කටයුතු සඳහා විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලයට තොරතුරු තාක්ෂණය නැතිව ම බැරි මෙවලමක් වී හමාර ය.

නව තාක්ෂණයට සංවේදී මිනිසෙකු ලෙස පාසලේ විදුහල්පතිතුමා ලිපි ලේඛන රාශියක් වැය කරමින් කළ යුතු බොහෝ දේ ඉතා පහසුවෙන්, ඉක්මනින් හා අඩු පිරිවැයකින් සිදු කරන්නට තම ජංගම දුරකතනය හා පාසල් වෙබ් අඩවියේ සහාය සෑම විට ම ලබා ගනී.

එහෙත් මීට දෙවසරකට පෙර තොරතුරු හුවමාරුවේ දී පාසල් කාර්ය මණ්ඩලයට අසීරුතා රාශියකට මුහුණ දෙන්නට සිදු විය. පාසල් තොරතුරු පවත්වා ගැනීමේ දී හා සන්නිවේදනයේ දී ජංගම දුරකථන හා වෙබ් අඩවි මඟින් ගත යුතු, ගත හැකි වැඩ ගැන කල්පනා කර අලුත් කාර්යයකට අත ගැසීමට විදුහල්පතිතුමාට සිතෙන්නට ඇත්තේ පාසලේ වාසනාවට යි.

සිසුන් 1100කට ආසන්න පිරිසක් හා ගුරුවරුන් 28 දෙනෙකු සහිත පාසලක් පරිපාලනයේ දී හා සිසුන්ගේ දෙමාපියන් වෙත පණිවුඩ යැවීමේ දී සාම්ප්‍රදායික ක්‍රම භාවිතයේ ඇති ගැටලු මඟහැරවීමට අළුත් යෝජනාවක් විදුහල්පතිතුමා මීට දෙවසරකට පෙර පාසල් සංවර්ධන රැස්වීමේ දී ඉදිරිපත් කළේ ය. ඔහු එදින මෙය හඳුන්වා දෙමින් පැවත්වූ කථාවෙන් කොටසක් මෙසේ ය.

> "මේක ඉතා වැදගත් යෝජනාවක්. ප්‍රාථමික දරුවො දාහකට වැඩියෙන් ඉන්න අපේ පාසලේ සමහර තොරතුරු දෙමාපියන්ට ඉක්මනින් යවා ගන්න අපිට තරමක් අසීරුයි. කුඩා දරුවන්ගෙ අතේ පාසලේ වැදගත් නිවේදන යැව්වත් ඒවා දෙමවුපියන් අතට පත්වෙලා නෑ. දෙමවුපියන්ටත් මේ ගැන හොයල බලන්න අතපසු වෙනවා. මේක නිසා ම පහුගිය සතියෙ පන්ති කවවලට දෙමවුපියො සහභාගි වුණේ අඩුවෙන්. ඒ නිසා මම මේ ගැටලුවට විසඳුමක් ඉදිරිපත් කරනවා. හැම දෙමව්පියෙක් අතේ ම ජංගම දුරකථනයක් තියෙනවා. ඒ වාසිය අපි ගන්නවා. මීට පස්සෙ දෙමවුපියන්ට එවන පණිවිඩ හා නිවේදන අපි එවන්නෙ ඔයාලගෙ ජංගම දුරකථනයට යි. ඔබට තියෙන්නෙ අපි කියල දෙන ආකාරයට ඔබගේ ජංගම දුරකථන අංකය විද්‍යාලයේ වෙබ් අඩවිය තුළ ලියාපදිංචි කර ගැනීම යි. මේ කාර්යයෙන් අපිට තවත් වාසි දෙකක් ලැබෙනවා. මේකෙන් සන්නිවේදන තාක්ෂණය සිසුන් හා දෙමවුපියන් වෙත පහසුවෙන් සම්ප්‍රේෂණය වෙනවා. ඒ වගේ ම දෙමවුපියන් පාසල සමඟ ඇති බැඳීම ශක්තිමත් වෙනවා. මේ වන විට අපි අපේ පාසලේ වෙබ් අඩවිය අපේ ම දරුවෙක්ගේ පියෙකුගේ උදවු ඇතිව නවීකරණය කිරීමට කටයුතු යොදල තියෙනවා"

මෙම විසඳුම සභාවේ සිටි සියල්ලන් ම පිළිගත් අතර අවස්ථා කිහිපයක දී ම පැවති රැස්වීම්වල දී මේ පිළිබඳව දෙමවුපියන් දැනුවත් කර ඔවුන්ගේ ජංගම දුරකථන අංක පාසල් වෙබ් අඩවිය තුළ ලියාපදිංචි කර ගන්නා ලදී. අත් පත්‍රිකා මඟින් ද දෙමාපියන් දැනුවත් කර නොමිලයේ ලැබෙන කෙටි පණිවුඩ සේවාව (*SMS*) සක්‍රිය කරවීමට කටයුතු කෙරිණි.

එය පාසල සන්නිවේදන කාර්යය තුළ ලැබූ ජයග්‍රහණයකි. පාසල විසින් දැනුම් දෙන නිවේදන ඉතා පහසුවෙන් හා ඉක්මනින් දෙමවුපියන් වෙත කෙටි පණිවුඩ ඔස්සේ යැවීම දැන් සාමාන්‍ය දෙයක් බවට පත් වී තිබේ. විදුහල්පතිතුමා අන්තර්ජාලයට පිවිස යැවීමට අවශ්‍ය පණිවුඩය සරල ලෙස සකස් කොට වෙබ් අඩවියේ ලියාපදිංචි දුරකථන අංක වෙත එකවර යැවීමට කටයුතු කරයි. මේ කාර්යය ගුරුවරුන් කිහිපදෙනෙකු වෙත ද පවරා තිබේ.

පාසල විසින් ලබා දී ඇති උපදෙස් අනුව දෙමවුපියෝ දිනපතා තම ජංගම දුරකථන පරීක්ෂා කොට පාසලෙන් යම් නිවේදනයක් ඇති දැයි විමසිලිමත් වෙති. තොරතුරු තාක්ෂණයට හුරු නැති දෙමාපියන් පවා මෙම ක්‍රමයට කැමැති බව ඔවුන් විදුහල්පතිතුමා සමඟ කරන සාකච්ඡාවලින් පැහැදිලි වේ.




විදුහල්පතිතුමාගේ චින්තනය තවත් පුළුල් කරමින් සිසුන්ගේ මාසික හා වාර පරීක්ෂණ ලකුණු දෙමාපියන්ගේ ජංගම දුරකථන වෙත යැවීමට සන්නිවේදන පද්ධතිය උසස් කිරීමත් සිදුකර හමාර ය. මාසික හා වාර පරීක්ෂණ ලකුණු වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා පාසලේ ගුරුවරුන් පුහුණු කිරීම සිදු විය. දැන් පාසල තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉතා උසස් මට්ටමින් ප්‍රායෝගික ව යොදා ගන්නා පාසලක් බවට පත් වී ඇත. සෑම වාරයක් ම අවසානයේ සිසුන් වෙත නිවාඩු කාලය සඳහා පැවරුම් යැවීමට ද පාසලේ වෙබ් අඩවිය භාවිතයට ගනිමින් පවතී. තව ද පාසල් වෙබ් අඩවිය පාසලේ විවිධ දැන්වීම් පළ කිරීම සඳහා යොදා ගැනීමටත් හැකි වන පරිදි සකස් කර තිබේ. මේ වන විට සිසුන්ගේ ජංගම දුරකථන වෙත කෙටි පණිවිඩ මඟින් ප්‍රශ්න යවා පිළිතුරු *SMS* හරහා ගෙන්වා ගෙන ප්‍රශ්න විචාරාත්මක තරග පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් ද සිදු වේ. එපමණක් නොව සිසුන්ගේ උපන් දිනයට සුබ පැතුම් *SMS* හරහා යැවීමත්, දෙමවුපියන්ගේ යෝජනා අදහස් *SMS* හරහා ගෙන්වා ගැනීමත් සිදු වෙමින් පවතී. මේ නිසා ම සිසුන් මෙන් ම ඔවුන්ගේ දෙමවුපියන් ද තොරතුරු තාක්ෂණය හා බද්ධ වීමෙන් නව සන්නිවේදන සංස්කෘතියක් ගොඩනගා ගැනීමට හැකි වී තිබේ.

මෙම වෙබ් අඩවියේ කටයුතු විදුහල්පතිතුමා විසින් ම අධීක්ෂණය කෙරෙන අතර පුහුණු කරන ලද සිසු කණ්ඩායමක් හරහා මෙම පද්ධතිය යාවත්කාලීන කරගැනීමත්, පාසලට ආසන්න අනෙකුත් පාසල් වෙත මෙම තාක්ෂණය භාවිතයට මඟ පෙන්වීමත්, පාසල් පරිශ්‍රය තුළ නිදහස් *WI FI* කලාපයක් ඇති කිරීමත්, සෑම පන්ති කාමරයකට ම අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් ලබා දීමත් පාසලේ ඉලක්කගත වැඩසටහන් ලෙස හැඳින්විය හැකි ය.

(අම්බලන්ගොඩ කලාපයේ ගා/නලාගස්දෙණිය ජයන්ති විද්‍යාලයේ වැඩසටහනක් ඇසුරෙනි)

# 29. ගණිත විනෝදය

6-11 ශ්‍රේණිවල ගණිත විෂයය උගන්වන ගුරුවරුන්ගේ තත්ත්ව කවය සුපුරුදු පරිදි මාසයේ අවසන් සිකුරාදා දින රැස් විය. පාසලෙහි සාමාන්‍ය පෙළ ගණිත ප්‍රතිඵලය අවම වීම හේතුවෙන් සමත් ප්‍රතිශතය අඩු වී ඇති බව එදින එහි සාකච්ඡාවට ලක්වූ ප්‍රධාන මාතෘකාව විය. තත්ත්ව කවය මෙහෙයවූ අංශ ප්‍රධාන කලානි ගුරුතුමිය මෙසේ සාකච්ජාව ආරම්භ කළා ය.

"අවුරුදු කිහිපයක් තිස්සේ අපි ගණිත ප්‍රතිඵල සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති කළත් විෂය ප්‍රතිඵල අපේක්ෂිත මට්ටමට ළඟා වෙන්න තවමත් බැරිවෙලා තියනවා. ගණිත ගුරුවරු විදියට අපේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සංවර්ධනය කර ගන්න විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළොත් හොඳයි."

"එක එක්කෙනා යෝජනා කරලා සුදුසු වැඩසටහනක් සැලසුම් කර ගන්න එක තමයි වඩා හොඳ" ත්‍රිමානි ගුරුතුමිය කීවා ය.

ගුරුභවතුන් වැඩි දෙනෙක්ගෙන් මතු වූ අදහස් සාම්ප්‍රදායික වුවත් විජානී ගුරුතුමිය තරමක් වෙනස් අදහසක් ඉදිරිපත් කළා ය.

"ඇත්තට ම විභාග ප්‍රතිඵල අඩු වෙන්න ගණිතය විෂයට දරුවන් අකමැති වීමත් ප්‍රධාන හේතුවක්. ළමයි වැඩිපුර කැමති විකල්ප මාධ්‍යයක් භාවිත කරලා මේ සංකල්ප දෙන්න උත්සාහ කළොත් ගණිතය ලේසියෙන් උගන්වන්න අපිට පුළුවන් වේවි. "

"අපිට පුළුවන් නේද පරිගණක ක්‍රීඩා වගේ ක්‍රමයක් පාවිච්චි කරල ගණිතය සංකල්ප උගන්වන්න. ඒ වගේම විවිධ පරිගණක ක්‍රියාකාරකම් භාවිතයෙන් ලකුණු දීලා ඇගයීම් කරන්නත් පුළුවන් විදියට වැඩසටහන් සකස් කළා නම් හොඳයි නේද?" ගණකසිරි ගුරුතුමා යෝජනා කළේ ය.

"ඒක ඇත්තට ම හොඳ යෝජනාවක් අපි මුලින් ම ගණිත විෂය ප්‍රතිඵල සංවර්ධනයට මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා සාර්ථක වුවහොත් අනෙක් විෂයන්ටත් හඳුන්වා දෙන්න බලමු." කලානි ගුරුතුමිය එම අදහස අනුමත කළා ය.

ඒ අනුව පාසලේ තොරතුරු තාක්ෂණ ගුරු භවතුන්ගේ ද සහාය ඇති ව ගණිත තත්ත්ව කවය මඟින් දරුවන් සඳහා මූලික ගණිත සංකල්ප තහවුරු කිරීමට සුදුසු පරිගණක ක්‍රීඩා නිර්මාණය කරන ලදී. විශේෂයෙන් ගණිත සංකල්ප සාධනය සඳහා ම සකස් වූ පරිගණක භාවිත වැඩසටහන්, මෘදුකාංග අන්තර්ජාලයෙන් ලබා ගෙන ඒවා සිංහල භාෂාවට හැරවීම සඳහා ද කලානි ගුරුතුමිය කටයුතු කළා ය. මෙම නවමු ව්‍යාපෘතිය බොහෝ සේ අගය කළ විදුහල්පතිතුමා 6-11 ශ්‍රේණි කාලසටහනෙහි අමතර කාලච්ඡේදයක් බැගින් පරිගණක ආශ්‍රිත ගණිත අධ්‍යයනය සඳහා වෙන් කිරීමට ද කටයුතු කළේ ය.

ඒ අනුව සංඛ්‍යා රටා, ප්‍රස්තාර, මූලික ගණිත කර්ම භාවිත, ගණිත හැඩතල, වර්ග ඵල, පරිමා ඇතුළු පාඩම් රාශියක් පහසුවෙන් සිසුන්ට අවබෝධ කර ගැනීමට හැකි පරිදි සකස් වූ වීඩියෝ දර්ශන හා නිර්මාණ සූදානම් විය. වැඩසටහන හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවුණි.

පරිගණක ක්‍රියාකාරකම් භාවිතයෙන් ගණිතය ඉගෙනීම සිසුන්ට රුචි නව අත්දැකීමක් වූ අතර මෙම ක්‍රමවේදය පළමු වාරයේ සිට පාසලේ ක්‍රියාත්මක කළ විට සිසුන් ගණිත විෂයය සම්බන්ධ ව දැක් වූ උනන්දුව වර්ධනය වීම දක්නට ලැබුණි.



ගණිත අධ්‍යයනය සඳහා සිසුන්ට සැපයූ පරිගණක වැඩසටහන් අවසානයේ ලබා දෙන ඇගයීම් පරීක්ෂණයෙන් පැහැදිලි වූයේ සිසුන් ඉතා ඉක්මනින් හා පහසුවෙන් ගණිත සංකල්ප අවබෝධ කොට ගෙන ඇති බවකි. මාසික හා වාර පරීක්ෂණ සඳහා වැඩි ලකුණු ලබා ගැනීමේ පැහැදිලි ප්‍රගතියක් දකින්නට ලැබුණි.

සාමාන්‍ය පෙළ ප්‍රතිඵල පැමිණීමෙන් පසු ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහා ගුරු රැස්වීමක් විදුහල්පතිතුමා විසින් කැඳවන ලදී. එහිදී ඔහු ඒ පිළිබඳ මෙසේ අදහස් දැක්වී ය.

"අපේ ගණිත ප්‍රතිඵල සංවර්ධනය සඳහා භාවිත කරන පරිගණක ක්‍රීඩා ඇතුළු වැඩසටහන් මේ වෙද්දී ඉතාමත් සාර්ථක වෙලා තියනවා. ඒ නිසා අපේ ප්‍රතිඵල සංවර්ධනය වගේ ම නව තාක්ෂණය වැඩිපුර භාවිතයටත් වැඩි නැඹුරුවක් දක්වන බව පේනවා. මම කැමතියි අනෙක් විෂයයන්ටත් මේ උපක්‍රමය භාවිත කරනව නම්. ඒ වගේ ම මම ස්තුතිවන්ත වෙනවා ගණිතය විෂය භාර ගුරු මහත්ම මහත්මීන්ට මේ වගේ සංකල්පයක් අපේ පාසලට හඳුන්වා දීම පිළිබඳ ව" යැයි ප්‍රකාශ කරමින් විදුහල්පතිතුමා වැඩසටහන ඇගයීමට ලක් කළේ ය.

(දෙනුවර අධ්‍යාපන කලාපයේ ධීරානන්ද විද්‍යාලයෙහි ක්‍රියාත්මක විශිෂ්ට ව්‍යවහාරයක් ඇසුරෙන්)

# 30. මවුපියන්ට දානයක්

දස මසක් කුස දරා
සෙනෙහසින් හද පුරා
හැදූ මවුපියතුමනි
නැතක් දුක් උසුලමින්
ඔබ කරන මෙහෙවරට
බැති සිතින් දන් දෙන්න
අපි ලබමු ඉඩ හසර

රමණීය කඳු බිමක
ඇති පැරණි පාසලකි
සිසු විනය නැති නිසා
ඉගෙනුම ද බිඳ වැටිණ

ඇදුරිඳු ද - ගුරු කැල ද
දෙමාපිය සිසු කැල ද
අසමගි ව විරසක ව
පිලට දෙපිලට බෙදිණ

පාසල ම අඳුරු කළ
අභියෝග ජයගන්න
නවමු වැඩසටහනක්
පිණිස මඟ හෙළි කෙරිණ

සියලු දරුවන් විසින්
සකස් කළ දානයක්
දෙමවුපිය පිරිස වෙත
පිරිනැමිණ බැති සිතින්

හැම දෙනා අතරේ ම
සුහද බව රඳන්නට
මේ අනගි සිදුවීම
සැලසී ය මං පෙතක්

වගකීම් රැඳ වුණා
සමගි දම් තර වුණා
පාසලේ සරු බිමෙහි
ගුණ දහම් මතු වුණා

සැම සිසුවෙකු වෙතට
භාරවන කැටයකට
දවසකට රුපියලක්
බැගින් එක් රැස් වුණා

එම මුදල් යොදාගෙන
එන සැම වසරක ම
මා පියන් වෙත දනක්
පුදන්නට යොමු වුණා

සිසු විනය පියකරු ය
විදු පියස මනහර ය
පාසලේ ඉගෙනුම ද
දැන් ඉතා විසිතුරු ය




(ගම්පොල කලාපයේ පන්විලතැන්න මහා විද්‍යාලයේ ව්‍යාපෘතියක් ඇසුරිනි)

# 31. ශිෂ්‍ය දිනපොත

1-13 ශ්‍රේණි දක්වා පන්ති පැවැත්වෙන 1 AB වර්ගයේ පාසලකි. සිංහල, දෙමළ හා ද්විභාෂා යන මාධ්‍යන්ගෙන් ඉගැන්වීම් සිදු කෙරේ. 3500කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවකට සෙවන සලසන මෙම පාසලෙහි විෂය සමගාමී ක්‍රියාකාරකම් බොහොමයක් ඇත. මෙම සිසුන් වඩාත් වගකීම් දරන පිරිසක් බවට පත් කිරීම ඉලක්ක කරගත් වැඩසටහනක් දැනට වසර කිහිපයක සිට පාසලේ ක්‍රියාත්මක වේ. සිසුන් එදිනෙදා සිදු කරන කටයුතු සටහන් කිරීම සඳහා පාසල මඟින් හඳුන්වා දී ඇති 'ශිෂ්‍ය දිනපොත' සාමාන්‍ය දින පොතක් නොව පාසල් කළමනාකරණය පහසු කිරීම සඳහා ද භාවිත කළ හැකි ලේඛනයකි. විශේෂයෙන් ම පාසල් සිසුන්ගේ එදිනෙදා පාසලේ කටයුතු හා ක්‍රියාකාරකම් ගුරුවරුන්ට හා දෙමවුපියන්ට නියාමනය කළ හැකි සන්නිවේදන මාධ්‍යයක් වී ඇත.

මෙම වැඩසටහන එළිදැක්වීමට පෙර මේ සම්බන්ධයෙන් සියලු පාසල් ප්‍රජාවගේ අදහස් ලිඛිත ව ලබා ගැනීමත් එම දත්ත මත දින පොත සඳහා ඇතුළත් කළ යුතු කරුණු හඳුනා ගැනීමත් සිදු විය. ඒ අනුව පාසල් පරිපාලන ව්‍යුහය හා රාජකාරී පැවරී ඇති ආකාරය, විද්‍යාලයීය නීති රීති, ක්‍රීඩා හා වෙනත් විෂය සමගාමී කටයුතුවලට අදාළ තොරතුරු, ගුරු පාදක ව්‍යාපෘති, සිසු පැමිණීමේ ගැටලු සඳහන් වගු වැනි කරුණු මෙම දින පොතෙහි අන්තර්ගත කරන ලදී. සිසුන්ට මෙම 'ශිෂ්‍ය දිනපොත' වසර මුල දී පාසල විසින් ලබා දෙන අතර එහි සටහන් විය යුතු තොරතුරු ඉංග්‍රීසියෙන් ලියා දැක්වීමට සිසුන්ට නියම කෙරිණ. මේ නිසා ම සිසුන්ට තම ඉංග්‍රීසි ලේඛන හැකියාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු විය. ඊට දෙමවුපියන්ගෙන් ද ලැබුණේ ඉතා ධනාත්මක ප්‍රතිචාරයකි.



දිනපොතේ පිටුවෙන් පිටුවට දරුවන් සඳහා ඔවදන් වැකි, ආදර්ශ පාඨ ද ඇතුළත් කර ඇත. දිනපතා ම දින පොතෙහි සටහන් තබන දරුවාගේ ඇස ගැටෙන එම රුවන් වැකි මඟින් ස්වයං ජීවන හික්මීමක් ගොඩනගා ගැනීමට ඔහු නිතැතින් ම උත්සාහ දරනු ඇත. ශිෂ්‍ය දිනපොතේ දෛනික සටහන් පන්ති භාර ගුරුවරයා හා ශිෂ්‍ය නායකයන් මඟින් දිනපතා ම නියාමනය කෙරේ. එහිදී සිසුන් ලියා ඇති කරුණුවල ලේඛන දෝෂ හඳුනා ගැනීමට හා ඒවා නිවැරදි කිරීමට ද අවස්ථාව ලැබේ.

ශිෂ්‍ය දිනපොත හඳුන්වා දී පාසල ලැබූ ප්‍රතිලාභ රාශියකි. මෙහි මුල් කොටසේ අන්තර්ගත කරුණු හා තොරතුරු පාසල් ප්‍රජාවට පාසලේ නීති රීති, සංස්කෘතිය, කාර්යභාරය හඳුනා ගැනීමට පහසුකම් සපයන බැවින් එය විද්‍යාලයේ පරිපාලනයට හා කළමනාකරණයට අත්වැලක් සපයයි. ගුරු සිසු දෙමවුපිය සම්බන්ධීකරණය උදෙසා ද එය මහත් පිටුවහලක් වී තිබේ. විශේෂයෙන් ම සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා සංවර්ධනය සඳහා ද මෙමඟින් අවස්ථාව සැලසේ. සිසුන්ට එදිනෙදා කටයුතු නැවත ආවර්ජනය කරමින් සටහන් කිරීමේ පුරුද්ද ඇති කිරීම ද මෙහි වැදගත් කර්තව්‍යයකි.


(කෑගලු විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාරයක් ඇසුරෙන් සකස් කෙරිණි. මෙයට සමාන ව්‍යවහාරයක් ගලේවෙල අධ්‍යාපන කලාපයේ පල්ලෙපොල මහාබෝධි ද්විතීයික පාසලෙන් ද හමු වේ.)

# 32. ගුරුවරයාගේ ප්‍රතිබිම්බය

පාසලට අලුතින් පත්වීමක් ලබා පැමිණෙන උපාධිධාරී නවක ගුරුවරියකි. අපි ඇය ‘අනෝමා’ ලෙස හඳුන්වමු. තමාට ලැබුණු මුල් ම පත්වීම් ස්ථානය සම්බන්ධයෙන් ඇය තුළ ඇත්තේ නොසතුටකි. මන්ද උපාධිධාරී ගුරුවරුන් තෝරා පත්කර ගැනීම සඳහා පළාතේ පැවති තරග විභාගයෙන් ඉහළ ලකුණු ලැබූ අපේක්ෂිකාවක ලෙස අනෝමා තමා පදිංචි ප්‍රදේශයේ ම පාසලකට පත්වීමක් ලැබෙතැයි බලාපොරොත්තු වූ බැවිනි. එහෙත් ඇයට සේවය කිරීමට ලැබී ඇත්තේ ඇය පදිංචි ප්‍රදේශයේ සිට කි.මී.60ක් පමණ දුරින් පිහිටි ප්‍රාථමික පාසලකි. වාණිජවේදී උපාධිධාරිණියක වූ අනෝමාට ප්‍රාථමික පාසලක ඉගැන්වීමට යාමට සිදු වී ඇති දුෂ්කර ගමන පිළිබඳ තම මානසිකත්වය සකස් කර ගැනීම ඉතා අසීරු විය. කෙසේ වෙතත් ඒ කලකිරීම සමඟ ම ඇය ගුරු සේවයේ තම ප්‍රථම සේවා ස්ථානය කරා පිය නැඟුවා ය.

වේලාව පෙරවරු 7.30 පසු වෙමින් පැවතිණි. පාසල ඉදිරිපිට පැවති තදබදය අතරින් පාසල් බිමට ඇතුළු වන අනෝමාට දැකගන්නට ලැබුණේ උදෑසන ආගමික වතාවත්වල නිරත ව සිටින සිසුන්ගෙන් පිරුණු ක්‍රීඩා පිටිය යි. ක්‍රීඩා පිටියට යාබද ගොඩනැගිල්ලේ දික් ආලින්දයේ තනි පෙළට සිටිමින් සිසුන් හා එක් ව ආගමික වතාවත්වල යෙදෙන ගුරුවරුන්ගේ ඉරියව්වලින් මනා සංයමයක් විද්‍යාමාන විය. ආගමික කටයුතුවලින් පසුව පැවති සිසුන්ගේ විශේෂාංග හා විදුහල්පතිගේ කෙටි දේශනය අවසානයේ සිසුන් පිළිවෙළට පන්තිවලට යැවීමට ගුරුවරුන් හා ශිෂ්‍ය නායකයින් කටයුතු කරන බව පෙනිණි.

පාසල් බිම පුරා මල් පෝච්චිවල සරුවට වැඩුණු බෝගන්විලා ගස් විවිධ වර්ණයෙන් යුත් මලින් අලංකාර වී තිබිණි. පන්තිවලට පිය නැඟූ දරුවන් කඩිනමින් තම වතුර බෝතල්වලින් තම තමන්ගේ පන්ති ඉදිරිපිට ඇති මල් ගස්වලට වතුර වත්කරනු පෙනිණි. විදුහල්පතිතුමාගේ කාර්යාලය කොතැනද යන්න ගුරුවරියකගෙන් විමසා සිටි විට ඇය සුහදශීලී ලෙස කතා කොට නව ගුරුවරියට කාර්යාලය පෙන්වන ලෙස ශිෂ්‍ය නායකයෙකුට දන්වා සිටියා ය. ශිෂ්‍ය නායකයා ද ඉතා ගරු සරු ඇතිව ඇයව කාර්යාලය වෙත රැගෙන ගියේ ය. එම දරුවා වෙතින් ද සුවිශේෂී මිත්‍රත්වයක් ගම්‍ය වන බව අනෝමාට දැනුණි. කාර්යාලයට පියනඟන අතරතුර තමා ඉදිරියට හමුවන සෑම ගුරුවර ගුරුවරියකගේ ම මුවෙහි ප්‍රසන්න සහ විඩාවෙන් තොර ඉරියවු දකින්නට ලැබුණි.



ගුරුවරුන්ගේ හා සිසුන්ගේ මෙම චර්යාව වෙනත් පාසලක තත්ත්වයට වඩා වෙනස් බවක් අනෝමාට පෙනුණ ද එය පාසල් සීමාව තුළ මවා ගත් රඟපෑමක් දැයි ඇයට සිතෙන්නේ හාත්පස පාසල් පරිසරයේ මිත්‍රශීලී බව ඉක්මවා ඇය තුළ වැඩී තිබුණු කලකිරීම හා වේදනාව කැටි වූ තරහව නිසා ය.

විදුහල්පති හා ගුරු මණ්ඩලයෙන් අනෝමාට ලැබුණේ උණුසුම් පිළිගැනීමකි. සෑම ගුරුභවතෙකු වෙතින් ම පළ වූයේ සුහදශීලී බවකි. ගුරුවරුන් සම්බන්ධ ව අනෝමා මීට පෙර අසා දැක තිබූ කාරණා අනුව මෙම පාසලේ ගුරුවරුන්ගෙන් ගම්‍යවන සුහදත්වය හා පසන් චර්යාව ඇ කිසිසේත් අපේක්ෂා නොකළ තරම් ය. විවිධ පුවත්පත් ඇතුළු ජනමාධ්‍ය මගින් ගුරුවරුන් හා පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් මවන පුවත් මෙයට වඩා කොතරම් කටුක දැයි ඇයට සිතුණි. මෙම සුවිශේෂී චර්යාවට කුමක් හේතු වූවා දැයි ඇයට සිතා ගත නොහැකි ය.

විදුහල්පතිතුමා අනෝමා සමඟ පැවැත්වූ කෙටි සාකච්ඡාවෙන් පසු ඇයට පාසලේ දෛනික ගුරු පැමිණීමේ ලේඛනයේ අත්සන් කිරීමට උපදෙස් ලැබුණි. අත්සන් ලේඛනය තබා තිබුණේ විශේෂිත වූ උස් මේසයක් මත ය.

එහි දකුණතින් ඡායාරූප රාමුවක් තුළ පුවත්පතකින් කපාගත් ලිපියක් ප්‍රදර්ශනයට තබා තිබුණි. **'ගුරුවරියගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා ආරවුල සමථයට'** යනුවෙන් විශාල අකුරින් පළ වූ පුවත දෙසට අනෝමාගේ දෙනෙත් එක්වර ම යොමු විය. එහි සඳහන් ව තිබුණේ ගමක දෙපිරිසක් අතර ඇති වීමට ගිය විශාල ගැටුමක් ගුරුවරියකගේ මැදිහත් වීම හා ඇයගේ උපායශීලී බව නිසා විසඳා ගැනීමට හැකියාව ලැබුණු බවකි.

අනෝමාගේ සිත තුළ සිහින් ගැම්මක් ඇති වූයේ නිරායාසයෙනි. එවැනි පුවත් ජනමාධ්‍යයෙන් අසන්නට, දකින්නට ලැබෙන්නේ කලාතුරකින් වුව ද, එම පුවත ගුරු වෘත්තියට වටිනාකමක් එකතු කරන්නට සමත් වන බව අනෝමාට වැටහුණි. යම් සිහිල් බවක් සිත තුළට කෙමෙන් ගලා එමින් තිබිණි.

ගුරු අත්සන් ලේඛනයෙහි පැමිණීම සටහන් කර හිස ඔසවන විට ම දුටු දසුනින් එක්වර ම තම සිරුර තුළින් විදුලියක් ගමන් කරන්නාක් මෙන් ඇයට දැනෙන්නට විය. අපේක්ෂා නොකළ අවස්ථාවක තමාගේ මුහුණ තමන් ම දුටු විට ක්ෂණියකින් ඇතිවන හැඟීම ඇයට ද දැනිණි. ගුරු අත්සන් ලේඛනය ඉහළින් ඊට මුහුණලා පවතින පරිදි බිත්තියට සවිකර ඇති කැඩපත මඟින් තම මුහුණ දැකීමෙන් අනෝමාට එහි වූ ප්‍රතිබිම්බය තම මනස තුළ ඒ අවස්ථාවේ පවතින ස්වභාවය කියා පාන බව වටහා ගැනීමට අසීරු නොවී ය. මෙවැනි කැඩපතක් ගුරු පැමිණීමේ ලේඛනයට ඉහළින් සවිකර තිබෙන්නේ කිසියම් අරමුණක් ඇතිව විය යුතු යැයි ඇයට පසක් විය.


අනෝමාට තමා සිතුවාට වඩා ධනාත්මක බවක් පාසල තුළ දී ලද පළමු දින අත්දැකීමෙන් ම සිතට දැනුණි. ඇය දෙවන දින පාසලට පැමිණියේ පෙරදා උදැසන සිතෙහි රැඳී කලකිරුණු ස්වභාවය, එම ධනාත්මක හැඟීම මඟින් මදක් තුනී කර ගනිමිනි. ගුරු පැමිණීමේ ලේඛනයේ තම අත්සන යෙදීමට පෙර එය සමීපයෙහි තබා ඇති ඡායාරූප රාමුව වෙතත්, පැමිණීමේ ලේඛනයට ඉහළින් බිත්තියේ සවිකර ඇති කැඩපත දෙසත් ඇයගේ දෑස ගමන් කළේ නිරායාසයෙනි.

පෙර දිනයේ ඡායාරූප රාමුව තුළ පැවති පුවත් ලිපියට වෙනස්, සඟරාවකින් උපුටා ගැනුණු ලිපියක් එහි ප්‍රදර්ශනය වී තිබිණි. වයස අවුරුදු 15 දී අනතුරකට පත් ව තම දෙමාපියන් ද අහිමි ව කායික ආබාධයකට ලක් වුණු දරුවෙකු හදා වඩා ගෙන අධ්‍යාපනය නිසි ලෙස ලබා දී ඔහු නීතිවේදියෙකු කිරීමට කැප වුණු ගුරු මාතාවක පිළිබඳ සැකසුණු විදෙස් ප්‍රවෘත්තියක් එම ලිපියෙහි ඇතුළත් විය.

එම ලිපිය කියවාගෙන යද්දී අනෝමාට දැනී ගියේ තමා ද උතුම් සේවයක නිරත විශිෂ්ට පුද්ගලයින්ගේ කුලකයට ප්‍රවේශ වී ඇති බවකි.

පැමිණීම සටහන් තබා පිට ව යන ගුරුවරුන් දෙස විපරමින් බැලූ අනෝමාට පෙනී ගියේ ඔවුන් අත්සන් කිරීමෙන් පසු අනිවාර්යයෙන් ම කැඩපත දෙස බලා තම මුහුණට ප්‍රසන්න බවක් එකතු කර ගනිමින් පිටව යන බව යි. සමහර ගුරුවරුන් කැඩපත දෙස දෑස් යොමා තම මුහුණින් ගලන දහදිය පිසදා, අවුල් වී ඇති හිසකෙස් මනා ව සකසා ගන්නා අයුරු දක්නට ලැබුණි.


පැමිණීමේ ලේඛනයේ අත්සන් කර අනෝමා ද මහත් ඕනෑකමින් කැඩපත දෙස බැලුවේ තමන්ට නොපෙනෙන තම මුහුණෙහි ස්වභාවය නිවැරදි ව දැක තමාට තමා පිළිබඳ ව ප්‍රත්‍යවේක්ෂණයක යෙදීමට ඇති අවකාශය භාවිතයට ගනිමින් ය. කැඩපත මැවූ තම මුවෙහි ප්‍රතිබිම්බය කියා පෑවේ තමා තුළ ඇති වී තිබෙන වෙනස යි. මද සිනහවක් මුවඟට නඟා ගත් අනෝමා තමා එනතුරු පන්තියේ බලා සිටින අහිංසක දරුවන් වෙත ඇදී ගියේ අභිමානවත් ගුරු මාතාවක වීමේ අභිලාෂය සිත්හි රඳවා ගෙන ය.




(අම්පාර අධ්‍යාපන කලාපයේ උහන කනිෂ්ඨ විද්‍යාලයේ ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 33. අපේ පාසල් සිතියම

ශ්‍රී ලංකාව පුරා පාසල්වල භාවිත යහපත් ව්‍යවහාර සොයා යාමේ දී අපට අපූරු පාසලක් හමු විය. එහි ඇති ශාලා හා පංති කාමර නම් කර තිබුණේ යම් විශේෂිත ක්‍රමවේදයකට යි. විස්තරයට වඩා එම පාසලේ සිතියම බැලීමෙන් ම එහි ඇති විශේෂත්වය හඳුනා ගැනීමට උත්සාහ කරමු.



# 34. හෙළ බත

මම දැන් කියන්නට යන්නේ පාසල් විශිෂ්ට ව්‍යවහාර සොයා යන ගමනේ අපට හමු වූ සුවිශේෂී පාසලක් ගැන. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ දෙනුවර අධ්‍යාපන කලාපයට අයත් ගන්නෝරුව විද්‍යාලය ගැන තමයි අපි කතා කරන්න යන්නේ.

ගන්නෝරුවේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තු සංකීර්ණයට කිට්ටුවෙන් පිහිටි ඉතා හොඳ කෘෂිකාර්මික පසුබිමකින් සමන්විත ප්‍රදේශයක තමයි පාසල ස්ථානගත වෙලා තියෙන්නෙ. සිසුන් 300ක් විතර ඉගෙන ගන්න, ගුරු මණ්ඩලය 25ක් විතර ඉගැන්වීම් කරන මේ පාසලේ පළමු ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙනවා.


සූර්යකෝෂ භාවිතයෙන් ජලය ලබා ගන්නා නළ ළිඳක් විද්‍යාලයේ ස්ථාපනය කරල තියෙනවා. එදිනෙදා අවශ්‍යතා සඳහා පාසලට ජලය සැපයෙන්නේ මෙම නළ ළිඳෙන්. බොහෝ දෙනෙක් මේක පාවිච්චි කරන කොට අපතේ යන වතුර ගලා ගෙන යන්නෙ ක්‍රීඩා පිටියට. නිරන්තරයෙන් ම අපතේ යන වතුර ප්‍රයෝජනවත් වැඩකට යොදා ගන්න පාසල ආරම්භ කරපු ව්‍යාපෘතියක් තමයි අපගේ ඇගයීමට ලක් වුණේ.

ශ්‍රී ලංකාවේ භාවිතයෙන් ඈත් වී යන පාරම්පරික දේශීය වී වර්ග සංරක්ෂණය කිරීම හා ඒවායේ සාම්ප්‍රදායික වගා ක්‍රම පිළිබඳ ව සිසු පරපුරට ආදර්ශයන් ලබා දීම මූලික අරමුණ කර ගත් මෙම ව්‍යාපෘතිය හඳුන්වන්නේ 'හෙළ බත' නමින්. ශ්‍රී ලංකාව අතීතයේ දී හැඳින්වුණේ 'පෙරදිග ධාන්‍යාගාරය' කියලා. ඒ ධාන්‍යාගාරයේ වගා කරනු ලැබූ වී වර්ග විශේෂ 100ක් විතර තියෙනවා. නමුත් අද අපිට මේ රටේ දකින්නට ලැබෙන්නෙ දේශීය වී වර්ග ඉතා සුළු ප්‍රමාණයක්. ඒ නිසා ම පාසලේ විද්‍යාලයපති ඇතුළු පාසල් ප්‍රජාව ම දායකත්වය දක්වමින් පටන් ගත්ත මේ ක්‍රියාකාරකම නිසා පාසල් භූමියේ දේශීය වී වර්ග 20ක් පමණ වගා කරල තියෙනවා. හැම වී වර්ගයකට ම ලියද්දක් වෙන් කරල තියෙනවා. ඒ වගේ ම එම දේශීය වී වර්ගයේ නම ඒ ලියදිවල ප්‍රදර්ශනය කරලා තියෙනවා.

කළු හීනැටි, සුදු හීනැටි, ගෝනබරු, කච්චපෙරුමාන්, මා වී, සුවඳැල්, දම් වී, රබුටන්, තටු වී, කුරුලු තුඩ, සුදුරු සම්බා, කහමාල, කහවනු, මඩතවාළු, හැටදා වී, බටපොලැල් යන නම්වලින් හඳුන්වන වී වර්ග මේ පාසල් භූමියේ දී ම දැක ගන්නට පුළුවන්. මං හිතන්නේ මෙවැනි වී වර්ග රාශියක එකතුවක් කුඩා බිම් කොටසක හමුවන ශ්‍රී ලංකාවේ එක ම පාසල් භූමිය පේරාදෙණිය ගන්නෝරුව විද්‍යාලය විය යුතුයි. සෑම ලියැද්දක ම එහි වගා කරල තියෙන වී වර්ගයේ නම පුවරුවල සඳහන් කරල තිබෙනවා.

පාසල ආසන්නයේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිසා ම එහි නිලධාරීන්ගේ සහාය ද අඩුවක් නැති ව මේ වැඩසටහනට අරගෙන තියෙනවා. විද්‍යාලයපතිතුමාගේ පූර්ණ අධීක්ෂණයෙන් ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ කාර්ය පැවරුම් ක්‍රියාත්මක කිරීමක් විදියට තමයි මේ කටයුත්ත සිදු වෙන්නෙ. ඒක නිසා සහන කාලච්ඡේද සහ පාසල් සවස් වරු කාලය මෙම කාර්යයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සිසුන්, ගුරුවරුන් හා දෙමවුපියන් සියල්ලන් විසින් ම ලබා දෙනවා.

මෙම කාර්යය සඳහා සිසුන් ඉතා කැමැත්තෙන් සම්බන්ධ වීම දකින්නට පුළුවන්. සිසුන්ට තනිව ම සාර්ථක ව වී වගාවක් කරන්න හැකියාව මේ ව්‍යාපෘතියෙන් කදිමට ලැබී තිබෙනවා.



මේ ව්‍යාපෘතිය නිසා පාසල ප්‍රතිලාභ ගොඩක් ලබා ගත්තා. අපතේ යන ජලය ඵලදායී කාර්යයකට පාවිච්චි කිරීම, පාසල් භූමියෙන් උපරිම ඵල ලබා ගැනීම, වගා කටයුතු පිළිබඳ සිසු දැනුම, ආකල්ප කුසලතා වැඩි දියුණු වීම, පාරම්පරික දේශීය වී වර්ග පිළිබඳ නූතන සිසු පරපුර දැනුවත් වීම ඒ අතරින් කිහිපයක්. ඒ වගේ ම විශේෂයෙන් ම සඳහන් කළ යුතුයි. පාසල් ආහාර ලබා දීමේ වැඩසටහනට පාසලෙන් ම සහල් සපයන්නට හැකි වෙලා තියෙනවා. තවත් එක් කරුණක් තියෙනවා. අපේ බත, සාම්ප්‍රදායික වී ගොවිතන එක්ක බැඳුණු සංස්කෘතිය ගැනත් සිසුන්ට වගේ ම පාසල් ප්‍රජාවටත් අවබෝධයක් ලබා ගන්න මේ ව්‍යාපෘතිය හොඳ අවස්ථාවක් වෙලා තියෙනවා.

(සංකල්පය - දෙනුවර කලාපයට අයත් පේරාදෙණිය ගන්නෝරුව විද්‍යාලය)

# 35. පරණ බඩු අලුත් වීම

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විවිධ වූ විෂමතා ඇත. ජනප්‍රිය යයි සම්මත පාසල් අතලොස්ස දියුණු කිරීම සඳහා ආදි සිසුන්, සුබ පතන්නන් වැනි බොහෝ පිරිස් අප්‍රමාණ ව සහාය දක්වමින් සිටිය දී අනෙකුත් පාසල් තම ශක්ති ප්‍රමාණයට අනුව පාසලට අවශ්‍ය පහසුකම් සපයා ගනී. එවන් වූ පාසල් අතර මොණරාගල කලාපයට අයත් නගරයෙන් තරමක් ඈත පිහිටි පාසලක් ගොඩනැඟෙන්නට දරන අපූරු වෑයමක් පිළිබඳ ව වාර්තා විය. මේ ඉදිරිපත් කෙරෙන්නේ එම වෑයම විදහා දැක්වෙන ලිඛිත සාක්ෂ්‍යයකි.

විදුහල්පති
මො/හොරොම්බුව විදුහල
හොරොම්බුව
2016.05.13

කළමනාකාරතුමා
මහජන බැංකුව
මොණරාගල,

<u>ආයතනයෙන් ඉවත්කරන අබලි ද්‍රව්‍ය ලබා ගැනීම.</u>

උක්ත කරුණ යටතේ මා විසින් 2016.03.03 දිනැති ව එවන ලද ලිපියට ප්‍රතිචාර දක්වමින් ඔබ ලබා දුන් සහය අගය කිරීම හා ඊට අප පාසලේ හෘදයාංගම ස්තුතිය පුද කිරීම අරමුණු කර ගනිමින් මෙම ලිපිය එවමි.

ඔබ ආයතනය මඟින් පාසල වෙත ලබා දුන් පාවිච්චියෙන් ඉවත් කළ යකඩ ගේට්ටුව අප විදුහලේ ගේට්ටුවක් සඳහා තිබූ දැඩි අවශ්‍යතාවය සපුරා ලූ බව මතක් කරන්නේ ඔබගේ ආයතනය පිළිබඳ ව අපගේ කෘතඥතාව ද ඉහළින් ම පළ කරමිනි. එම ගේට්ටුව නොමිලයේ ම නවීකරණය කර දෙනු ලැබුවේ අප පාසලේ දරුවෙකුගේ පියෙක් විසිනි. ගේට්ටුව සවි කිරීම නිසා පාසලේ පිවිසුමට මහත් අභිමානවත් පෙනුමක් ලැබුණි. එය සිසුන්ට හා දෙමාපියන්ට විශාල සතුටකි.

පසුගිය වසරේ ඔබ ආයතනය නවීකරණය කළ අවස්ථාවේ දී ද අපගේ ඉල්ලීම සැලකිල්ලට ගෙන අප වෙත ලබා දුන්, භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ දැල් සියල්ල 1,2 හා 3 ශ්‍රේණිවල පන්ති කාමර ආවරණය කිරීම සඳහා යොදා ගන්නා ලදී. මේ හේතුවෙන් කාලයක් තිස්සේ එම පංතිවල ඇති භාණ්ඩ ආරක්ෂිත ව තබා ගැනීම සම්බන්ධයෙන් පැවති ගැටලුව විසඳා ගැනීමට හැකි විය. එහි ගෞරවය ද ඔබට හා ඔබ ආයතනයට හිමි විය යුතුය.

ඔබ ආයතනයෙන් මෙන් ම මොනරාගල ප්‍රදේශයේ තවත් ස්ථාන රැසකින් ඉවත් කරන භාණ්ඩ පාසලේ භෞතික සම්පත් සංවර්ධනය පිණිස ලබා ගැනීමට අපි කටයුතු කළෙමු. ඊට අදාළ ඉල්ලීම් හා අවසරය ද අපි ලබා ගතිමු. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ පෞද්ගලික මූල්‍යායතන, ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය මෙන් ම වෙනත් පාසල්වලින් ද ඉවත් කෙරෙන පුටු, මේස, අල්මාරි, ලිපිගොනු කැබිනට්, පරාල, ගඩොල්, තහඩු ආදී භාණ්ඩ රැසක් පාසලට ලබා ගත හැකි විය.

පාසල සතු මානව සම්පත උපරිම ලෙස යොදා ගනිමින් මෙම භාණ්ඩ භාවිතයෙන් නව ක්‍රියාකාරකම් කාමරයක් ද පසුගිය වසරේ දී තනාගන්නට අපට හැකි විය

ඔබ ආයතනය ඇතුලු අනෙකුත් ආයතන මඟින් පාසලට සැපයූ භාණ්ඩ, භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ යැයි කිව නොහැකි තරමට ආකර්ශනීය ලෙස අලුත්වැඩියා කිරීමට පාසල් ප්‍රජාවගෙන් විශාල සහයෝගයක් ලැබුණි. මේ නිසා සිසුන්ගේ පහසුව හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වැඩි කිරීම සඳහා බොහෝ භෞතික සම්පත් සකස් කරලීමට පාසලට හැකියාව ලැබී තිබේ.

තවදුරටත් අප පාසල් ගෙවත්ත සතුන්ගෙන් ආරක්ෂා කරගැනීමට වැටක් සකස් කිරීම, ප්‍රාථමික අංශයේ වැසිකිලි සඳහා ජල නල පද්ධතිය සකස් කිරීම, කාර්යාලයේ ඉදිරිපස කොඩි කණු සිටුවීම ආදිය සැලසුම් කර ඇති අතර ම ගුරු විවේකාගාරයකට ආරක්ෂිත කබඩ් එකක් හා මේසයක් ද ලබා ගැනීමට උත්සාහ කරමින් සිටියි.

අපගේ පාසල රටට බරක් නැති පාසලක් ලෙස ස්ව ශක්තියෙන් නැගී සිටීමට දරන වෑයමට ඔබතුමා ඇතුලු ඔබතුමාගේ ආයතනික කාර්ය මණ්ඩලය දැක්වූ සහාය යලි යලිත් සිහි කරමින් ඔබ ආයතනය දිනෙන් දින දියුණුවෙන් දියුණුවට පත් වේවායි පාසල වෙනුවෙන් මා ප්‍රාර්ථනා කරමි.

එමෙන් ම පාසල් මට්ටමින් ඔබ ආයතනය සඳහා ඉදිරි කාලයේ දී ලබා දිය හැකි යම් සහයක් ඇත්නම් එය නොපිරිහෙලා ඉටු කිරීමට අප කැමැත්තෙන් සිටින බව ද මෙයින් දන්වා සිටිමි.

ස්තූතියි.

විදුහල්පති.
මො/හොරොම්බුව විදුහල


# 36. වැඩියෙන් සිතන්න තෑගි දිනන්න

මේ ඡායා රූප දෙස මොහොතක් බලා සිටින්න. එහි ඇති වස්තූන් පිලිබඳ ව ඔබට ඇතිවන සිතුවිල්ල කුමක්ද? එම වස්තූන් කියා පාන යම් සැඟවුණු අර්ථයක් ඇති දැයි ඔබට දැනේද? පෙනෙනවාට වඩා දෙයක් සිතන්න ඔබට පුළුවන්ද? එය ලියා දක්වන්න.







**ඔබට සිතෙන්නේ කුමක්ද.............?**

ග්‍රාමීය හා හුදකලා වූ දුෂ්කර පාසලකින් අපට හමු වූ වෙනස් ම වෙනස් විශිෂ්ට ව්‍යවහාරයක් අපි මෙසේ ඉදිරිපත් කරමු. සිසුන්ගේ මෙන් ම ගුරුවරුන්ගේ ද චින්තනය පුළුල් කිරීම අරමුණු කර ගෙන මෙම ව්‍යවහාරය ක්‍රියාවට නංවා තිබේ.

දෙසතියකට වරක් යම් වස්තුවක් පාසලේ ස්ථානයක ප්‍රදර්ශනය කර තිබේ. එම වස්තුව හොඳින් නිරීක්ෂණය කිරීමෙන් පසු සිසුන්ට හා ගුරුවරුන්ට දැනෙන එහි ඇති යම් සැඟවුණු අරුතක් පිළිබඳ ව ලියා තම නම හා පංතිය ද සඳහන් කර කාර්යාලය ඉදිරිපිට තබා ඇති පෙට්ටියකට දැමීමට විදුහල්පති සිසුන් හා ගුරුවරුන් දැනුවත් කර ඇත. එසේ දමා ඇති නිර්මාණාත්මක ලියවිලි වලින් හොඳ ම අර්ථයක් සපයන නිර්මාණ තෝරා ගෙන කාණ්ඩ තුනක් යටතේ වර්ග කෙරේ. එනම් 1-5 , 6-11 ශ්‍රේණි කාණ්ඩ සහ ගුරු කාණ්ඩය වශයෙනි. එම කාණ්ඩ යටතේ හොඳම නිර්මාණාත්මක අර්ථ දැක්වීම් තුන සඳහා ත්‍යාග පිරිනැමේ. තෝරා ගත් අනෙකුත් නිර්මාණාත්මක අර්ථකථන පුවරුවක ප්‍රදර්ශනය කෙරේ.

ඉතා සරල සහ පහසු ක්‍රියාකාරකමක් වුව ද එමඟින් සිසුන්ට දියුණු කරගත හැකි කුසලතා කිහිපයකි. සාමාන්‍ය ජීවිතය තුළ සිතීමට පෙළඹෙන වපසරියෙන් එහාට තම චින්තනය මෙහෙයවන්නට සිසුන් හුරු කරවීම මෙතුළින් සිදු වේ. එමෙන් ම තම සිතට දැනෙන අදහස කෙටියෙන් ලියා දැක්වීමේ කුසලතාව ද දියුණු කර ගන්නට අවස්ථාව සැලසේ. තව ද යම් වස්තුවක් පිළිබඳ ඉදිරිපත් වී ඇති අදහස් කිහිපයක් අභිසාරී චින්තනයෙන් විමසා එයින් එළැඹිය හැකි අදහස පිළිබඳ අවබෝධ කර ගැනීමට පුහුණුවක් මෙම ක්‍රියාකාරකම ලබා දෙයි.

ගුරුවරුන්ට සිසුන්ගේ චින්තනයේ විවිධත්වය මෙමඟින් අනාවරණය කර ගත හැකි වේ. ඔවුන්ට නිර්මාණශීලි ලෙස සිතන්නට පෙළඹීමක් ඇති වීම ද මෙම ක්‍රියාකාරකම නිසා සිදු වේ.

මෙම ක්‍රියාකාරකම තුළ ප්‍රදර්ශනය කර තිබුණු අදහස් හා යෝජනා දැමිය හැකි හිස් පෙට්ටිය දෙස බලා 9 ශ්‍රේණියේ සිසුවියක විසින් ඉදිරිපත් කරනු ලැබූ අදහසක් මෙසේ දක්වමු.

'මෙම පෙට්ටිය ලෝකය යැයි මට හැඟේ. මෙම පෙට්ටියට වැටෙන වෙනස් අදහස් සහිත කඩදාසිවලින් ලෝකයේ සිටින මිනිසුන්ගේ හැඩරුව, ඇදහිලි, විශ්වාස හා හැඟීම් ආදිය පිළිඹිබු වේ යැයි මට සිතේ.'

බලන්න....... අවුරුදු 14ක දැරිවියකගේ චින්තනය ඉදිරියට ගෙන යන්නට මෙම ව්‍යවහාරය කොතරම් උපයෝගී වී තිබේද?

(මතුගම කලාපයට අයත් බදුරලිය ඉහුරුදළුව කනිෂ්ඨ විද්‍යාලය තුළ සිදුකරන ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 37. මතින් සිසුන් ගලවා ගනිමු

නිවැරදි මාර්ගෝපදේශකත්වයක් ලබා දීම අවශ්‍ය වන්නේ ඉදිරි ජීවිතය වඩා හොඳින් පවත්වාගෙන යාම සඳහා ය. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී තම අනාගතය අඳුරු කරගන්නට ගිය දරුවන්ට ඉක්මන් උපදේශනය අවශ්‍ය වේ. ගිලිහුණු අධ්‍යාපනයට නැවත යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත් ව ඇත. එපමණක් නොව මත් උවදුරින් පාසලේ අනෙකුත් සිසුන් ගලවා ගැනීම ද සිදු විය යුතුය. එවැනි තත්ත්වයක් හමුවේ එම ගැටලුව විසඳීමට පාසල ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළ සැකෙවින් මෙසේ දැක් වේ.

පාසලේ දීප්තිමත් ශිෂ්‍යයෙකුගේ චර්යාවන්හි දක්නට ලැබුණු වෙනස පාසලේ මෙවැනි ව්‍යවහාරයක් ක්‍රියාත්මක කිරීමට පසුබිම් විය.

පන්ති කාමරයෙහි ඉගෙනුම් ක්‍රියාවලියෙහි යෙදෙන දරුවා වෙනදාට වඩා වෙනස් හැසිරීමක් පෙන්වයි නම් ඉගෙනුමට ඔහු දැක්වූ කැපවීම උනන්දුව ක්‍රමයෙන් ගිලිහී යයි නම් එය වඩා දැනෙන්නේ ඔහු ඇසුරු කරන ගුරුභවතුන්ට ය. 12 ශ්‍රේණියේ වාණිජ අංශයේ ඉගෙනුම ලැබූ සඳුන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විශිෂ්ට සම්මාන 9ක් ලබා සමත් වූ ශිෂ්‍යයෙකි. නමුත් උසස් පෙළ පන්තියට ඇතුලත් ව නොබෝ කලකින් ම ඔහුගේ චර්යාවේ විශාල වෙනස්කම් සිදු වූ බව ගුරුවරුන්ට දක්නට ලැබිණි. පාසලේ සිටින පාඩමට සිත නොයෙදූ සමහර උසස් පෙළ ශ්‍රේණිවල සිසුන් සමඟ ඔහුගේ සම්බන්ධය ද වැඩි බව පැහැදිලි ව දක්නට ලැබුණි.

ගැටලුව විසඳීම සඳහා ආරම්භක පියවර තැබූයේ මෙතැනින් ය. සොයා ගත් තොරතුරු මඟින් දැනගන්නට ලැබුනේ සඳුන් මතට ඇබ්බැහි වී ඇති බවකි. පාසල් සිසුන් මතට ගොදුරු කර ගන්නා විවිධ බලවේග පාසල අවට ක්‍රියාත්මක බවට ද තොරතුරු ලැබුණි. පාසලේ ඉගෙනුම ලබන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දරුවන් පිළිබඳ තොරතුරු යාන්ත්‍රණයක් සකසන්නට පාසල් කළමනාකරණයට අවශ්‍ය වූයේ එහෙයිනි. එමඟින් සිසුන් මත් උවදුරින් මුදා ගැනීමට ආරක්ෂක දැලක් එලීම අපේක්ෂාව විය. එහි එක් මූලික පියවරක් ලෙස විදුහල්පතිතුමා විසින් පාසල අවට ප්‍රජාව නියෝජනය කරන ව්‍යාපාරිකයින්, නිවැසියන්, ත්‍රිරෝද රථ රියදුරන් ඇතුළු පිරිස් කණ්ඩායම් වශයෙන් පාසලට ගෙන්වා ගනිමින් පාසලේ සිසුන් මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වීම සොයා බැලීමට උපදෙස් දෙන ලදී.

පාසලේ නිතිපතා කෙරෙන කටයුතුවලට අමතර ව මත්ද්‍රව්‍ය වැටලීම් ඒකකයක් ස්ථාපිත වුණු අතර එහි කටයුතු යාවත්කාලීන ව සිදු විය. මෙම ඒකකය ගුරුවරුන්ගෙන් හා ශිෂ්‍ය නායකයින්ගෙන් සමන්විත විය. දවසේ කුමන හෝ වේලාවක පාසල් කාලයේ දී මෙම සොයා බැලීම සඳහා කාලය වෙන් කළ අතර ප්‍රජාවෙන් ලැබෙන තොරතුරු මත අදාළ වැටලීම් සිදු කරන ලදී. ඒ අනුව සිසුන්ගේ අනන්‍යතාවට හා ගරුත්වයට හානියක් නොවන පරිදි සිසුන් පරීක්ෂා කිරීමට පියවර ගැනිණි.

මෙම අවධානවත් බව නිසා ම පාසලේ සිසුන් විවිධාකාර මත් ද්‍රව්‍යවලට යොමු වීම් පිළිබඳ ව තොරතුරු රාශියක් අනාවරණය කරගන්නට හැකි විය. මතට ලොල් වී සිටි සඳුන්ගේ මානසිකත්වය ඉතා පරිස්සමින් හා අවධානයෙන් යුතුව වෙනස් කළ යුතු බැව් අවබෝධ කොට ගත් පාසල් උපදේශන ගුරුවරුන් ඒ හා බැඳුණු විවිධ හේතු සාධක හඳුනා ගනිමින් අවශ්‍ය ප්‍රතිකාර සළසා දෙන ලදී. සඳුන් මෙන් ම හඳුනාගත් තවත් දරුවන් කිහිප දෙනෙක් ම පාසල් උපදේශන ක්‍රියාවලියට යොමු කෙරිණි. අවශ්‍ය අවස්ථාවල දී පොලීසියේ හා පරිවාස දෙපාර්තමේන්තුවේ සහාය ද ලැබිණි.

පාසල හා පොලීසිය එක්ව ක්‍රියාත්මක කළ මෙම ආරක්ෂක වැඩපිළිවෙළ නිසා ම සිසුන් මෙවැනි විෂමාචාරයන්ට ගොදුරු කර ගැනීමට ඇති අවස්ථා වැළකී යන්නට විය. මෙම ප්‍රතිරෝදය නිසා ම සිසුන් ද මත් ද්‍රව්‍ය ලඟ තබා ගැනීමට හා රැගෙන යාමට බිය වීමත් සමඟ තත්ත්වය වඩාත් යහපත් විය. පාසල මඟින් මත් ද්‍රව්‍යයෙන් සිසුන් වලක්වා ගැනීම පිණිස කෙරෙන දැනුවත් කිරීම් හා සිසු ආකල්ප සංවර්ධන වැඩසටහන් අඛණ්ඩ ව ඉදිරියට පවත්වා ගෙන යන ලදී.

මත්ද්‍රව්‍යයෙන් වැලකී ජීවිතයේ මිහිර විඳ ගැනීම සඳහා සිසුන්ට මඟ පෙන්වන ආකාරයේ පුවරු ප්‍රදර්ශනය, අත් පත්‍රිකා බෙදා හැරීම සිදු විය. සිසු මනස කෙමෙන් අධ්‍යාපනය කරා යොමු කිරීමට හැකි විය. මත් ද්‍රව්‍ය භාවිතයට විරෝධය දක්වමින් පාසල තුළ වඩාත් ගුණාත්මක ආකල්ප ගොඩ නැගෙමින් පැවතුනි. ඒ බැව් පංති කාමරවල සිසුන් විසින් ම පුවරුවල කරන ලද සටහන්වලින් පැහැදිලි ව දැක ගන්නට ලැබුණි.




අද සඳුන් උසස් පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත් වී විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටී. සඳුන් මෙන් ම අනෙකුත් සිසුන් ද මත් ද්‍රව්‍යයෙන් ගැලවී අධ්‍යයන කටයුතුවලට සාර්ථක ව යොමු වී තිබේ.

පාසල විසින් සොයා ගත් තොරතුරු පොලිස් හදිසි වැටලීම් සඳහා පහසුවක් විය. පාසල අවට මත් ද්‍රව්‍ය සිසුන්ට සපයන පිරිස් කොටුකර ගැනීමටත් එවැනි පිරිස්වලට එරෙහි ව නීතිමය කටයුතු කිරීමටත් අවස්ථාව උදා විය.

පාසල විසින් දෙවසරකට පෙර ආරම්භ කළ මෙම වැඩසටහන ක්‍රියාකාරී ව ඉදිරියට යන්නේ මේ ප්‍රදේශයේ පාසල් දරුවන් රැක ගැනීම සඳහා එය අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් වී ඇති බැවිනි.

(පොල්ගහවෙල කු/පරාක්‍රමබාහු ජාතික පාසලේ ක්‍රියාත්මක ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 38. සෑම සිසුවෙකුට ම ලිපි ගොනුවක්


දරුවෝ පාසලට එති. යති. පැමිණි, නොපැමිණි බව දිනපතා නාම ලේඛනවල සඳහන් වේ. සිසුන් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි විය යුතු ය. එසේ ම, සිසුන්ගේ චර්යාව හා ක්‍රියාකාරකම් පිළිබඳ ව ද සඳහන් වී පැවතිය යුතුය. අවශ්‍ය අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා එම තොරතුරු පාසල තුළ සුරක්ෂිත ව තබා ගැනීම පාසලටත්, දරුවන්ටත්, දෙමවුපියන්ටත් බෙහෙවින් ප්‍රයෝජනවත් ය. එමඟින් දරුවාගේ ආරක්ෂාව සහතික වේ. දෙමාපිය සබඳතාව පුළුල් වේ. නිතර තොරතුරු සෙවීමට ගත වන කාලය ඉතිරි වේ. සිසු දරුවන් හා ගුරුභවතුන් අතර ඇති සම්බන්ධතාව තහවුරු වේ.

සෑම සිසුවෙකු සඳහා ම පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යතාව මතු වූයේ ඒ නිසා ය.


මෙහි සඳහන් පාසලෙහි 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් පන්ති පැවැත්විණි. සාමාන්‍යයෙන් පන්තියක සිසුහු 15 – 20 අතර ප්‍රමාණයක් ඉගෙනුම ලබති. එබැවින්, පන්තියේ සිසුන් සම්බන්ධ ව තොරතුරු පන්ති මට්ටමින් පවත්වා ගැනීම පහසු බව අවබෝධ විය. ගොනු පන්ති මට්ටමින් සකස් කිරීමට උපදෙස් ලැබිණි. ඒ අනුව පෞද්ගලික ලිපි ගොනුවක් සෑම සිසුවෙකු වෙනුවෙන් ම සකස් කෙරිණි.
එහි පහත සඳහන් කරුණු අන්තර්ගත විය.

1. සිසුවාගේ සාමාන්‍ය තොරතුරු (ඡායාරූපය, නම, ලිපිනය, මව, පියා, භාරකරු, මවගේ/ පියාගේ/භාරකරුගේ රැකියාව, ආදායම, පාසලට එන ආකාරය, දුරකතන අංක)
2. ශිෂ්‍ය චර්යාව සම්බන්ධ ගුරු සටහන්
3. ශිෂ්‍යයාගේ විෂය සමගාමී කටයුතු හා ජයග්‍රහණ වාර්තා
4. ශිෂ්‍ය සාධනය සම්බන්ධ තොරතුරු (වාර පරීක්ෂණ ලකුණු, විශ්ලේෂණ, වග....)
5. ශිෂ්‍ය සෞඛ්‍ය සටහන් (එන්නත්, රෝග, පරීක්ෂණ සහතික ....)
6. ශිෂ්‍යයාගේ පෝෂණය පිළිබඳ විස්තර

ටික දිනකින් සිසුන්ගේ ගොනු රාශියක් සකස් කෙරුණේ ගුරුවරුන් අතිනි. මේ සඳහා සිසුහු හා දෙමවුපියෝ ද සහය දුන්නෝය.



ගුරුවරුන්ට මෙම ගොනු නඩත්තු කිරීමට සිදු විය. එය අපහසුය. වැඩි කාලයක් ඊට ගත කළ යුතු විය. ගුරුවරුන්ගෙන් විරෝධය මතු විය. විදුහල්පතිතුමා එයට අපූරු විසඳුමක් ඉදිරිපත් කළේ ය. සෑම ගුරුවරයෙක් ම තමාගේ කේවල ව්‍යාපෘතියක් ලෙස සිසු ලිපි ගොනු සැකසීමට උපදෙස් ලැබුණි. එය ගුරු කාර්ය සාධනයේ දී අදාළ කර ගත හැකි විෂය බාහිර ව්‍යාපෘතිය ලෙස සැලකීමට අවස්ථාව ලබා දුනි. ඊට කවුරුත් කැමති වූහ. ලිපි ගොනු හා ලිපි ද්‍රව්‍ය ආදිය පාසලෙන් සැපයිණි. සිසුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සකස් කෙරිණි. ලිපි ගොනු ගබඩා කිරිම සඳහා පන්ති කාමරයේ කබඩ් අලුත්වැඩියා කෙරුණි. තොරතුරු සටහන් තැබීම සඳහා ගුරුවරු සිසුන් ගැන වඩාත් විමසිලිමත් වූහ. ඒ නිසා ගුරුවරු සිසුන්ට වඩාත් සමීප වූහ. ගුරුවරු සිසුන්ගේ දෙමවුපියන් සමඟ ද සබඳතා තර කර ගත්හ.



ශිෂ්‍යයාගේ සුවිශේෂී දක්ෂතා, හැකියා, ගැටලු මෙන් ම ප්‍රජාව සතු හැකියාව හඳුනා ගැනීම, උපදේශන අවශ්‍යතා හඳුනා ගැනීම, පාසලේ සැලසුම් සකස් කිරීමේ දී දත්ත පාදකයක් ලෙස යොදා ගත හැකි වීම මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වේ.

ඒ ඔස්සේ සිසුන්ගේ ලැදියා සහ හැකියා හඳුනා ගනිමින් ඊට අනුකූල වන පරිදි ඔවුන්ට ඉලක්ක ලබා දිමටත්, අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීමටත් හා මේ වන විට ගුරුවරයාට වඩාත් පහසු වී ඇත.

(කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ අ/ඇතාකඩ මහා විද්‍යාලයේ ව්‍යවහාරයක් ඇසුරෙනි.)

# 39. CCTV

*රූපවාහිනී වාර්තාමය වැඩසටහනක් විකාශනය වේ. මෙහි වාර්තාව CCTV කැමරා භාවිතය පිළිබඳව යි. රූප රාමු පෙළ ගලා යන අතරතුර නිවේදනය පසුබිමෙන් ඇසේ.*

පසුබිම් නිවේදනය

CCTV එසේත් නැතිනම් Closed-Circuit Television වර්තමානයේ ජනයා ගැවසෙන සෑම වටපිටාවක ම භාවිත කෙරෙන ආරක්ෂිත මෙවලමකි. බැංකුවේ, කඩ පොළේ, රෝහලේ, මහ මාර්ගයේ පමණක් නොව නිවෙස්වල පවා CCTVකැමරා සවි කර එම ස්ථානවල සිදුවීම්, ජනතාවගේ ක්‍රියාකාරකම් සජීවී ව දැක ගැනීමට හැකිවන පරිදි සකස් කර තිබේ. CCTV කැමරා භාවිතය අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි. විභාග දෙපාර්තමේන්තුව වැනි රහස්‍ය කාර්යයන් ඉටු වන ස්ථාන සමීපයේ විශේෂිත ආරක්ෂිත උපාංගයක් ලෙස යොදා ගැනුණු CCTV කැමරා පද්ධති මේ වන විට පාසල් පරිපාලනය පහසු කර ගැනීම සඳහා භාවිතා වන බැව් පෙනී යයි. එපමණක් ද නොව මේ වන විට පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණයට ලක් කිරීම සඳහා ද CCTV කැමරා යොදා ගැනෙන අවස්ථා අපට අසන්නට ලැබුණි. අපි එවැනි පාසලක් සොයාගෙන පොළොන්නරුව ගිරිතලේ ප්‍රදේශයට පැමිණියෙමු. හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් මෙම පාසල නමින් ජයන්ති ගුරුකුල ප්‍රාථමික විද්‍යාලය යි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය විදුහල්පතිගේ අධීක්ෂණයට ලක් කිරීම සහ ඔවුන් යොදා ගත් උපාය මාර්ගය පිළිබඳ ව අප එම පාසලේ විදුහල්පතිතුමාගෙන් අපි විමසා සිටියෙමු.

විදුහල්පති

ඇත්තෙන් ම පාසල් මට්ටමේ දී මා ගුරුවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ඇගයීමට යොදා ගන්නේ ඉතා සරල ඒ වගේම පහසු ක්‍රමවේදයක්. අපගේ පාසලේ වෙන ම ආදර්ශ පන්ති කාමරයක් තිබෙනවා. එම පන්ති කාමරයේ පිටුපසින් CCTV කැමරාවක් සවි කරල තියෙනවා. එම CCTV කැමරාවේ සටහන්වල දර්ශන සජීවී ව විදුහල්පති කාර්යාලයේ සිට ම LCD පරිගණක තිරයෙන් මට නැරඹිය හැකියි. ඉතින් එම පන්ති කාමරයේ පාඩමක් උගන්වන අවස්ථාවේ දී එම කටයුත්ත කොතරම් දුරට සාර්ථක අන්දමින් සිදුවනවා ද, සිසුන් කොතරම් අවධානයෙන් පාඩම් සහ ක්‍රියාකාරකම්වලට යොමු වනවා ද, ගුරුවරයා කොතරම් දුරට ක්‍රියාකාරී ව කටයුතු කරනවා ද කියන එක සම්පූර්ණයෙන් ම මට බලන්න පුළුවන්. එම ආදර්ශ පන්ති කාමරයේ ඉගැන්වීමට ගුරුවරුන්ට නිශ්චිත කාලසටහනක් ලබා දී තිබෙනවා. ඒ අනුව සෑම දිනක ම එක් ගුරුවරයෙක් එම පන්ති කාමරයේ කරන ඉගැන්වීම මට නිරීක්ෂණය කරන්න පුළුවන්. පාඩම අවසානයේ මා අවස්ථාව ලබා දී තිබෙනවා ගුරුවරයාට නැවත තමන්ගේ පාඩම කළ ආකාරය ඇතුළත් රෙකෝඩ් එක බලන්න. එසේ බලන ගමන් මා ගුරුවරයාත් සමඟ පාඩම සම්බන්ධ ව ප්‍රබලතා, දුබලතා, ගැටලු සාකච්ඡා කරනවා. මේක ඉතා සාර්ථක ක්‍රමයක්. සාමාන්‍යයෙන් පන්තියේ ගුරුවරයා උගන්වන අතරතුර තවත් ඇගයුම්කරුවෙක් පන්තියේ ම පිටුපසට වී පාඩම නිරීක්ෂණයට ලක් කිරීමේ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ඇතිවන කෘත්‍රිම බව මෙම ක්‍රමය නිසා බොහෝ දුරට මඟ හැරී යනවා.

*විදුහල්පතිතුමාගේ පැහැදිලි කිරීම අතරතුර දිගහැරුණු රූප රාමු අතර එම විශේෂිත පන්ති කාමරයේ ගුරුවරුන් ක්‍රියාකාරකම් පාදක ව සිසුන්ට ඉගැන්වීම් කාර්යයේ යෙදී සිටින අකාරයත් CCTV කැමරාවෙන් ලැබෙන දර්ශන සජීවී ව විදුහල්පති ඔහුගේ කාර්යාලයේ සිට පරිගණක තිරයෙන් නරඹන ආකාරයත්, ගුරුවරුන් තම ඉගැන්වීම් පිළිබඳ ව එම දර්ශන නැවත නරඹන ආකාරයත් දිස් වුණි.*

පසුබිම් නිවේදනය

අප කවුරුත් දන්නා CCTV කැමරා භාවිතය අපට අවශ්‍ය වූයේ අප නොදන්, නොසිතන අවස්ථාවක සිදුවන ඕනෑ ම සිදුවීමක් නැවත ඒ ආකාරයෙන් ම දැක ගැනීම සඳහා යි. නමුත් පාසල් අධ්‍යාපනය තුළ එම CCTV කැමරාව වඩාත් සැලසුම් සහගත අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය නිරීක්ෂණයට යොදා ගැනීම අප අගය කරමු. අපිට මේ ආදර්ශය වෙනත් පද්ධතීන් සඳහාත් ඉදිරියේ දී ව්‍යවහාර කරන්නට හැකි වේවි.




(හිඟුරක්ගොඩ කලාපයේ ජයන්ති ගුරුකුල ප්‍රාථමික විද්‍යාලයේ සහ හොරණ කලාපයේ ගුරුගොඩ කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රියාත්මක ව්‍යවහාරයක් ඇසුරෙනි)

# 40. අලුත් පිබිදීමක්

"අපේ පුතා ඊයෙත් ඉස්කෝලේ ගිහින් නෑ."

"ඇයි ගිය සතියෙත් දවස් දෙකක් ගියේ නෑ නේද?"

"ඒක නේන්නම් නංගියේ අපි මේ උදේ පහට වැඩට එන එකෙන් අපේ ළමයි උදේට නැගිටින්නේ නෑ. ඉස්කෝලේ යන්නේ නෑ. හරියකට මූණ කටවත් සෝදන්නේ නෑ. හරි ම ප්‍රශ්නයක් තමයි මට නම්"

"ඒක නම් ඇත්ත තමයි. ඒත් ඉතිං මේ වගේ රස්සාවක්වත් නැතිව අපි කොහොමද ජීවත් වෙන්නේ"

"මම හැමදාම අපේ කොල්ලට කියනවා අපි වගේ පාරවල් අතුගාන්නයි, වැසිකිලි සෝදන්නයි, මිනී වළවල් කපන්නයි හිතන්නෙ නැතිව විභාගයක් පාස් කරලා රස්සාවක් හොයා ගන්න කියලා. ඒත් ඉතිං එතැනට යනකල් ඒගොල්ලන්ව ඉස්කෝලේ යවන එක තමයි ප්‍රශ්නෙ."

උදෑසන බස් නැවතුමේ සිටි කලෙලෙමගල් දෙමළ විදුහලේ නව නියෝජ්‍ය විදුහල්පති සමරසිංහ මහතාගේ කන වැටුණු මෙම සංවාදය නගර සභාවේ රැකියාවට යන මවුවරුන් විසින් කරන ලද කතා බහක කොටසකි. ඔවුහු නගරයේ කසළ ශෝධක රැකියාවෙහි නියුතු අය වෙති

මේ සංවාදය ඔස්සේ තම කල්පනාව මෙහෙය වූ සමරසිංහ මහතාට මේ ප්‍රදේශයේ පවතින සමාජ ආර්ථික පරිසරය අනුව දරුවන්ගේ පාසල් ගමන අඩාල වී ඇති ආකාරය අවබෝධ කරගන්නට අසීරු වූයේ නැත. පන්සියකට අධික සිසු සිසුවියන් අධ්‍යාපනය ලැබූ කලෙලෙමගල් දෙමළ විද්‍යාලය මේ වන විට සිසුන් සියයකට අඩු සංඛ්‍යාවක් සිටින පාසලක් බවට පත් වී ඇත. ඉතා දිළිඳු, සමාජ මට්ටමින් පහළ දරුවන්ගේ පාසලක් ලෙස සැළකෙන මෙම පාසල වෙනුවෙන් විශාල කැපකිරීමක් සිදු කිරීමට තමාට සිදුවන බව සමරසිංහ මහතාට වැටහිනි. සිසුන්ගේ දෙමවුපියන් හිමිදිරියේ ම රැකියාවට යන නිසා පාසලේ වැඩ පාන්දරින් ම ආරම්භ කිරීම මීට ගත හැකි හොඳ ම විසඳුම බව අවබෝධ කර ගත් හෙතෙම මේ පිළිබඳ ව විදුහල්පති සහ ගුරුවරුන් සමඟ සාකච්ඡා කළේ ය.

නදීරා මිය : අනේ අපට නම් බෑ උදේ පහට ඉස්කෝලේ එන්න. උදේට අපේ ගෙවල්වල අපි යුද්ධයක් කරනවා. ඔයගොල්ලන්ට නම් මොක ද?

සමරසිරහ මයා : හොඳයි, හොඳයි මම උදේ පහට එන්නම් හැබැයි 6 වෙනකොට තව දෙතුන් දෙනෙක් එන්න ඕනේ.

විදුහල්පති : අපි දරුවන්ට උදේ කෑම මොනවා හරි දෙමු. මම දෙමව්පියන්ට හරි කාට හරි කතා කරලා වැඩපිළිවෙළක් යොදන්නම්.

සුමනා මිය : ඒක නම් හරි ම හොඳයි. මුල දී එහෙමවත් දරුවන් පාසලට ගෙන්වා ගන්න ඕනේ.

විදුහල්පති : සමරසිංහ මහත්තයට පුළුවන් නේ ගණිතය උගන්වන්න. වැදගත් ම අවශ්‍යය ම විෂයයක් උදෙන් ම උගන්වමු.

සුමනා මිය : මම ඉංග්‍රීසි උගන්වන්නම්. කොහොමටත් දරුවන්ට ගණනුයි, ඉංග්‍රීසියි අත්‍යාවශ්‍ය යි. කියලා අම්මලත් දන්නවානේ.

විදුහල්පති : කොහොම හරි කරලා ඉස්කෝලේ නම් ගොඩනගන්න ඕනේ. දැන් සමරසිංහ මහත්තයා වගේ තරුණ දක්ෂ නියෝජ්‍ය විදුහල්පති කෙනෙක් ඉන්න එකේ කොහොම හරි අපි මේ වැඩේ කරමු.

සමරසිංහ මයා : අපි මුලින් ම මේ දරුවන්ගේ ගෙවල්වලට යමු. ඒකට අපි පාසල් වෙලාවෙන් පසු වෙලාවක් යොදා ගනිමු. ගිහිල්ලා පවුල් ගැන පොඩි සමීක්ෂණයක් කරමු. දරුවන් ගැන, දෙමවුපියන් ගැන, රැකියා අවස්ථා ගැන සොයා බලමු. පාසල් නොයන දරුවන් තවත් ගෙවල්වල ඇති. අපි ඒවා හොයා බලලා දරුවන්ගේ නාම ලේඛනයක් සකස් කරලා පන්තිවල ඉගැන්වීම අලුතෙන් ම පටන් ගනිමු.

විදුහල්පති : අපි කිහිප සැරයක් උත්සාහ කළා ඔය වගේ තොරතුරු අනාවරණය කරගෙන ළමයින්ව ගෙන්වා ගන්න. ඒත් සාර්ථක වුණේ නෑ.

සුමනා මිය : ලොකු ම ප්‍රශ්නය වෙලා තියෙන්නේ දරුවන්ව උදේට අවදි කරලා ලෑස්ති කරලා එවන්න කෙනෙක් නැති එකයි.

සමරසිරහ මයා : ඔව් ඒකට නම් විසඳුමක් ඕනෑ තමයි. අපි උදේ පහට පාසල පටන් ගනිමු. 6 ඉඳලා 11 ශ්‍රේණි වෙනකල්.

සමරසිංහ මහතාගේ මූලිකත්වයෙන් වැඩසටහන ආරම්භ විය. දරුවෝ සියලු දෙනා මවුවරුන් පියවරුන් සමඟ උදෑසන පහට පාසලට පැමිණෙති. මවුවරු දෙදෙනෙක් ඔවුන් සඳහා තේ සූදානම් කරති. තේ බී මුලින්ම සමරසිංහ මහතාගේ ගණිතය පන්තියට සහභාගී වන දරුවන් උදේ හයට ඉංග්‍රීසි ඉගෙන ගනිති. ඉන් පසුව උදෑසන ආහාරය සැකසේ. ඒ පළාතේ දැන උගතුන්ගේ ධන පරිත්‍යාගයෙනි.

අද වනවිට පාසල් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව දෙසිය පනහ දක්වා වර්ධනය වී ඇති අතර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා දරුවෝ කිහිපදෙනෙක් සූදානමින් සිටිති. ඔවුන් විභාගය සමත් වන බව සියලු ගුරුවරුන්ගේ අදහස යි. ප්‍රාර්ථනාව යි.

කලෙලමගල් දෙමළ විදුහල විජයග්‍රහණය කරවීමට පාසල් ප්‍රජාව තුළ පාසල පිළිබඳ නව ආකල්පයක් ඇති වෙමින් පවතින බව විදුහල්පතිතුමා සිහිපත් කරන්නේ සතුටිනි.



(මහනුවර අධ්‍යාපන කලාපයේ කලෙලමගල් දෙමළ විද්‍යාලයේ ව්‍යවහාරයක් ඇසුරෙනි)

## 'පාසල් විශිෂ්ට ව්‍යවහාර සඳහා ප්‍රවේශයක් 2' සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා මෙහෙයවීම**

එස්.එල්.එම්.කේ.සෙනෙවිරත්න මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව

**සම්බන්ධීකරණය හා සංස්කරණය**

ඩී.එච්.එස්.ඩී.සෝමරත්න මයා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව

**ලේඛක මණ්ඩලය**

එස්.එල්.එම්.කේ.සෙනෙවිරත්න මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
ඩී.එම්.ආර්.ඩබ්.එම්. දිවාකර මිය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
ඩී.එච්.එස්.ඩී.සෝමරත්න මයා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
එන්.ඩී.හපුගොඩ මිය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, දෙනුවර
පී.ජී.ජී.ගයා වැයිහේන මයා, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,හෝමාගම
වයි.පී.එන්.පී.විමලසිරි මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය , ශ්‍රී ජයවර්ධනපුර
එස්.වීරසිංහ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය , කැලණිය
පී.ජී.කළුආරච්චි මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය , රත්නපුර
ඩී.පී. ජයකොඩි මයා, .ගුරු සේවය, කො/ආනන්ද විද්‍යාලය , කොළඹ

**කංචුකය නිර්මාණය සහ පිටු සැකසීමේ සහය**

එච්.බී.චිත්‍රාංග පැණිදෙනිය මයා, ගුරු සේවය, බප/කැල/මහමායා බාලිකා විද්‍යාලය, කඩවත

**සිතුවම්**

සී.එල්.දිසානායක මයා, ගුරු සේවය, බප/කැල/ශ්‍රී සංඝමිත්තා මහා විද්‍යාලය, නැලිගම
ආර්.එම්.සී.ජේ.එස්.කුමාර මයා, ගුරු සේවය, බප/කැල/කදුබොඩ මහා විද්‍යාලය, දෙල්ගොඩ
එච්.බී.චිත්‍රාංග පැණිදෙනිය මයා, ගුරු සේවය, බප/කැල/මහමායා බාලිකා විද්‍යාලය, කඩවත

**සහය කාර්ය මණ්ඩලය**

නිරූෂා අනුරාගි මිය, සංවර්ධන සහකාර, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
සුධර්මා තිලකා විජේකෝන් මිය, සංවර්ධන සහකාර, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
ජී.ඒ.කේ.පෙරේරා මයා, සංවර්ධන නිලධාරි, කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
වී.චරිත් බුද්ධික මයා, කාර්ය සහයක, අතිරේක ලේකම් (සැලසුම්) කාර්යාලය